

www.sinhalaelibrary.com

# 1

බටහිර අහසේ හිරු පැහැගත් වලාකුළු ද මැකී අඳුර කැඳවෙන මොහොතේ, විහාර ගේ විශාලය මත වැටුණු සෙවණැල්ලෙයේ මොහොතක් හැඬුම් නවතා, අතපුරු ව කවුළු හඬවා සිත්සියේ රවුම් සිදුරෙන් ඇතුළට එබෙන සියන. කුඩා පුංචි මිනාවුමක් පුළුගේ සාවධානී සාකච්ඡාර හුරුණේ කටක බෝට්ටියේ දුල කොළයක ඊට්ටි. විහාර ගේ පිලිකම් කසිදයක් ඇතිවී ය. කිරි විවුලෝ වාට කවුළු තුළින් එළියට විසුදු හ. අතපුරු ව විහාර ගුහිය දව් රැලක කිපල වූ අතර, මහ මාවත පැත්තෙන් බිල්ලෙලු ගේ කිරුම් හඬක් ද, ඊට විරුද්ධ නැගෙනහිර පැත්තෙන් කුකුළුකිසු ගේ හඩ ඇඹින් ද ඇසුනේ ය.

අරලිය ගසේ හුන් වදුරා විටින්විට පඩි පෙළ දෙසට නොත් දැල්වමින් කොළඹවකිල්ලෙන් පසුවී ය. නැතිර යන අඳුර අතහින් සහ පිටුර දුලු සහා මදක් සතල වී, වෙනත් අත්තකට මාරුවෙමින් අරලිය මල් කිණිත්තක් කඩාගත්තේ ය: කොරළුවෙන්

ලංවත් ම එය බිම අත හැරියේ ය. මල් කිණිත්ත අතට ගත් රාහුල තෙරණුවෝ සිප සිපවා බැලූ හ.

බෝට්ටි සිටියේ අත නොගෑවෙන උස අත්තක ය. එතාවත් හා ගුණටිච්ච මේ වඳුරාට කුමියෙන් පුරුදු පුහුණු කිරීම රාහුල තෙරණුවන් ගේ අභිලාෂය යි. වඳුරා දැනටමත් තමන් ගැන සැලකිලිමත් වන බව හා තමන් අනුකරණය කිරීමට උනන්දු වන බව උන්වහන්සේට පැහැදිලි වී තිබිණි. අවබෝධය හා විශ්වාසය තුළින් බෝට්ටි නම් වූ වඳුරා තමන්ට අවනත කරගත හැකි වේදැ යි තෙරණුවෝ සිතති.

අරලිය මල් කිණිත්ත දෝතින් ගත් තෙරණුවෝ සෙමින් බෝධිය වෙත ගොස් එය මල් අසුන මත තබා දණ ගසා දොහොත් මුදුන් දී වැඳගත් හ. වඳුරා ගසෙන් බිමට බැස බිම දිගේ ගොස්, බෝ පවුරට පැන උරහිස කසකසා තෙරණුවන් දෙස බලාගෙනවන ම සිටියේ ය.

තෙරණුවන් ගේ වන්දනාවට විනාඩි දෙකක් ගතවී ය. බෝට්ටි, තමන් සමීපයේ ම පසුවන බව දැන සිටියත්, බුදු කුටියට නැග වූ තෙරණුවෝ විහාර ගෙට ඇතුල් ව තව දෙවරක් බැලූ හ. වඳුරා බෝ පවුර මත නො සිටියේ ය. මල් කිණිත්ත ද මල් අසුන මත නො වීය.

සියුම් කලකිරීමක් හටගත් නිසා මොහොතක් නිසොල්මන් ව සිටි රාහුල තෙරණුවෝ දොර අද්ද ගිනිකූරක් ගසා පොල් තෙල් පහන දල්වත් ම නිරි වඩිමලෝ උන්වහන්සේ ගේ ඇගේ හැපෙමින් සිටඩි උඩින් කියාගිය ගියහ. විහාර ගේ කොතරම් අලුත් වුවත්, එය මිනිසුන්ගේ වාසස්ථානයක් බවට පත් ව ඇත්තේ, මිනිස් සුවඳින් එය ඈතට පවතින නිසා යයි තෙරණුවෝ සිතති.



සමාධි පිළිම වහන්සේ ඉදිරියේ මල් අසුනේ ඇත්තේ ගත වූ දා සවස තමන් පිදූ අරලිය මල් අට සමනක් බව රාහුල තෙරණුවන්ට දක්නට ලැබිණි. පරමිල් අතට ගෙන ඒවා ඉවත දමීම සඳහා අරලිය ගස මුලට ගිය උන් වහන්සේට පහන ආලෝකය ගෙයි මිදුලේ සිටවූ රත්තී කුඩා ගේ බෝට්ටි රථය ඒ වන විටත් තැටිකා නිරෝධ්‍ය රශ්මි ගෙන් අල්පෙන් දකගත හැකි විය. රත්තී නම් ගැමිකිරිරියකු ද වී සිටියේ ය. සන්ධ්‍යාලේ නායක තෙරුන් වහන්සේ මේ දේශපාලනඥයා සමග දේශපාලනය කරන්නට පටන්ගත් ද සිට හා සන්ධ්‍යාලේ විසින රශ්මි වන්නක් ද සිට බුද්ධරාජාණන් වහන්සේ වැඩ වසන බුදු කුටිය මනුෂ්‍ය ආශ්‍රයෙන් බොහෝ ඈත් වූ බව රාහුල තෙරණුවන් ගේ අදහස යි.

ඇලෙසන සේද දකින දර්ශන සින් පාරන ශූර ය. බුදු රජාණන් වහන්සේ ගේ වත කමල දෙස බලා සිත සැනසුන් කරගැනීමට සිතූ තෙරණුවෝ දෝතට කඩාගත් අරලිය මල් අට සුදු පාමුල තබා බුදු වත බලාගෙන සිහින් හඬින් කොඳුරු හ. "බුදුරජාණන් වහන්ස, මගේ සිත පැහේ. ඔබ වහන්සේට මලක් පුදන්නට මා සමත් ද සිටින්නේ?"

තමා ගේ වචන තමා ගේ ම සිත වෙතත් අප්‍රකිත පාරභූත යයි තෙරණුවන්ට සිතිණි.

"......... ස්වාමීනි, මේ සිතිවිල්ලෙහුත් ඇරෙන්නේ මගේ සිත යි. ස්වාමීනි, මට මා ගැන කලකිරීමක් නැත. මගේ කලකිරීම පොදු සියලු දෙනා ගැන ය. ස්වාමීනි, මිනිසුන්ට අවබෝධය නැත. ශ්‍රද්ධාව නැත. ඔබ වහන්සේ දේශනා කළ ශ්‍රී සද්ධර්මය අනුව හැසිරීමක් තබා ඒ පිළිබඳ සිතිවිල්ලක්වත් නැත. මා පමණක්

WWW.SINHALAELIBRARY.COM 3

ලොව හුදෙකලා වූ අයුරක් දුටෙමි. ස්වාමීනි, සුද්ධු ඔබ වහන්සේට පිටුපා දුවන්නෝ ය.''

සිය පාරාගත් ගිනිකුළුට විහාර ගෙයින් නික්ම අඳුරේ ම සාන්ධ්‍යාර කුළුණට පිටදී සිදුගන්නේ ය. පියමන්සිය උඩ වුතේ පුවදාසි උණුසුමකි. අඳුර මුළු පුදේශය ම වසා ගෙන ය. තරු එළිය වැටෙන වේලාව යි.

වයිමින් මහතා ගේ මෝටර් රථය තවමත් පන්සල මිදුලේ ය. එය ඉවත්වනතෙක් පන්සලට යාමට රාහුල හෙරණුවන් ගේ කැමැත්තක් නැත. තමාට පක්ෂපාතයුවන් ඉන්සත් වශයෙන් ගෙන, සෙස්සුන් සතුරන් වශයෙන් ගන්නා වයිමින් මහතා ගේ අපකීයාම දේශපාලනය රාහුල හෙරණුවන්ට පිළිකුලකි. 'ගම් සේද්වලා බොහෝ කල් මේ අපරාධයට මුලිකයා මේ මනුස්සයා. ඇයි අපේ හාමුදුරුවො මේ මනුස්සයා අනුමෝදන්නේ? වෛරය ආවාස ගෙයි උපුමනෙක්ක ම කිලි වටුවලා විහාර ගෙයි එල්ලෙනවා. මම පොඩි හාමුදුරු නමක් ඇයි මට පෙනෙන දේ මේ ලොකු ඇත්තන්ට නොපෙනෙන්නේ?''

තමන් ගැන නොසොයා අනුන් ගැන සොයමින් තමන් ගේ සිත තමන් විසින් ම පාරාගන්නේ යයි රාහුල හෙරණුවෝ දෙ වනු සිතූ හ. නායක ස්ථවිර සෙලෙල්ලන් පුහුණ නොහැකි පුහුදුන් මනුෂ්‍යයෙකි. දේශපාලනඥයා ද එසේ ය. ඇත්තකුත් බොහෝ මනුෂ්‍යයින් ද එසේ ම ය. ඔවුනට වෛර නොකළ යුතු ය. ඔවුන් ඉවසිය යුතුය. සෙස්සුවන් ඉවසීම මහාගත් ගුණයකැයි රාහුල හෙරණුවෝ වැටහීන් සිතූ හ. අනාගාමික ශ්‍රද්ධාවන්ත, අනාගාමික පුජකවරුන් උඩ සමනෙකින් ඉල් කාලයේ තමන්ට සහළ වූ අරුම් පැතිම්, පසු ව ක්‍රමයෙන් ඇත් වූ සැටින්, සියලු ආගම් දෙස උපේක්ෂාවෙන් බලන්ට පසු ව තමන් පුරුදු වූ සැටින්



උන්වහන්සේට සිහිපත්වී ය. අනායෙන් නිසා තම සිත කිළිටිකරගත යුතු නැත.

අනායෙන් නිසා නොසතුටට පත් වූ සිත සංසුන් කර ගැනීමේ උපායක් වශයෙන් බුද්ධ චරිතය සමරනු කළ හෙරණුවන්ට චුන්ද සූකර ගේ කතා පුවතකිය සිහිපත්වී ය. උරන් මරා මස්පෙරා විකිණීමෙන් ජීවත් වූ චුන්ද සූකර ගේ නිවෙස පිහිටා තිබුණේ බුදුරජාණන් වහන්සේ බොහෝ කලක් වැඩ වාසය කළ ජේතවනාරාමය අසල ය. උරන් ගේ මරණ හඬ නිතියකාම වාගේ ජේතවනාරාමයට ඇසිණි. එහෙත් මේ නිසා බුදුරජාණන් වහන්සේ සිත පසුලකරගත්තේ නැත. බුදු ඇසයෙන් මුදාගැනීමට සුදුසු අවස්ථාවක් නොපැමිණි නිසා උන් වහන්සේ චුන්ද සූකර හමුවන්නට කල්පනා නොකළ සේක. චුන්ද සූකර ගරිණි ව මස්පෙලවනතෙක් දිගින් දිගට ම සත්ත්ව ඝාතනය කළ අතර, බුදුරජාණන් වහන්සේ ජේතවනාරාමයේ වැඩ වාසය කරමින් සෙසු ලෝකයා දුකින් මුදගත් හ.

තමන් ප්‍රිය නොකරන දේශපාලනඥයා ආපසු ගොස් නොකිබුණේ, ඔහු ගේ බේරී වූ හෙයින් ආපසු යාම මැනවැයි රාහුල හෙරණුවෝ කල්පනාකළ හ.

විලාසුව රහිත පෙසේ තලයේ උත්සා ගණන් තරු පායා තිබේ. ආලෝකය විහිදුවාගෙන ඉතා වේගයෙන් කෝණිකාරව අහස පිසාරා පැමිණි උල්කාපාතයක් සිහින් දුමක් දමමින් හිංගල දෙල් ගස දෙසට පහත්වී ය. විමත්කාරයක් අද්භූතයක් දනවන නිසල අහස් තලය දෙස බලාසිටීම, සජීවී ලෝකය ගැන සිතීමට වඩා ප්‍රියජනක බව, රාහුල හෙරණුවන්ට හැඟිණි. තවදුරටත් ඒ ගැන සිතන්ට උන්වහන්සේට අවස්ථාවක් නොවීය, පඩි පෙළ පහළින් කාගේත් හඬක් ඉවහගවීම නිසා ය.

පඩි පෙළ තරණයකොට පැමිණියේ පන්සලේ දායිකාවක වන රංසා සනත්තා හා ඇගේ තරුණ දියණියයි. රාහුල පෙරණුවන් හමුවට පළමු ව පැමිණි ස්ත්‍රිය හඳුනන්නට වූවා ය. තරුණිය පන් බෑගය පිටුපසට කරගෙන වරක් සිනාසී මෙතෙක් දල්වාගෙනතුන් විදුලි පන්දම නිවාදැම්මා ය. විහාර ගේ ඉදිරියේ දල්වාතලද මැටි පහනේ එළිය අරලිය ගස මුදුනට වැටී ඇත්තේ මඳ වශයෙනි.

"උපාසක අම්මා මල් පහන් පූජාකරන්න ආවා වෙන්නැ?"

"නෑ හාමුදුරුවනේ, ලෙඩ්ඩ ඉන්න ගෙදර මනුස්සයාට සෙත් කවියක් කියව ගන්නයි ආවෙ, පන්සලට ඇවිල්ලා පැය බාගයකට වැඩියි. ලොකු හාමුදුරුවෝ වයිමන් මහත්තයාත් එක්ක කතාව. බලාඳලල බලාඳල පස්සෙ බැරිම තැන පන්සල පිටුපස්ස පැත්තෙන් ගොහිං පොඩි හාමුදුරුවන්ට කිව්වා. පොඩි හාමුදුරුවො කතියි කිවට සිය හාමුදුරුවො විහාර ගෙයි ඇත. ඇවිත් කියන්නෙයි කියල. සෙත් කවිය හදනවයි ඇවිත් කියන්නෙ හාමුදුරුවනේ...... පුළුවන්නම්......"

"මම කවදාවත් ම සෙත් කවියක් කියලා නෑ. අනික් කාරණය නායක හාමුදුරුවන්ගෙන් අවසරයක් තියෙන්න ඕනෑ......"

තරුණිය අතේ තිබූ විදුලි පන්දම සිය දකුණු කකුලේ මහපටැඟිල්ලට එල්ලකොට තබා, වරක් දෙවරක් අතගා නැගී සිටියා ය.

"අනේ හාමුදුරුවනේ...... මේ කවිය හත් දෙනෙක් කියෙව්වොත්නම් ලෙඩ්ඩුවගේ අපේ මනුස්සයා ඇඳෙන් නැගිට්ටයි කියලයි කිව්වෙ ජ්‍යොතිශ්‍යලෙ මහත්තයා. මේ සෙත් කවිය ලියෝගන්න දවස්



හතක් ගැටවන්න සිද්දවුණා. මහත්තයාම කළුහළම්භනත් ගෙනැල්ලයි තියෙන්නෙ. දන්න කෙනෙක් ලව්වා කියෝගන්න එක විතරයි තියෙන්නෙ......"

ශ්‍රී ඉරන්නෙකු වූ ඇස්වහට වැලලී ඇත්තේ හදවල වින අම්මාරුවක් බව රාහුල පෙරණුවන්ට දැනගන්නට ලැබිණි. අසල ම ඇති අලුත් විහාර ගේ හැදද්දී, මිනු කවින් කොහොමද සමීප පැමිණි ලොකු හොස් ගසක් කොටිලයේ ම ඉරාදුන් බව පෙරණුවන්ට මතක ය.

"හොඳයි. කෙනෙකුට යහපතක් වන කටයුත්තක් නිසා දන්න හැටියට සෙත් කවිය මම කියවන්නම්. ඒක කරන්න නම් පන්සලට ගිහිල්ලා ලොකු හාමුදුරුවන්ගෙන් අවසරයක් ගන්න ඕනැ."

"හොඳයි හාමුදුරුවනේ මම දවල ගිහිං කියල එන්නම්"

විදුලි පන්දම අතට ගත් රංසාසෙන්නා බිමට එළිය කරමින් සිය දියණිය හොයාකාම ආපසු ගමන්ගන්නා ය. ඇයට සිය දියණියගේ සිහිපත් වූයේ පඩි පෙළ අට දහයක් බැස ගියාට පසුව ය. මිදක් නැවතුනු ම කතාකළා ය.

"දුවේ ධිලවනී, පොඩි හාමුදුරුවන්ට කියල දේවාලෙ දොර ඇරෝගෙන පහන් පත්තු කරල මිම පුද්ද පවිත්‍රකරල තියාපන්. මම දවල එන්නම්."

නැකිගැහුම්ක් තරුණියට ඇසිනුවා සේ පෙනිණි. පෙනෙන තෙක් මානයක මිනිස්සයකු නැත.

විදුලි පන්දමේ එළිය පෙනෙනතෙක් ධිලවනී කතා නොකළා ය: තුන් හැරීන් නොපෙනුනා ය. සිය සැක හැරගත් එකියක

ලෙසින් ඇය කතාකෙරෙල් එළිය සම්පූර්ණයෙන් නොපෙනී ගියාට පසුව ය.

"දේවාලේ දොර ඇර දෙනවද පොඩි හාමුදුරුවනේ........ දේවාලේ ඇතුළට තනියම යන්න නම් බයයි"

. තමා සේ පෙර සිය තමා මහණ කළ අපවත් වී වදාළ ලොකු හාමුදුරුවන් වහන්සේ එද තමාට කළ අනුශාසනය මේ වේලේ රාහුල සෙරණුවන්ට සිහිපත්වි ය. උන්වහන්සේ රාහුලට මෙසේ කියා තිබිණි. 'සර්පයට අල්ලන කොට අා මිනාලියක් ළජ්ජාවයෙන් අනුන් ගැන සැලකිල්ලෙන් ඉන්නවා වගෙ පොඩි හාමුදුරුවෝ ළජ්ජාවයෙන් අද විතරක් නොවෙයි මහණ දම් පුරණකාන් කල් ඉන්න සිතාගන්නවා හොඳයි. තත් අට දෙනෙක් නිතර ම තමන්ගෙ හැසිරීම සැවකුම දිහා සිහිකල්පනාවෙන් ඇසිපිය නොහෙළා බලාගෙන්න වග සිතාගන්න ඕනෑ."

කතරගම දේවාලය විහාර කොට ඇදී පසෙකින් තිබිණි. පොල් තෙල් පහන අකෑලි ව සිටි සිළුවෙනි, දේවාලයට ඇතුල්වීමට බියෙන් මෙන් වෙවුලයි.

"සිත දමල පහන් පත්තු කරන්න. සුද්ද අඩිනුත් මිද"

"මට බයයි හාමුදුරුවනේ......"

"දෙවියන්ට බිය විය යුතු නෑ"

"දෙවියන්ට නොවෙයි බය......"

"එසේ නම්......?"

"හාමුදුරුවොයි මායි දේවාලෙ ඇතුළෙ ඉන්නවා කවුරුවත් දැක්කොත්?"



සෙරණුවන්ට මිදක් කල්පනා කරන්නට සිදුවි ය. තමන් තුළටු සෝණයක් තරුණිය දක ඇත. ඇය බිය වී සිටින්නේ දෙවියන්ට නොව මිනිසුන්ට ය. "සිත සංසුන් කරගෙන අා සාධිය කරන්න. මම එළියට යනවා"

"අනේ එපා හාමුදුරුවනේ...... එළියට යන්න එපා. මට බයයි" කීලඹිණි රාහුල හාමුදුරුවන් ගේ මුහුණ කෙළින් බැලුවා ය. අනුරාගයෙන් බියත් එක්කැත් වූ අවස්ථාවකි, තමන් ගේ සිතත් සසල වූ බව සෙරණුවන්ට හැඟේ.

තරුණියගෙන් ඉවත්වීම මැනවැ යි පළමු ව කල්පනා කළ සෙරණුවෝ, දෙ වනු ව ශ්‍රේෂ්ඨ මහායාන ආචාර්යවරුන් ගේ පත් චරිත අධ්‍යයනයෙන් තමන් උගත් පාඩමක් ක්‍රියාත්මක කරන්ට සුදුසු අවස්ථාවක් එළැඹ ඇතැ යි සිතු හ.

සිත දමනය කරගතයුත්තේ අපත් ආරම්මණයන්ට පිටුපා පැනදිවීමෙන් නොවේ. එවා ඒ වේලාවේ ම සිත තුළට රාග වශයෙන් හෝ ද්වේෂ වශයෙන් හෝ වැද්ද නොගැනීමෙනි. සකල ක්ලේශයන් ප්‍රහීන කළ අම්බ මැණියන් වහන්සේ ගේ චිත සාමිල ළඩ මාගන්දියා තරුණියට තුරා හැඟීම් පහළ වූයේ නම්, නව යෞවනයෙහි පසුවන, තමන් හා මෙසේ හුදෙකලාව සිටින මේ සුන්දර තරුණියටත් තුරා හැඟීම් පහළවීම පුදුමයක් නො වේ.

තරුණිය කෙරෙහි රාහුල සෙරණුවන්ට ඇතිවූයේ අනුකම්පාවකි. අනුකම්පා සිත පෙරදැරි ව උන්වහන්සේ ඇයට මෙ සේ කීහ.

"සිත සංසුන්කරගෙන පහන් දල්වන්න තැනැණිය. ඒ පහන් දල්වමින් ම සිතින් ප්‍රාර්ථනා කරන්න, දෙවියන් ඉදිරියේ

ආලෝකය පැතිරයන්නා සේ තමාගේ රෝගී පියා ගේ ශරීර සෞඛ්‍යයත් වැඩිවර්ධනය වේවා යි කියා. මතක තබා ගන්න. එක විට එක් කාරණයක් ගැන පමණක් සිතන්න. පියාණන් ගැන ම සිතා පියාණන් ගේ රෝගී තත්ත්වය ගැන ම සිතා ඔහුට සහනය පිණිස සහන් දල්වන්න"

සහන් සිරයේ කෙළවර ඇඟිලි දෙකින් මිරිකා ඇඟිලි අග තැවරුනු තෙල් සිසේ ගාගත් සිලවති ගිනිකූරක් ගසා පහන දල්වූවා ය.

තරුණිය ගේ මුහුණ කොරණ්ඩුවන්ට ඉතා පැහැදිලි ව පෙනේ. එහි මද වශිනයක් පමණක් දන් විද්‍යමාන ය.

සිහිවිලි ගමන් කරන බවත්, රාග සිහිවිල්ලක් තවත් රාග සිහිවිල්ලක් හා ගැටුණු කල ලෙහෙසියෙන් දල්වෙන බවත්, ප්‍රබල විරාගික සිහිවිල්ලකින් රාග සිහිවිල්ලක් මැඩලිය හැකි බවත් රාහුල කොරණ්ඩුවෝ දතසිටිය හ. සවර රළ පහරකට ප්‍රව නොසෙල විය හැකි නොසෙදිය හැකි දඩි ගල් පර්යක් ලෙසින් අචල ව අකම්පිත ව සිත පිහිටුවා ගත යුතු ය. ඒ ලෙස සිත පිහිටුවිය හැක්කේ දයා කරුණාව අරමුණු කොට ගැනීමෙනි.

“දන් එළියට ඇවිත් බුදුන් වදින්න”

“බුදු හාමුදුරුවන්ට පූජා කරන්න මල් නම් නොනාවේ නැ.........”

විකාර ගෙට පිට පැත්තෙන් කිසිත් අඩි ශබ්දයක් ඇසිනි. බොරලු පැගෙන හඬකි. ඒ රාත්‍රියට බණ ඔඩුවේ නිදන බැල්ල විය යුතු යයි රාහුල කොරණ්ඩුවෝ සිතූ හ.

රංසො නෝනා සාපසු පැමිණියේ සිලවති අරලිය මල් සිහිපයක්



කඩා බුදුන්ටත් බෝධියටත් පූජා කිරීමෙන් අනතුරුව ය. සිය මව ළංවීමට පෙර සිලවති හදිසියේ මෙන් කතාකළා ය.

“මට බලන්න පොතක් දෙනවද හාමුදුරුවනේ. මොකක් හරි පොතක්. බණ පොතක් වුණත් කමක් නැ. පරෙස්සම් කරල බලල ආපසු දෙන්නම්. විභාගෙ ප්‍රතිඵල එනකල් නිකම්ම වගෙයි ගෙදර ඉන්නෙ”

“මෙට එනකොට වීකක් වේලාසනින් ආවොත් දෙන්න පුළුවන්. නිකම් කාලය නාස්තිකරනවාට වඩා, හොඳ පොතක් බලන එක කොහොමටත් හොඳයි”

රංසොනෝනා පැමිණියේ සිනාසෙමිනි. තමා ලොකු හාමුදුරුවන්ගෙන් අවසරය ලබාගත් බව ඕ කඩ නගා කීවා ය.

* * *

නන්දාරාම, වයසින් ද පැවිද්දෙන් ද උපසම්පදාවෙන් ද රාහුලට දෙ වැනි ය. එ සේ ද වුවත්, උන්වහන්සේ විහාරාධිපති සෝභාරාම ස්ථවිරයන් ගේ සහෝදරයකු ගේ පුතකු වීම නිසා රාහුල කොරණ්ඩුවන්ට වඩා වැඩි බලයක් තිබිණි.

විහාරාධිපතීන් වහන්සේ අවදිව සිටින්නේ රාත්‍රි ප්‍රවෘත්ති ප්‍රචාරය ආරම්භ වන තෙක් පමණි. ප්‍රවෘත්ති සාරාංශය පිට ප්‍රවෘත්ති විස්තරය උන්වහන්සේ දන් නො අසති.

WWW.SINHALAELIBRARY.COM 7

"එහෙනම් එහෙනම් නන්දරාම ඔය පව පෙට්ටිය!"

ලොකු හාමුදුරුවන් ගේ කැමැත්තට නොව, තමා ගේ කැමැත්තට ගුවන් විදුලි යන්ත්‍රය වැඩුවාක් ලෙසින් නන්දරාම කතාකළේ ය. "මට කී ගයනව ලොකු හාමුදුරුවනේ........."

"අන්න හරි නන්දරාම අන්න හරි! මම කවක් ඇත්තක් කියන්නම්. පළගැටියා සුජම් ලාම්පුව දක්කාම උගට ඒක පේන්නේ දිව්‍ය ලෝකය වගේ. දල්ල වටේ ඌ පැසවණක් ප්‍රීතියෙන් රවුම්ගහනවා. රවුම්ගහල එක පාරට දල්ල අස්සෙන් පිංගහනවා. නන්දරාම දන්නවා නොවැ ඊට පස්සේ. උන්දෑ සාන්දල්ල අතරින් ළඟදිම පිංගහනවා කියල හිතාගන්නවා හොඳයි. දෙමෙල්ලුන්ට කස් අදින අපමස්සාතියා! දන්නද පත්තරේ කියල තියෙනවා, ද්‍රවිඩ රජ්ජුරුවෝ දෙමෙල්ලුන්ට කළ වැඩේ හරි නැතිලු. ඔයෙ රුධිර මාංශ තවන්නෙ ඔන්න ඕවා ඇහෙන කොට තමයි!"

සෝමාරාම ස්ථවිරයෝ කෝන්තියෙන් පිපිරෙමින් ඇඳේ පෙරළුනෝ ය. උන්වහන්සේ කොතරම් වේගයෙන් පෙරළුනිද යත් ගසා දුම්මෝ ද යත්: ඒ ශබ්දයට බණ මඩුවේ හුන් නිදල්ල බුරන්නට වූවා ය.

රාහුලට විරුද්ධව ඒ ගතු පෝලිම කියන්ට මේ ඉතා හොඳ වේලාව යයි නන්දරාම සිතුවේ ය.

"අවසර ලොකු හාමුදුරුවනේ....... රාහුල ගැන වචනයක් කියන්න තියෙනවා"

"කවුද අපේ රාහුල ද?"

"එහෙමයි"



"ඔව්. මොකක්ද කිව්ව නම් බලන්න"

"ලෝකයටම බෝධිසත්වයකු පෙනුවක රාහුලගෙ හැටි මම අද දැනගත්තා"

"ඔව්. මොකක් ද?"

"අර උපාසක අම්මයි එයාගෙ දුයි පොත් කවියක් කියෝගන්න ආවනෙ........"

"ඔව්. මම දන්නවා. ඒ ගැනු කෙනාට මමයි කිව්වෙ රාහුලට කියල පොත් කවිය කියෝගන්න කියල. ගෑනු ළමය රාහුලත් එක්ක කණිසරල ආව කියල මම දෙප් කියලත් ඇති........"

"මට සැක හිතුනු නිසා මිරත් ගියා. ගිහිං දේවාලෙ පිටපැත්තෙ අහගෙන උන්නා"

සෝමාරාම ස්ථවිරයන්ට යන්තමින් රැඳී සිටිය නො හැකි විය: ඇඹ බැම උඩට නගාගනිමින ම ඇදෙන් නැඟිට සිවුර උනාදමන්ට මෙන් හැත්කළ හ. "ඔව්, ඉතිං......... මං හිතුවා"

"අනේ ලොකු හාමුදුරුවනේ මං කිව්වොත් කියල අහන්න එපා. මිනේ කියාගන්නාවී ඇති"

"පොඩි හැන කිවිත්තාහෙත, ඒක මගෙ වැඩක්. හංගන්නෙ නැතිව දන්න විදියට කියනවා හොඳයි"

"දෙන්න දේවාලෙ ඇතුළේ.........." නන්දරාම කතා කරන්නේ ලොකු හාමුදුරුවන්ගේ මුහුණ කෙළින් බලා ගෙන නොවේ. හේ වම් කකුලේ මහපොට ඇඟිල්ල බිම කකුලට තදකරගෙන සිටියේ ය. "දේවාලෙ ඇතුළේ සිද්ද වෙන දේ බලන්න ගියා නම් මාව පේනවා. මම සිටියෙ කිත්තියට පිට දැන්නෙ. කතාකරන එවන ඇහුනෙ බොහොම හෙමින්"

WWW.SINHALAELIBRARY.COM 8

"ඇහිච්ච හරිය කියනවා හොඳයි"

"මට බයයි කියල ගැනු ළමය කිව්වා. බයවෙන්න එපා කියල රාහුල කිව්වා. දෙයියන්ට නොමෙයි බය කියල ගැනු ළමය ආයිත් කිව්වා. කාටද එහෙනම් බය කියල එකකොට ඇහුවා. කවුරුවත් දක්කොත් එකටයි බය කියල ගැනු ළමයා කිව්වා. ඊට පස්සෙ හෙමින් හෙමින් කතාකරනවා ඇහුනා. මට තේරුණේ නෑ. ගැනු ළමයට මල් පූජාකරන්න හිතුනෙ ඊට පස්සෙ. රාහුල මල් අතක සාත්තකරගෙන හිටියා. ගැනු ළමයා මල් කැඩුවා"

* * *

නින්දට යාමට පෙර නායක ස්ථවිරයන්ට පසඟ පිහිටුවා වැඳීම රාහුල තෙරුණුවන් ගේ සිරිතයි. මේ පුරුද්ද පැවිදි වීමට බට තැන් සිට උන්වහන්සේ අතින් ගිලිහුනා ම නොවිණි. වැසුනෙනා නම්, ඒ දෙදෙනාගෙන් කෙනෙක් පන්සලේ නැති දවසක ය. මේ උතුම් පැවතුම නිසා වැඩිහිටි භික්ෂූන් ලාබාල නවක භික්ෂූන් කෙරෙහි අසත් හැඟීම් ඇතිකර නොගන්නා බවත්, දරු පෙම්කට සමාන හැඟීමක් පහළකරගන්නා බවත් අපේක්ෂා වදළ ධම්මාරාම නායක ස්ථවිරයන් වහන්සේ රාහුලට අනුශාසනය කර තිබුණේ ය. තමන්ට පමණක් නොව, එද පන්සලේ දෙ වැසියා ව සිටි සෝමාරාම තෙරුණුවන්ට ද නින්දට යාමට පෙර වැඳ නමස්කාරය කරන ලෙස උන්වහන්සේ අවවාද කර තිබිණි. "හොඳයි, හොඳයි බොහොම හොඳයි.



පොඩි උන්නාන්සේ පිළිවෙත් ගුණගරුකව ජීවත්වෙන්න ඕනෑ. හොඳට ඉගෙනගන්න ඕනෑ. හොඳයි. පුළුවන් වේවා" මේ එද ධම්මාරාම ස්ථවිරයන් රාහුල තෙරුණුවන්ට ආශිර්වාද කළ හැටි යි.

මිරලෝක්පුරේ නාවය හමාර වදින විට පුළුටෙන් නැඟිට සිවුරු පොට සකස්කොට ගත් රාහුල තෙරුණුවෝ අඩිවන් කල දෙවින් නායක ස්ථවිරයන්ගේ කාමරයට ඇතුල්වූ හ. අත් දෙක ම හිස යටින් තබාගෙන නායක ස්ථවිරයන් මිර කල්පනාවක යෙදී සිටින හැටි දුටු හෙයින්, පුරුදු චාරිත්‍රය පසුවට කල් තැබීමේ අවශ්‍යතාවක් රාහුල තෙරුණුවන්ට නොපෙනිණි. නායක ස්ථවිරයන්ගේ මේ වැනි පැවතුම් රාහුලට පුරුදු ය.

"අවසර" යනුවෙන් කියා දණ ගසත් ම යහන ගැස්සිණි. මුළු ආවාස ගෙට ම ඇසෙන උස් හඩින් නැගිණි.

"කුමුසෙගෙ වැඳුම් එපා! මගෙ ඇසට නොපෙනී යනවා හොඳ තිහි-!"

රාහුල තෙරුණුවෝ හිස ඔසවාගත්තේ ම සිටිය හ.

"පාපිෂ්ඨයා! වනචරයා! මගෙන් සා පහර නොකා නැගිටපිය!"

රාහුල තෙරුණුවෝ නවාගත් දෙ දණ දිග නො කැර උඩුකය පමණක් ඔසවාගත් හ.

"අවසර ලොකු හාමුදුරුවනේ ........ දැන හෝ නොදැන මගේ ඔබගෙන් යම් වරදක් වුවා නම් සමාවුව මැනැවි. ඔබ වහන්සේට වරදක් වූ බවක් මම දන්නෙ නැ. නොදැන හෝ වරදක් මගෙන් වූයේ නම්, නැවත එවැන්නක් නො කරනු සඳහා කියනු මැනැවි"

WWW.SINHALAELIBRARY.COM 9

කලකට මුලකට පහර ගසා සා විද්වාගත් කාලෙක මෙන් සෝමාරාම ස්ථවිරයෝ මඳක් සසුබාහිය හ. සමහර වජ්‍රා ඇණිවක් මේ සත්පුරුෂයාට කමින් නිසර පවිතව කෙළේ අස්ථානයේ ද යන සැකය උන් වහන්සේට ඊළඟට ඇතිවී ය. නන්දරාම, රාහුලට ද්‍රව්‍ය කරන බව සෝමාරාම ස්ථවිරයන්ට සිහිපත්වී ය.

"නැගිටිනවා නැගිටිනවා. නැගිටලා මං අහන එකට උත්තර දෙනවා......"

රාහුල නැගිට එකත්පස් ව සිටියේ ය. උන් වහන්සේ ගේ සාන්තදාන්ත ස්වභාවය නායක ස්ථවිරයන් ගේ කෝපය කවුද්‍රවත් යටපත් වීමට හේතුවී ය.

නන්දරාම, දොර රෙද්දට මුවා වී සංවාදයට සවන් දෙයි. රාහුලට නැති කැතිගැන්මක් හා බියක් නන්දරාමට ඇති වී තිබේ. බියට හේතුව කමා කළ වරද කමා පසුපස කමා එති යි යන සැකය යි. නැති ගැන්මට හේතුව වරදෙහි ආදීනව ඔහු ගේ ම යටි සිත විසින් ඔහුට පහදාදෙනු ලැබීම යි.

"අර ගෑනු ළමයත් එක්ක දේවාලේ ඇතුළෙ කවුද්‍ර මොනවා ද කෙළේ?"

සමහර සැකකළා හරි යයි රාහුල තෝරුණවාට සිහිගි. ඒ චෝදනාව ඉදිරිපත් කර ඇත්තේ කවුරුන් විසින් ද කියාත් සිතාගත නැති යි. එසේත් කොස්සුවීමට හෝ ප්‍රශ්නවීමට හෝ නැත් නොකළ කොරණුවෝ පුණහාති ස්වභාවයෙන් ම කතා කළහ. "සිද්ධිය මුල සිට ඇති ස්වාමීනි කියන්න අවසර ලොකු හාමුදුරුවනේ......?"

"මිනී නෑ. මට මිනී කරන්න ඒ ගෑනු ළමයත් එක්ක කමා



කරන විදිය පෙනිනවාවත් ඇතිකරගන්නා ද කියන එකයි"

"නෑ. විහාර ගේ ඉදිරියේ දල්වුණු නෑටි පහනක් රැගෙන දේවාලයට ගිහිං දේවාලෙ දොර ඇරියේ මමයි. ගෑනු ළමයා ඇතුළට එන්න බැයවුණා. දෙවියන්ට බිය නොවී ඇතුළට ගොස් පහන දල්වන්න කියා ඉල්ලුවා. දෙවියන්ට බිය නැති බව ගෑනු ළමයා කිව්වා. මම ඇහුවා කාට ද එසේ නම් බිය කියා. ගෑනු ළමයා කිව්වා මමයි ගෑනු ළමයයි දේවාලය ඇතුළෙ ඉන්නවා හාමුදුරු නමින් දුටුවොත් එකටයි බිය වෙන්නෙ කියා. මම ඉවතට යන්නම් කියා කිව්වම මට ඉවතට යන්න එපාය කියල ගෑනු ළමයා කිව්වා. මම දොරටුව ළඟ සිටිය දී ගෑනු ළමයා කිරීය දල සිටුවල පහන පත්තු කළා. දේවාලය ඇතුළෙදි සිද්ධවූයේ එපමණයි. ගෑනු ළමයත් සමඟ දේවාලය ඇතුළෙ හුදෙකලා වූ විට මගේ සිත සසල වූ බව ඇත්තයි. ඒ ළමයටත් සිතේ නැතිගැන්මක් ඇතිවෙන්න ඇති. හැකිමිවලට වාල්ව හැකිබව ස්වල්පගණය දී එනැතින් නැගැටුවන්ට මම උත්සාහ කෙළේ නෑ. මගේ සිත එනැතිදීම දමනය කරගත යුතු යයි මම කල්පනා කළා. මම සිහින් ඒ නැගැත්මට මෛත්‍රිය කළා. ඇගේ සිත ඇගේ රෝගී පියා වෙත නැඹුරුකරන්ට උත්සාහ කළා. සිද්ධිය ද්‍රුවෙන් නො වෙයි, සිද්ධියට යන්නම්න් කන්දුන්නෙකු ගේ සිත නම් සිලුවට නිසෙන බව පෙනෙනවා. යහපත් පුද්ගලයකු වීමෙන් සමාජයේ පිළිගැනීමට අවශ්‍ය නම්, සිත පමණක් හදගැනීම ප්‍රමාණවත් නොවන බව මට දැන් තේරුණයි"

සෝමාරාම ස්ථවිරයෝ බලාගත් අත බලාගත්වනම බොහෝ වේලා නොකළ හ. අනතුරුව කතාකෙළේ සම්පූර්ණයෙන් ම තිවුනාකු පරිද්දෙනි.

"හොඳයි රාහුල හොඳයි. දැන් යන්න හොඳයි. සිත

WWW.SINHALAELIBRARY.COM 10

නාරස්සකරගන්න කාරි නෑ. මගෙන් තරහ වචනයක් කියවුණොත් ඒක ගණන් ගන්නත් එපා. පොඩි උන්නාන්සෙ ගැන මුළු ලෝකෙම බලාගන්න වග පමණක් මතක තියා ගන්නවා හොඳයි"

අවසන් කොළ පසුගැන්ම අවසාන කිරීම සඳහා රාහුල හෙරණුවෝ යළි දෙ දණ, දෙ වැලමිට හා හිස බිම තැබූ හ.

සෝමාරාම ස්ථවිරයෝ රාහුල හෙරණුවන් ගේ හිස මත අත තැබූ හ. "රාහුල සුවපත් වේවා"

* * *

අවිවේකී සිත නිසා හෙරණුවන් ගෙ නමට ම නිදි නැත. නායක හෙරණුවෝ පිටිනිවට කතිහි. ඇඹිත්ත පොකුරුවක් එගෙයත් පන්සලට පැමිණ, දන් මහලු වයසේ ගත කරන සිංහදත්තු දන ශාලාවේ සිට තොරවයි. සෙ නාමිගෙන් වේවාත් ම නොසංසුන් ව පසුවන්නේ නන්දරාම ය. ගේ නමා ගේ නාමිරියේ දොර ළඟ බොහෝ වේලාවක් සිටගෙන සිටියේ ය. පන්සල ඇතුළේ හෝ පිට සැත්සේ හෝ නැකතවුණු කම්දයක් ඇති වූ නැම අවස්ථාවක ම ඔහුට නැතිගැන්මක් ඇතිවී ය. කොට වේවැල අතට ගෙන නායක ස්ථවිරයින් දන් දන් එහි ව් සිතමින් දෙ නැයක් පමණ වේලාවක් දොර ළඟ සිටගෙන සිටි නන්දරාම, ඉතා සෙමින් ඇඳේ හාන්සිවී ය. පිපාසය දණුනු හෙයින් යළි නැගිට දොර ද පිට මේසය මත තියෙන වතුර



වීදුරුව තිබේ ය. දන් කණ්ණාඩිය රැගෙන මුහුණ බලන්නට ඔහුට වුවමනාවී ය. මුහුණ බලමින් කුරුලෑවක් පොඩි කොළේ ය. නමා ගේ මුහුණ නමාට ම දකින්නට ලැබීමෙන් පසු නන්දරාම ගේ හදය සාක්ෂිය ඔහුට කතාකොළේ ය. "නන්දරාම, උඹ මහා දුෂ්ටයෙක්. උඹ පැවිද්දෙක් වුණාට වඩා හොඳයි ජාඩි වෙළෙන්දෙක් වුණා නම්. උඹව ගඳගහනවා මිනිහෝ"

මිරිකූ කුරුලෑවෙන් කොණ්ඩකිල්ලි ඇටයක් තරම් පුදු පාට කොස්සක් අතට ආ විට නන්දරාමට සතුටක් ඇතිවී ය. ඔහු එය අතින් පොඩිකරද්දී ඇඟිලි තුඩු ඉඹ බිඳුවේ ය. කුරුලෑව තිබූ තැනින් ඔහු වූ ලේ බිංදුව පිස දැම්මේ ය.

කණ්ණාඩිය මේසය මත තබා, යළි ඇඳේ හාන්සි වූ නන්දරාම, නමා ගේ නිර්දෝෂීභාවයට තර්ක ඉදිරිපත් කරන්නට වී ය.

"මට මිනැතකමටයැ මං මහණවුණෙ? ලොකු හාමුදුරුවො ගෙදෙට්ට ඇවිගාල ඇවිගාල, පන්සලේ දේපොළ බලාගන්න දෙන්න බෑ, කියල නාත්තට කන්කෙඳිරිගාල මං බෑ කියද්දිම බාව මහණ කෙරෙව්වෙ. මහණ දන්. කොහෙද්ද! දේපොළ බලාගන්න දෙන්න බෑ කියල මහණ කෙරෙව්ව නම් ඒ විදියට වැඩ තියෙන්න ඕනෑ. රාහුලයා තියාගෙන ඉන්නා ලොකු හාමුදුරුවන්ගෙන් සත්සෙ පොසත්සා වෙන්න. වැඩේ අත්පටේ ගියා. බලමුකො. ඕකට පන්සලෙන් පන්නලදලයි මං සත්ස බලන්නෙ. සෝරකයා නම් එතිකට පත්නගන්න ගුරුකම්කරල ඒක කරන්නෙ කවක් දෙකක් තුනක් කරල බෑයි නම් තමයි. ලොකු හාමුදුරුවො ළඟ නැතකමට මට ඇද්දට යාම් එවුන් නම් නෑමයි රාහුලයට. පන්සලට එයාලක් දන්න හුදුන්නාට මට

ජීවත්වෙන්න ඕනි රබර් කට්ටිය ඇති........"

"සෝරතයා හොඳ ළමයා" යයි චන්ද්‍රරාම රැළහාමි සිතුවේ ය. සෝරත හිස්සුව චන්ද්‍රරාම ගේ සිතාවතා ය. සෝරත සමග එකම වියේ විද්‍යාලයේ ඉගෙන ගති. දෙදෙනාම පසුවන්නේ එක වැනි වසියේ ය. දෙ දෙනාම අර්ථ ශාස්ත්‍රය සමඟ සංස්කෘතිය හා සිංහල හදරති. දෙදෙනාට ම පොත්පතියක් ඇත. සෝරත හිස්සුවගේ ගුරු හාමුදුරුවන් මිනු මිහුණ කරගෙන ඇත්තේ පන්සලේ දේ හිමුට පවරන්න සිතාගෙන නුවුවත්, ගුරු හාමුදුරුවන් ගේ ඇවෑමෙන් පන්සල තමන් අතට ගැනීමට හිමු බාධක ගේ ජයගෙන සිටිනුයේ ය. සෝරත කරාමේ පූර්වයන් ද වෙයි.

සිතට කැලඹීමක් වේදනාවක් පහළ වූ විට මෙහේ සිත් පෙරළුම්ව ලෝක ස්වභාවය පිළිබඳ සිත්ත්‍රරහන්නා ලෙස අපවත්වීවද ධම්මාරාම ලොකු හාමුදුරුවන් චන්ද්‍රගේ රාහුලට අනුශාසනාව කර සිටුනත්, සෝමාරාම ස්ථවිරයන්ගෙන් චන්ද්‍රරාමට ඒ වැනි අනුශාසනයක් නොලැබීම නිසා දෝ චන්ද්‍රරාම ඒ වැනි අවස්ථාවල කමටත් ම ගාවේනිසා ප්‍රත්‍යක්ෂ කුමයක් සාවිතා කොළේ ය. ගේ යතුර ලූ ලාච්චුව ඇද ලොකු කවරයක ඇති ලද පොතක් එළියට ගන්නේ ය. එය මිනු සෝරත හිස්සුවගෙන් ලබාගන්නා ලද්දකි. එහි කියමන්වන් ස්ත්‍රී පූර්වයන් ගේ විවිධ සංස්ථා ක්‍රම හා රසි විලාසිතා ය. සිත්පුර වර්ණයන් ය. ඉතා හොඳ කවියෙක් පොත මුද්‍රණය කර තිබේ.

චංචලවූත් විසිලියාර වූත් තම සිත එක අරමුණක නොපිහිටියේ ද යි චන්ද්‍රරාම හිස්සුව තමාගෙන් ම ප්‍රශ්න කොළේ සිතාලුනුණිනි. ලොකු හාමුදුරුවන් ගැන ගේ රාහුල ගැන ගේ සිහිවීම මාතෘකක් පහළකර නොගත් මේ පාඨයන්



හිස්සුට, සාමිතුරයෙකුට ඊයත් වරත් වූව අභිරුචියෙන් නැරඹිය හැකි වණී ශයාරූප එක එක මිහත් ආසායවන් පෙරළ පෙරළා බැලුවේ ය. උණුසුම් සිතත් ගතත් ඇතිව පොත මදහට අකුලාදැමූ ස්ථවිර කෙමී යනතෙකි මුණින් වැතිර තම අපූරු පෙම්වතිය ගැන සිතන්ට පෙළැඹුනේ ය.

'මට අනුවුනේ හරිම පිස්සු මිනිහෙකුයක් තමයි. පුදුමම කියන්නෙ, පුජාකා කොල්ලො එකෙක් වත්තවත් තකා කරන්නෙ නෑ. එහි මට ද ආදරය කරන්නෙ නැත්තම් මගෙ සිවුරට ද කියන එකයි මට හරිමත් වටිනන්න බැරි ප්‍රශ්නෙ. කොල්ලො ඒකාට කියන්නෙ "හාමුගේ ඇත්තී" කියල. වැඩේ ඇත්ත. සිවුරත් එක්ක එයාගෙ පුදුම පම්බින්ඩියක් තියෙනවා. ගාව දන්නතම මල වාගෙ පිළෙනවා. එහෙම උප්පන තිතාවක් නිශිත ගැනු ළමයෙකු ලග මම දකල නෑ. මගෙ සිවුරේ පවු පුරුදයි. අයිය ගඳයි එක්කාසු වෙලා එන පුවිඳ තරම් සුවඳක් ලොකෙකම නැතිලු. පන්සල්වල වැඩියෙනම තියෙන්නෙ අරලිය මල් නිසා අරලිය මල් ලු හොඳම මල්. පූජාසයෙ අතින් අල්ලා ගෙන දෙ පැත්තෙම අරලිය ගස් තියෙන මිහිතනේ නමින්න මගෙ පුදුම ආසාවක් තියෙනවා. මේ ඉලව් සිවුර කියාගෙන එක කරන්නෙ කොයිතම දෑ මගෙ සිය අදහස ගැන එයාට කියාපුවාම "අනේ ගහි කෝත්. හරි කෝත්. යං යං කොහෙනම හරි යං" කියල කිව්වා. "සිවුර දනෙන තමි බෑ. කොහෙදෙ වැටෙන කල් ඉඳල කටිසම්ඳුන් දගෙන යමු" කියල කිව්වම කියනවා. "එහෙම බෑ මගෙනාම යමු සාදු කියනාම යමු" කියල. වරදින්නෙ නෑ. එක එක එකවාමයි. මං කිව්වොත් මැරෙයි. එච්චරට මට ආදරෙයි. පිස්සු මිරගාතයක් කියල කියන්නෙ. මට සිවුරු අරින්න එපාලු. කසාද බඳින්නත් ඕනෑ නැතිලු. එයා කසාද බඳින්නමිලු. මැදල මාත් එක්ක ආත්සයේ දිගටම

කියාගත්තාමිදු. මිනිසුන් මෙවැනි කොළෙල් ඔලක් බලාපොරොත්තු වෙනවා ද මන්ද, කොහොමත් හරි මිනිස්සුන්ගේ නම් යන්න ඕනෑ.'

චන්ද්‍රරාමිට නැවතත් සිනාගියේ ය. ඒ සිනාගියේ රාහුල හිමිදු ගැහැණියක් ගැන කරනු යයි ප්‍රජාපති කී කතාවට ය. 'එයා කියන්නෙ හිමිදු සාමුදුරුවො රාත්‍රී විහාරයේ කළ ගුහාවට වෙලා පැත්තකට නැවිලා ඇලවෙලා එක අතක් හිසට තියාගෙන එයා දිහා බලා ඉන්නවලු. මං ළඟට වෙලා වැඳගෙන මට අභිනිෂ්ක්‍රමණය කරගෙන එලිවෙනකල් ම ඉන්නමිදු. ඉන්න දෙන්නම් මම......... චන්ද්‍රරාමිගෙ හැටි දන්නෙ නෑ එයා. එදට හැකි මං ගැන කලකිරෙයි ද දන්නෙ නෑ.'

චන්ද්‍රරාමි අදහසවිය මිටිකායන්නේ ය. තවත් පැයකින් ප්‍රජාපති සමඟ සිහින් ගතකරන්නට සිදුවන බව ඈ දනී. ප්‍රජාපති ගේ චරිතය ගැඹුරු ඇත්තේ ආයාමිලයන්, ආලයක් එක පමණකට ගෙන, එකට අනාගැනීමෙන් යි පෝරක ගිහිලුව චන්ද්‍රරාමිට කියා සිටියී.

* * *

යහන මත වර්ෂිණියා කොහො බිඳුකත් රාහුල තෙරණුවෝ සියලු සිහිවිලි නවතා විහාර කතත් සමඟ නිසලව සිටියෝ ය. සියලු හැඟීම් හා සිතිවිලි සිතට වැද්ද නොගෙන, බැතැවින් එක චිත්ත ශබ්දවලට ද නොවිදිනේ නො කොට පසුවීම ඉතා අපහසු කාර්යයකි.

රාහුල තෙරණුවන් ගේ සමාධිය කෙළවර වූයේ කිසිවකු



දෙරට තට්ටු කළ නිසාවත්, සිය මත මදුරුවකු වැසූ නිසාවත් නොව, හදිසියේ සිළුවති ගේ රූව මැවී පෙනුණු නිසා ය. සියලු ලාපාඩුන්ට වඩා රඟපායට දඩි යයි තෙරණුවෝ කල්පනා කළහ. සිළුවති සිනෙන් මහා දුම්ටට උත්සාහ කළ විට ලැසින් ඊංගුවක් මෙන් ඕ තවත් හැනාසින් මෙනුනියේ ඒය වශයෙනු යි සිතුනු හෙයින්, තෙරණුවන්ට ලජ්ජාවක් ඇතිවි ය. නො ඇලී සිටිය යුතු ය. නොබැඳී සිටිය යුතු ය. එසේ නොකරන්නා ගසක් තැපනු හැඟීම් ගෙට නැග ඉසේ අතු අග දළු නියසින් සින්නකු වැන්නෑ යි උන්වහන්සේ අසා සිටිති. පංචේන්ද්‍රියන්ට අවනත නොවිය යුතු ය. ඔවුන් පිනවන්නට යාම දුකට හා විපතට හේතුව යි. කිසිවෙකුත් කොරෙයි නොබැඳිය යුත්තේ ය.

මහායාන ආචාර්යවරයකු ගැන ලියවුණු පොතක මේ පිළිබඳ කදිම කතාවක් රාහුල තෙරණුවන් කියවා සිටිති. ඒ කතාව දෙකුත් වරක් කියවා තිබූ හෙයින් මේ අවස්ථාවේ උන්වහන්සේට එය නැවත සිහිපත් කර ගැනීම පහසුවි ය.

මහායාන ආචාර්යවරයෙක් අලුත පැවිදි වූ සිෂ්‍ය භික්ෂුවක ද සමඟ ගමනක් යමින් සිටියේ ය. ඉදිරියට ගඟක් හමුවි ය. ගඟ විශාල නැතත්, ගඟ දිය බහුලව ය. නාගර රූමත් තරුණියක සිටියා ය. අසල්ලක ගොයක් නැත. තරුණියට පුළුවනා කර සිටුවණ් නැගින් එගොඩ ව නම් තිබුණට යාමට ය. එහෙත් ගඟ දිය බහුල වූ හෙයින්, ගඟ ඉද පයින් තරණය කරන්නට ඕ බියපත් ව සිටියා ය. සිය සිෂ්‍ය භික්ෂුව ද සමඟ ගං තෙරට පැමිණ වූ ආචාර්යවරයා තරුණ විමසා බැලීමෙන් පසු තරුණිය කරින් ගෙන ගඟ තරණයකොට ඇය සිම තබා ඉදිරියට ගමන් කරන්නට වූයේ ය. රූමත් තරුණියක් කරින් ගැනීම ගැනත්, ඇය දඩි ලෙස ග්‍රහණය කොටගෙන සිටීම

ගැනත් විස්මයටත් කලකිරීමටත් පත් භික්ෂුව යොදුන් ගණනක් යනතුරුත් ඒ පිළිබඳ ව කල්පනාවේ නිමග්නවම සිටියේ ය. මෙහි දී තමන් පසුපසින් එන ශිෂ්‍ය භික්ෂුව දෙස බැලූ ආචාර්යවරයා කතාකෙළේ ය.

"මම ඒ තරුණිය ගඟ මෙගොඩ කරා ආවෙමි. එහෙත් ඔබ ඇය තවමත් කර තබාගෙන සිටින්නෙහිය?"

ශිෂ්‍ය භික්ෂුවට ලජ්ජාවක් ඇතිවි ය. ඒ සමඟ ම සත්‍යාවබෝධය ද පහළවි ය.

ගතින් අල්වාගැනීමක් වූයේ වී නමුත්, සිතින් අල්ලා ගැනීමක් නූවූයේ නම් එ තැන බන්ධනයක් නැත.

සිල්වතී පිළිබඳව හෝ තාන්ද්‍රාමි තෙරණුවන් සම්බන්ධයෙන් හෝ රාග ද්වේශ හැඟීමක් රාහුල තෙරණුවන්ට යළි පහළ නොවී ය. සිත අතිශයින් සැහැල්ලුව ගිය හෙයින්, සුව නින්දක් ලැබීමට තවත් විනාඩි දෙකකට වැඩි කාලයක් උන්වහන්සේට ගත නොවී ය.



# 2

මීළඟ සතියකට පසු චයිමන් මහතා හිතවතකු ද සමඟ පන්සලට යළි පැමිණියේ ය. පන්සලේ පසුවූයේ රාහුල තෙරණුවන් පමණි. චයිමන් මහතා පිළිගැනීමට සිදුවූයේ උන්වහන්සේට ය.

"මහත්තයලා වාඩිවෙන්න" රාහුල තෙරණුවන් චයිමන් මහතාට මුහුණ දුන්නේ අවුරුදු දෙක තුනකට පසු ව ය.

"ලොකු හාමුදුරුවෝ පිරිතකට වැඩලා"

"එහෙම නම් අද රෑටවත් වඩින එකක් නැද්ද?"

"හෙට උදේට තමයි ආපසු වඩින්නෙ"

කොලුවසිල්ලෙන් මෙන් වටපිට බැලූ චයිමන් මහතා අනතුරුව රාහුල තෙරණුවන් දෙස බලා සිනාසුණේ ය.

චයිමන් මහතා සම්බන්ධයෙන් දැන් තමන් තුළ කලකිරීමක් නැතැයි රාහුල තෙරණුවන්ට හැඟිනි. ඔහු සමඟ කතාකිරීමටත්,

WWW.SINHALAELIBRARY.COM 14

ඔහු සමඟ සිනාසීමටත් උත්වහන්සේ තුළ අකැමැත්තක් නොවී ය.

කමාට සුරුසුරුළු පුටුවේ වාඩි වූ වයිමන් මහතා තමා සමඟ පැමිණි අමුත්තා හඳුන්වාදෙමින් ඔහු නම් පසකයේ ප්‍රාදේශීය ලේකම්වරයාකු බව කීය. වයිමන් මහතාට එක තැන එක විදියට විනාඩියක්වත් ගත කළ නොහැකි ය. ඒ නැගිට්ටේ ය.

"ඔබ වහන්සේ සමඟ මට හුඟ කාලෙකින් කතා කරන්න බැරිවුනා. ඔබ වහන්සේ කැමති නම් මාත් කැමතියි ටික වේලාවක් කතාකරන්න. මම කැමති ඔබ වහන්සේ ගේ කාමරයට ගිහිං කතා කරන්නයි"

වයිමන් මහතාත් ඔහුගේ ප්‍රාදේශීය ලේකම්වරයාත් රාහුල තෙරණුවන්ට පසුපසින් යමින් කළහ. කොහොතුගේ වර්මය ඔහුගේ කුටිය දෙස බැලීමෙන් සිතාගත හැකි බව වයිමන් මහතා දනී. රාහුල තෙරණුවන් ගේ යහපත් පැවැත්ම සම්බන්ධයෙන් බොහෝ දෙනා අතර පවත්නා ප්‍රසාදය කොතරම්දැයට සහයෙක් දුටු දනගත්තාවත් වයිමන් මහතා කැමැත්තෙන් සිටියේ ය. ඔහු ආශ්‍රය කරන බොහෝ භික්ෂූහු සුඛෝපභෝගී ජීවිත ගත කරන්නෝ ය. ඔවුන් ළඟ සීලයක් නැත. විනයක් නැත. ඇතැමුන්ට සටකපටකම් තිබුණු අතර, කවත් සමහරකුට ධනය තිබිණි. වයිමන් මහතා මේ උදවියට හදවතින් ගරු සැලකිල්ලක් නොදක්වන නමුත් දේශපාලන වාසි නිසා ආශ්‍රය කරයි.

රාහුල තෙරුණුවන් ගේ කාමරය අභියෙන් වාම් බව වයිමන් මහතා දුටුවේ ය. ඇඳ පුටු මේස සවි ශක්තියට හැදූ ලුහා පැරණි ඒවා ය. වියකක් ද පනිස කළවර ලී ඇඳට දමා තිබුණේ



පැරණි. කාමරයේ මිටි පුටු නැත. නිතෙන පුටුවක වාඩිවීමට ආරාධනය ලැබුණු නමුත් වයිමන් මහතා එසේවීම ම වාඩිවූයේ නැත. ඔහු ජනේලය ළඟ සිටගෙන ජනේලය අද්දින් පිටත බැලුවේ ය. වයිමන් මහතා කරන්නේ කුමක් ද, ඔහු ගේ දේශපාලන සහායකයා ද එයම අනුගමනය කරයි. ජනේලය පිට පැත්තේ වූ පිච්ච පඳුරට ඇද දෙනාගේ ම අවධානය නදින් යොමුව තිබිණි.

"හුඟ කාලෙකට පස්සෙ පිච්ච පඳුරක් දැක්කා" වයිමන් මහතා සිය සහායකයාට කීයේ ය. "ළමයිනෙත් ඒ කාලේ හැමදාම උදේට අපේ ඇඹ ලිපවත් ද පිච්ච මල? ඒ කාලෙ අපේ ගේ ඉඳුලත් පිච්ච පඳුරක් තිබුණා. අපේ අම්මා පිච්ච මල් වතුරෙන් අපේ ඇඟ නාවනාව මට මතකයි. හවසට පිච්ච මල් මිට මිට අපේ පුංචි අත්වලට දීල බුදු කුටියට එක්කරගෙන ගිහිං අම්මා මල් පූජා කෙරෙව්වා. උදේට පර මල් ඔක්කොම එක්කාසු කරලා වෙලනවා. පිච්ච මල් තම්බපු වතුර අපේ අම්මා අපිට බොන්න දුන්නා"

පිච්ච පඳුර නිසා මියගිය සිය පියා ද, මව ද සිහිපත්ව ගෙනැවින් බොහොලොක් වූ සිතින් පසු වූ වයිමන් මහතා ජනේලය අභියෙන් මෑත් වී පුටුවේ හිඳ ගත්තේ ය. තම පිළිද හා දරුවන් විසින් දන් සිය ගෙමිදුලේ වවා ඇත්තේ පිච්ච නොව, ඇන්තූරියම් පතොක් හා ඕකිඩ් වර්ග බව ඔහුට සිහිපත් ය. සුවඳක් හෝ හරයක් හෝ නොමැති ඒවායින් මිනිසුන් ගේ ආධ්‍යාත්මික නිස්සාරත්වය පිළිබිඹු කෙරේනැයි ඔහුට සිතිනි. සතායට එකී බලන්නට මිනිසෙකුට අවස්ථාවක් ලැබෙන්නේ කලාතුරකිනි.

වයිමන් මහතා එසේවීම ම හිස ඔසවා බැලුවේ ය. ඒ

www.sinhalaelibrary.com

දර්ශනයට හසුවූයේ රාහුලගොඩ බිත්තියේ එල්ලා තිබූ බුද්ධ සිත්තුවම යි. ඒ සිත්තුවම නිසා ද ඔහු ගේ සිතට යළි අදහස් පහළවී ය. තමා ආශ්‍රය කරන කිසිදු භික්ෂුවක ගේ කාමරයක බුදු පිළිමයක් හෝ බුදු සිත්තුවමක් හෝ තිබෙනු ඔහු දැක නැත. ඔවුන් ගේ කාමරවල එල්ලා ඇත්තේ කාල් මාක්ස්ගේ, ලෙනින් ගේ, ඒ නැත්නම් බණ්ඩාරනායක මහතා ගේ සිත්තුවම ය. සෝරත උන්නාන්සේ දැන් බණ්ඩාරනායක, සිරිමා බණ්ඩාරනායක යන දෙදෙනාගේම සිත්තුවම් ඉවත්කොට ජේ. ආර්. ගේ වර්ණවත් ලොකු සිත්තුවමක් එල්ලාගෙනය. රාහුල හාමුදුරුවන්ගේ මේසයට ඉහ බිත්තිය දිගට ඇත්තේ පොත් රාක්කයකි. රාක්කය උඩ කුඩා ලෝක ගෝලයක් හා පැරණි ලාම්පුවක් තිබේ.

වයිමන් මහතා අකුරට ම අනුගමනය කරමින්, ඔහු දෑස් යවන්නේ කවර තැනකට ද ඒ තැනට තම ඇස් ද යොමුකරමින් සිටි අනුගාමිකයා රාහුල හෙරණුවන්ගෙන් ප්‍රශ්නයක් ඇසුවේ ය.

"ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේ මේ පොත්පත් ඔක්කොම කියවලා තිබෙනවා ද?"

"මම දැන් කැමති සිත සනසන නිවන පහදන පොත් පත් කියවීමටයි. කෙලෙස් ඇතිවීම වඩන, වෛර වපුරන පොතුත් මේ පොත් රාක්කයේ තියෙනවා, ඒත් මම ඒවාට වෛර කරන්නේ නෑ. හැම වර්ගයේ ම මිනිසුන් ඉන්නවා වාගේ ම හැම වර්ගයේ ම පොතුත් තියෙනවා. ඒත් මම අගය කරන්නෙ අර මම කියාපු පොත්වලට පමණයි."

හෙරණුවන් වෛර වපුරන කතාවක් කීයේ තමාට සමච්චල් කරන අදහසින්දැ යි වයිමන් මහතාට සැක සිතිණි. බලය



අනුන්ගෙන් උදුරාගැනීමටත්, උදුරාගත් බලය සියතේ රඳවා ගැනීමටත් ක්‍රියා කරන සියලුම දේශපාලනඥයින් සමාජය බෙදනා පොරවන බව ඔහු දනී. තම පාක්ෂිකයින් දිරිගැන්වීම සඳහාත්, ප්‍රතිපාක්ෂිකයින් බියවද්දී තම බලයට ඔවුන් නම්මාගැනීම සඳහාත් හැම මැතිවරණයක දී ම තමා වෛරය පොදියෙන් වපුරූ සැටි ඔහුට මතක ය. "උන් ආවොත් අපි ඉවරයි. අපි ආවොත් උන් ඉවරයි" යන්න වයිමන් මහතා ගේ ප්‍රකට සටන් පාඨය විය.

කාමරයෙන් කෙසෙල් කෑමට එන ලේනා මේ අවස්ථාවේ පැමිණ සිටිනු රාහුල හෙරණුවන්ට දක්නට ලැබිණි. අමුත්තන් සිටින නිසා ලේනා කාමරයට ගොස් පැමිණි ජනෙල් සියන උඩ බලා සිටී.

"එන්න සෝපාක එන්න" හෙරණුවෝ ලේනාට කීහ.

ලේනා, වලගය ඔසවා ජනෙල් සියන උඩ දෙතුන් වරක් ඒ මේ අතට දුවා තමාගේ සැකය පහ වූ බව හැඟවූයේ ය.

හෙරණුවෝ ලේනා දෙසට දකුණත දිගුකළහ. වයිමන් මහතාගේත් ඔහු ගේ සහායකයාගේත් දෑස් අවධානය ලේනා වෙත එල්ල වී තිබිය දී, දෙතුන් වරක් වල්ගය නැමූ ලේනා හෙරණුවන්ගේ අත දිගේ පැමිණ උන්වහන්සේ ගේ උරයට නැග්ගේ ය. කබඩ් ලාච්චුවෙන් ඉදුණු කෙසෙල් ගෙඩියක් ගත් හිමිනම එය බාගෙට ලෙලි ඇර උරහිසේ හුන් ලේනා වෙතින් ගත්හ. සෝපාක අමුත්තන් දෙස බලනු විනා කෙසෙල් ගෙඩියට දත නොගසයි.

"බිය නොවන්න සෝපාක, ඔය ඇත්තට මේ මහත්තුරුන්ගෙන් අනතුරක් නෑ."

WWW.SINHALAELIBRARY.COM 16

"ඔය ඇතිකරන අල්ලෙස් ද ස්වාමීන් වහන්ස?" වයිමන් මහතා ඇසුවේ ය.

"මේ ලේනා වෙනත් ලේනුන් වගේම නිදහසේ හැසිරෙනවා. මා සමඟ බොහොම කුළුපගයි. මගෙන් කෙසෙල් කන්න හැඹිලමින් එනවා. මෙයත් එක්ක ආශ්‍රය කරන පුළු මොහොතට වට ඇතිවෙන්නෙ විශාල සතුටක්. ඒ සතුට මෙයා ගිහිල්ලා පැයක් දෙකක් යනතෙක්ම මගේ සිතේ රැඳී තිබෙනවා"

ඔය දැන හැරගත් ලේනා වටපිට බලමින් ම කෙසෙල් ගෙඩිය ගුක්කි විදියි.

"සමාවෙන්න ස්වාමීන් වහන්ස, පුළු ප්‍රශ්නයක් මතුවුණා" වයිමන් මහතා කීයේ ය. "ඔබ වහන්සේ ගේ මේ සත්ව කරුණාව දුක් විඳින මිනිසුන් වෙනුවෙනුත් සඵල වෙනවාද?"

"කෙසෙල්ගෙඩි කවන්න මම ඒ ඇත්තනට මගේ අත්ලට හොයාගත් බව නම් ඇත්ත"

වයිමන් මහතා උපේක්ෂාවට පත්වූවත් මිසු ඒ බවක් නොදන්වා, හිතේ සඟවා සිටී මානසොරට එලැඹීමට එය අවස්ථාවක් කරගත්තේ ය.

"ඔබ වහන්සේට නිමට අදහස් කළ සාරණිය කෙළින් ම කිව යුතුයි. අද අපේ මිනිස්සු දුක් විඳිනවා. අපේ ආණ්ඩුව කාලෙ මේ පළාත්වල මිනිස්සු අඩු ගානෙ කාගේවත් කැල්ලකවත් කෑවා. අද සහල් රාත්තල රුපියල් හතරයි පහයි නැත්නම් හයයි. අද රුපියල් විස්සයි තිහයි මස් පහයි. පොල් ගෙඩියක් පහයි හයයි. හාල් සේරුව රුපියල් හතයි අටයි. දුප්පත් ගොවි රාලලා කම්කරුවො ලිපිකරුවො දුක් විඳිනවා. කොන්ත්‍රාත්කාරයො ව්‍යාපාරිකාරයො එක දවසට තිස් හතලිස්



දහ හම්බුකරනවා. මේ අසාධාරණය ඇතිවෙලා තියෙන්නේ ධනපති පාලන ක්‍රමය නිසයි. මේ තත්ත්වය වෙනස්කරන්න මේ අසාධාරණය නැතිකරන්න ඇයි ඔබ වහන්සේ අපිට සහාය නොදෙන්නේ? ඇයි ඔබ වහන්සේ නිහඬව පසුවන්නේ?"

වයිමන් මහතාගේ අවසාන වචන කිහිපය කෙතරම් උස් හඬින් පිටවූයේ ද යත්: ගිත්තුව සේ අතේ හුන් ලේනා ජනේලයට පැන්නේ ය.

"මම දේශපාලනයට සම්බන්ධ නොවන්නේ ඇයි ද කියන එක, ලේනා යන් හැසිරීම දිහා මහත්තයා බලා හිටියා නම් තේරුම්ගන්න තිබුණා." රාහුල තෙරුණ්වෝ කීහ. "මේ දැන ලාම්ය සංවරය බිඳුණා. ද්වේශය වෛරය පැතිරුණා. සැහැසිල්ල පිහිටුණා. ලේනා පැන දිව්වා. මම දේශපාලනයට සම්බන්ධවුවොත් ඔය දුක නැතිවෙයිද? දුක් වේදනා කෙළවරවෙයි ද මහත්තයා?"

"නැහැ, එත් ඔබ වහන්සේට යහපත් කටයුත්තකට කොටස්කාරයෙක් වෙන්න පුළුවන්"

රාහුල තෙරුණ්වෝ අභිංසක ව සිනා සහල් කළ හ. "මගේ හැටට අවුරුද්දේ මහණ වෙච්ච අලුත ළොකු හාමුදුරුවොත් එක්ක මහත්තයලාගේ පක්ෂය වෙනුවෙන් ගෙයක් ගෙයක් ගානෙ ගියා. අද මහත්තයලා දිනුවා. මිනිසුන්ගෙ දුක නැතිවුවා ද මහත්තයා?"

වයිමන් මහතා නොසංසුන් මුහුණින් බිම බලා ගත්තාවා රාහුල තෙරුණ්වන්ට දකගත්තාට ලැබිණි. කිසිත් ප්‍රකාශ නොකළ සහායයක් වුවත්, ඒ සහාය වයිමන් මහතාගේ මුහුණ කරන්වීමට හේතු වූ බව වටහාගත් තෙරුණ්වෝ සාණිගාවූවට පත්වූ හ. වයිමන් මහතා පමණක් නොව, වයිමන් මහතා ගේ

දේශපාලන පක්ෂය පමණක් නොව, සියලු දේශපාලනඥයිනුත් ලොව ඇති සියලුම දේශපාලන පක්ෂත් ක්‍රියාකරන්නෙ එකම පෘථග්ජන බලාපොරොත්තුවකින් බව දන්නා රාහුල තෙරණුවෝ වයිමන් මහතා ගේ සිත තිවන අදහස ඇති ව සිහින් හඬින් කතාකළ හ.

"මහත්තයාට මම චෝදනාවක් එල්ල කළාවත් අපහාසයක් කළාවත් නොවෙයි. කොයි පක්ෂය බලයට ආවත්, මිනිසුන්ගෙ දුක නිවාරණය කරන්න අපහසුයි. බෞද්ධ ධර්මයේ හැටියට මොළයට දැනුම්, කුසට අහර, ගතට වස්ත්‍ර සොපමණ ලැබුණත් සිත නිරෝගී නැත්නම් ඒ සිසිවකින් වැඩක් නැ. බුද්ධ ධර්මයේ උගන්වන්නෙ සිත නිරෝගී ව පවත්වාගන්නා ක්‍රමයයි. දේශපාලඥයින් වන කණ්ණිහාන්සේලාට පුලුවන් මොළයට දැනුම දෙන්න, කුසට අහර දෙන්න, ගතට වස්ත්‍ර දෙන්න. අපි පැවිද්දෙ, පැවිද්දෙද ගිහි ගෙයින් ඈත්වෙලයි ඉන්නෙ. කීර්තිමත් වෙන්න – බලවත් වෙන්න – ධනවත් වෙන්න ආසාවක් තිබෙන්න බැ. ආසාවක් තිබුණත් අපේ පරමාර්ථය විය යුත්තෙ එය නොවෙයි. අපි දත් අපේ වගකීම පටලවා ගෙන, මහත්තෝලත් මහත්තෙලගෙ වගකීම් වරදවා තේරුම් ගෙන, ඉස්සෙල්ලාම අපි අපේ සිත නිරෝගීමත් කරගන්නවා. විදෙසට අසල්වැසියා සේ රට වැසියාගෙ සිත නිරෝගීමත් කරනවා. මහත්තෙලගෙ මුලිකත්වයෙන් විසඳිය යුතු ව ඇති ආහාර ප්‍රශ්නය, අධ්‍යාපන ප්‍රශ්නය, ආර්ථික ප්‍රශ්නය ආදී ප්‍රශ්න විසඳන්න ඇයි සංඝයා ධනත්වයේ හවුල්කාර ගන්නෙ? භේදයකින් තොරව මිනිසුන්ගෙ සිත් සංසුන්කිරීමේ කාර්යය අපට කරන්ට ඉඩ දෙනවා නම් ශාසනය රැකෙනවා, ධර්මය සමුද්ධීර්ණවෙනවා. මිනිසුන් භේදවන්නේ නැ. මිනිසුන් සුමගට යොමු වෙනවා, බලයට ධනයට කීර්තියට ඇති ආසාව මම සම්පූර්ණයෙන් ම



ප්‍රතික්ෂේප කරල ඉන්නවා කියල මහත්තයලා හිතන්න එපා. නමුත් පැවිද්දෙක් වශයෙන් බුද්ධ පුත්‍රයෙක් වශයෙන් මගෙන් සමාජයටත් මගෙන් කළත් ඉටුවිය යුතු යුතුකමක් සේවයක් තුමත් ද කියන එක මම තේරුම් ගෙන තිබෙනවා. වෛරයෙන් ද්වේශයෙන් මිදීකරීම නොව, සියලු සත්ත්ව ප්‍රේම සෙවනින් රැකීමට මම උත්සාහ කරනවා. මහත්තයා වගේ ම මහත්තයාගෙ ප්‍රතිවාදියාත් මට එකයි. මට සතුරුකම් කරන්නාටත් මම මෛත්‍රිය කරනවා. මම හැදීම්වලින් ගැටීම්වලින් ඈත් වෙලා නිදහස සතුට ලැබීම විඳිනවා. මේ සුන්දර නිදහස නැති කරගන්න මම කැමති නැ. මම කැමතියි මේ සුන්දර නිදහස උදාවී සතුට මුළු ලෝකයා ම අනුභව විඳිනවා දකින්න."

ජනේලය උඩ සිටි ලේනා තැටිත මේසය උඩට පැමිණියේ ය. මේසය මත වූ පෙම් හැඹිමෙන් සදිත ලද පජාසිය පොලේ ඔහුගේ සොහොට දුවකර බිලූ යනා කඩදාසියක් මත වූ කොහොල් පෙති කැබෙල්ලට ළං වී අමුත්තන් දෙදෙනා දෙස බලමින් එය හපන්නට විය. උගේ ඒ නිදහස නැතිවීමටත්, ජනේලය මතට නැවත පැන දිවීමටත් බැහැරින් ආ ශබ්දයක් හේතුවී ය. වියළි පොල් අත්තක් අඹ අතුවල ද ගැටෙමින් ශබ්ද නගා බිම වැටීම මේ ලේනාගෙන් අවට වූන් ලේනුන් ගේන් තිකියට හේතුවී ය. ජනේලයෙන් අඹ අත්තට පැන්න ලේනා සෙසු ලේනුන් සමග නට කෙළනු ඇසිනි.

ලේනා ගැනවත්, පොල් අත්තේ ශබ්දය ගැනවත් තැකීමක් නො කළ වයිමන් මහතා, පුටුව පස්සට කර සඳුල් දෙක දිගහැර ගත්තේ ය.

"මම වහන්සේ නිවැරදියි" වයිමන් මහතා සෙමින් ම කීවේ ය. "මම වහන්සේට මේ ගමේ පමණක් නොවෙයි මිට පළාත්වල

WWW.SINHALAELIBRARY.COM 18

මිනිස්සුන් ගෞරව කරන බව මම දන්නවා. ඒ ගෞරවය ඒ විදියට ම ආරක්ෂා කරගන්න ඕනා. මම ඔබ වහන්සේට බලකරන්නෙ නෑ. මම බලාපොරොත්තු වුණේ, ඔබ වහන්සේ ගැන මිනිසුන් තුළ තිබෙන භක්තිය ශක්තියක් විදියෙන් අපට යොමුකරවා ගන්න පුළුවන් ද කියන එකයි. ඒක එහෙම වුණොත් මිනිසුන්ට සවන් විදියකින් වටිනා සේවයක් වන බවයි මගේ හැඟීම වුණේ. ඔබ වහන්සේට මම සවන් දුන්නා වගේම ඔබ වහන්සේත් මට සවන්දීලා, මට සවන් දෙන්න ඕනා. මගේ පියා මට විශාල රාජ්‍යයක් උරුම කරල තිබ්බා ස්වාමීන් වහන්ස. මට හොඳ අධ්‍යාපනයක් ලැබුණා. විශාල ධනවල්ලක් ඇතිව වැඩුණා. කිසිම කරදරයක් නැතිව සැපවත් ජීවිතයක් ගතකරන්න මට අවස්ථාව තිබුණා. ඒත් මේ දුක්කරදර පිරුණු දේශපාලනයට මා යොමුවුණා. ඔබ වහන්සේ ගේ පරමාර්ථය සියලු මිනිසුන් සැනසීමයි නම්, මගෙ පරමාර්ථය වන්නෙත් එකම යි. පරමාර්ථ අතින් නම් මාත් ඔබ වහන්සේත් අතර පරතරයක් නෑ. ඇත්ත මම පිළිගන්නවා, අපේ පරමාර්ථ ක්‍රියාත්මක වීමේ දී පක්ෂ වශයෙන් කණ්ඩායම් වශයෙන් කිසන්ට අපි පුරුදු වෙලා තියෙනවා. නමුත් ස්වාමීන් වහන්ස, මම මොකද කරන්නෙ? ලංකාව පමණක් නොව මෙයි, මුළු ලෝකය ම හැඩගැසිලා තියෙන්නේ මේ පක්ෂ දේශපාලන ක්‍රමයටයි. ස්වාමීන් වහන්ස, විශේෂ කුඩා ඇමතිවරයකු වශයෙන් ඉඳගෙනත් මම එක සත පනමක් ජේලයක් නොගත් බව කියන්න ඕනෑ. මගේ කොල්ලන්ගේ දේපලක් මගේ ශන්ද ව්‍යාපාරය වෙනුවෙන් මම නැති කරගත්තා. මට ඕනෑය් අපේ මිනිසුන් නිදහසේ සැනසෙන් ජීවත්වෙනවා දකින්නයි. ඇති මිනිසාට සියලු සැපසම්පත් උදාකරන, නැති මිනිසාට යන එක ම නැති කරන මේ ධනපති පාලන ක්‍රමය ඉදින් මම නිකන්නෙ



නෑ. ඔබ වහන්සේගේ පරමාර්ථයට කවදාවත් ගැලපෙන්න පුළුවන්කමක් තියෙනවා කියල. මගේ මැතිවරණ ඉදිරිම අපි දෙගොල්ලම එක්කාලුවෙලා හොඳ ව්‍යාපාරයක් කරගෙන ගනිමු. කුසගින්නේ සිටින්නවුන්ට බුදුරජාණන් වහන්සේ බණ දේශනා කෙළේ නෑනෙ නේද ස්වාමීන් වහන්ස? දුගී දුප්පතුන්ට හොඳ හරක ගැන අවබෝධයක් ඇතිවෙන්න අඩුගානෙ කුස ගිනි නිවී තිබුණොත් අමිණත් නෙ ද? දුටුගැමුණු කුමාරයාගේ කාලෙ හිටපු සංඝයා වහන්සේලා දෙමළ උවදුරින් රට බේරාගන්න සිවුරු හැරීමකින් සියළු සටන් බිමට ගියා. සිංහලයින් පරවතට පෙළගැස්සුවා. ඒ සටන දිනලා ආයින් සිවුරු පොරවා ගත්තා. මේ ඔබ වහන්සේගෙන් ඉල්ලාසිටින්නේ මේ පුරාණ අවස්ථාව ඉටුකරන්න ආධාර අනුබල දෙන්න කියලයි. ස්වාමීන්වහන්ස, මම ඔබ වහන්සේට යුතුකම් උගන්වන්න ආවා නොවෙයි. ඒක නේද බෞද්ධ භික්ෂූන් වහන්සේ ගේ යුතුකම? ජාතියට අනතුරු කාලවල නිතරම බෞද්ධ භික්ෂූන් වහන්සේලාගේ යුතුකම එකයි. මිනිසුරණ සිංහයාවලා සහ උතුරේ දෙමළුන්ට පෙළඹීම කරන මේ ආණ්ඩුව අපේම සිංහල මිනිසුන්ගෙන් පිළිගන්නවා. කාවද ස්වාමීන් වහන්ස මේ ආණ්ඩුව සේවය කරන්නේ? විජාතිකයින්ට ධනපතියන්ට. මෙක සිංහල බෞද්ධ රටක්. මේ ආණ්ඩුවේ නායකයා කියන්නෙ, මේ රට බහු ජාතික බහු ආගමික රටක් කියල......."

අතිශය නැඟීම්බරව කතා කළ නිසා වයිමන් මහතා ගේ මුහුණ කළු වැනු ගෙන තිබිණි. රාහුල හාමුදුරුවෝ සිවුරු පොට සකසා දත්ත ස්වරයෙන් වයිමන් මහතා ඇමතුවෝ ය. "වෛරය පළිගැනීම නොහැකින් සටන් ලබනා ද කියන එක ගැන නොවෙයි මහත්මයා මම කතා කරන්නෙ. අපි සාකච්ඡා කළයුත්තේ වෛරය පළිගැනීම ද්වේෂය සඳහට ම තුරන්කර

WWW.SINHALAELIBRARY.COM 19

දැමිය හැකි ක්‍රමයක් ගැනයි. මේ ආණ්ඩුව පළිගන්නවා. ඒක වැරදියි. කලින්හිටි ආණ්ඩුව කාලෙත් පළිගැනීම් සිද්ධවුණා. ඒකත් වැරදියි. මතු දවසක මහත්තයලාගේ ආණ්ඩුවක් යළි බලයට පත්වුණොත් නැවතත් පළිගැනීම් සිද්ධවේවි. ඒකත් වැරදියි. වෛරනවා උපදිනවා එසෙ දිගින් දිගට ම මේ වෛරය පවත්වාගෙන යනව ද? අන්න එය නතර කරන්න මහත්තයා මගෙන් සහාය ඉල්ලනවා නම් මම ඉත සිතින් එයට සම්පූර්ණ සහාය දෙනවා. දැන් පවතින ක්‍රමයෙන් මහත්තයා සැපවත් කරන්න පුළුවන්ය කියල මහත්තයා හිතාමතාවත් සිතනව ද?"

"මම මුලින් ම කිව්වානෙ ස්වාමීන් වහන්ස, මේ පක්ෂ ක්‍රමය තමයි මුළු ලෝකයේ ම ක්‍රියාත්මක වන්නෙ. අප අකැමති වුණාට අපට මේ ක්‍රමයෙන් මිදී යන්න බෑ."

"ඇයි බැරි මහත්තයා? මේ ශ්‍රී ලංකා බෞද්ධ රටෙන් අපි ලෝකයාට ම ආදර්ශයක් දෙමුකෝ. වාද භේද වර්ජනය නොකර මේ සිංහල බෞද්ධ පිරිස සමඟියෙන් පළමුව එක්සත් කරමුකෝ"

"ඇයි ස්වාමීන් වහන්ස, ධර්මිෂ්ඨතාම බෞද්ධ ප්‍රතිපත්ති ගැන කතාකරන නායකයාට මේ ගැන නොකියන්නෙ? උන්නැහැටනෙ බලය තියෙන්නෙ. ලියන්නකෝ ස්වාමීන් වහන්ස උන්නැහැට. කියන්නකෝ ස්වාමීන් වහන්ස උන්නැහැට."

"උන්නැහැට ලිව්වා." රාහුල හෙරණුවෝ කීහ.

"ඉතිං ඔබ වහන්සේට පිළිතුරක් ලැබුණා ද?"

"ලිපිය ලැබුණු බව එතුමාගේ ලේකම් මහත්තයෙක් මට ලියා එවා තිබුණා"



වයිමන් මහතා ගේ මුහුණ උපහාස සිනාවෙන් පිරිණි. "ඔබ වහන්සේ ලියන්න ඇත්තෙ සිංහලෙන් වෙන්න ඇති?"

"ඔව් මහත්තයා"

"සිංහලෙන් ලිවීම, සිංහල නමකින් පෙනීසිටීම මේ කාලයේ උපහාසයට කාරණයක්, කුහකත්වයට ඉලක්කවීමක්. සිංහල භාෂාවට සිදුවූ හැටි තමයි අද තියෙන්නෙ. බණ්ඩාරනායක මහත්තයා සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කරල, ඉංග්‍රීසිය කොන්කර දමීමෙන් රට ප්‍රපාතයට දැම්මා ය කියල මේ ආණ්ඩුවේ ලොක්කො දැන් එළිපිට ම කතාකරන්න පටන් අරන්. ඒ මිනිසුන්ට ඉංග්‍රීසි නැත්නම් ඇඳුමින් අඳින්නවත් බෑ. ඒ මිනිසුන්ට සිංහල මිතුරු කරන්නෙ ඡන්ද කාලෙ රැස්වීම්වල දී කතා කරන්නයි, ගෙදර ඇවිත් කුස්සි අම්මට කෝපිට අඬගහන්නයි විතරයි. ජාතිවාදය ඇතිවුණෙත් බණ්ඩාරනායක මහත්තයා සිංහල භාෂාව රාජ්‍ය භාෂාව කරපු නිසාලු. ඇයි ස්වාමීන් වහන්ස මේ මිනිස්සු ජාතික ඇඳුම අඳින්නෙ? වයි කෝට් ටොප් හැට් දාගෙන තමන්ගෙ නියම ස්වරූපය පෙන්නුවා නම් හරිය ද? ඔබ වහන්සේ එංගලන්තයේ ඉගෙනගත් ඉංග්‍රීසි භාෂාවෙන් සුද්දෙකුගෙ නමකින් ලිව්ව නම් සිදු එක නම් පිළිතුරක් ඔබ වහන්සේට ලැබෙනවා............"

වයිමන් මහතා රාහුල හෙරණුවන් ගේ මුහුණ දෙසින් බැලුවේ ය. පුද්ගලයකු ආරක්ෂාකර ගැනීම සඳහා අතීතයෙන් කරුණු ඉදිරිපත් කිරීමට රාහුල හෙරණුවන්ට අවශ්‍ය නැත. සත්තල් වැටේ වාසය කරන යසපාලට වැඩි හිතෛෂීභාවයක් රාජ්‍ය නායකයා කෙරෙහි ද උන් වහන්සේ තුළ නැත. පසුගිය මැණිවරුන්ට දක්වන ගෞරවයට වැඩි ගෞරවයක් හා ආදරයක් තමන් ජනිත කළ තමන් ගේ මැණියන්ට දක්වීම

WWW.SINHALAELIBRARY.COM 20

නොම්මිනිස්කමක් නොවේ. තම ජාතිය හා තම භාෂාවට විශේෂ ආදර ගෞරවයක් දැක්වීම ද එ මිනිස්කමකි. රාහුල සෝර්ණුවන් හැදෑසිය ප්‍රඥ ප්‍රමාණයකින් දෙමිනන් වූයේ තමන් රාජ්‍ය නායකයා ගේ සියලු ක්‍රියා අනුමත කරන්නෙකු යි වයිමන් මහතා තුළ ඇතිවී විශ්වාසය නොතුකොටගෙන ය.

"මහත්මයානෙ අදහස් බෙදාහොඩියකට මම එකඟයි. බුද්ධජාතික වහන්සේට ජාති කුල ආගම් භේද තිබුණේ නෑ. උන්වහන්සේ ශ්‍රී විශ්වයට ම පොදුයි. නමුත් මම උන්වහන්සේ ගේ උණිළුම් පමණක් විද්‍යුණ් ආමික ගිත්තුවකු යි මට සිතෙන්නෙ මෙන්න මේ වගෙ අවස්ථාවලදී. බැයිරුම් සටනකින් ජනතාවගෙන් බලය ඉල්ලාගෙන ඒ බලය සියත් රඳවාගෙන රට පාලනය කරන්නෙක්, ලොව්තුරා බුදුරජාණන් වහන්සේ වගෙ ක්‍රියාකරන්න තැත්කරනවා නම් එය මහා විහිළුවකු යි මට සිතෙනවා. මම මගේ භාෂාවට ආදරෙයි. මම මගේ රටට ජාතියට ආගමට ආදරෙයි. ඉන්දියාව වගා මගේ ශ්‍රී ලංකාවට මම ආදරය දැක්වීම වැරැද්දක් ද? තමන්ගේ ආගමට ජාතියට භාෂාවට ආදරය දැක්වීම හරියට තමන්ගේ මවට පියාට සහෝදර සහෝදරියන්ට විශේෂ ආදරයක් දයාවක් දැක්වීමට සමානයි. කවුරු හරි පුද්ගලයෙක් කියනවා නම් තමන්ගෙ භාෂාවට තමන්ගෙ ජාතියට විශේෂ ඇල්මක් දැක්විය යුතු නැත ය කියලා, එක්කො ඒ පුද්ගලයා ලෝකෝත්තර පුද්ගලයෙක් වෙන්න ඕනෑ. නැත්නම් මිසදිටුවෙක් වෙන්න ඕනෑ. ඒ පුද්ගලයා ලෝකෝත්තර තත්ත්වයට පත්වුණු පුද්ගලයෙක් නම් ඒ පුද්ගලයාට බලයට ඒකිනියට ආශාවක් ඇතිවෙන්න විදියක් නෑ, ඔහු බලයෙන් මිදිලා ඈතැල්ල ශ්‍රමණ ජීවිතයකටයි එළැඹෙන්න ඕනෑ. එහෙම පුද්ගලයෙකුට සදුලක් පාලනය කරන්නවත් කැමැත්තක් නැතිවෙනවා"



රාහුල සෝර්ණුවන් තමන් විසින් දිනාගත්තාද යි ඔද වැඩී ප්‍රීතියක් හැඟිසිටි වයිමන් මහතා දෙනොත් මුදක් දී කතා කොළේ ය. "සත්‍යයට එකඟවීම ගැන සත්‍යය දැකීම ගැන මම ඔබවහන්සේට මෙන්න මගේ ආචාරය! ඔබවහන්සේ ජනතාවට ඔය කාරණය ගැන පමණක් කියන්න. වෙන වචනයක් කියන්න ඕනෑ නෑ"

වයිමන් මහතා රාහුල සෝර්ණුවන්ගෙන් පිළිතුරක් බලාපොරොත්තුවෙයි. යම් පුදුමට හිදාගත් ගේ දෑත් බඳ මත බැඳ ගනිමින් උන්වහන්සේගේ මුහුණ බලාගත්වන ම සිටුවී ය.

"ඔය කාරණය මට කිව හැකියි මහත්මයා........"

"එහෙමයි ස්වාමීන් වහන්ස එහෙමයි"

"ඒ සමග ම මට වෙනත් මහත්තයාට කියන්න ඉඩ දෙන්න. දකුණ දේශපාලනයක්, පක්ෂ දේශපාලනය පිටුපස තියෙන වෛරයක් නැතිකර ගතයුතුයි. කොළ කොඩි නිල් කොඩි රතු කොඩි කපලා දැමිය යුතුයි"

වයිමන් මහතා ගේ බඳ මත වූ දෑත් මිදිනි. ඔහුගේ මුහුණ දුර්වර්ණ වූ බව පෙනිණි. කොඩි හා සටන් පාට්වලින් තොර දේශපාලනයක් නැතැ යි හේ සිතයි. පාක්ෂිකයින් අන්දුවී කළුත්තෝත් එය ගොන්නා නායකයන් ප්‍රතිවාදීන්ට බැණවැදුණු කරමට ය. ඔහුන් සම්බන්ධලයට ලක්කළ පමණට ය. රාහුල සෝර්ණුවන් අදහස් කරන සියලු දේශපාලනයක් ගැන සිතත්තාවක් වයිමන් මහතා මේ අවස්ථාවේ සූදානම් නැත. හේ නැඹිවයේ ය. ඔහු ගේ අනුගාමිකයා ද ඔහු අනුගමනය කොළේ ය.

"හොඳහොම් වෙනත් ........" වයිමන් මහතා කීය. "මේ

කතාබහෙන් මා ගිහියෙක් බව ඔබ තේරුම් ගන්න. ඔබ වහන්සේ සැබෑ බෞද්ධ භික්ෂුවක් බව හැඟී ගියා. අපි කොච්චර කතාකළත් අන්තිමට ඔබ අවබෝධ කොටගත් සත්‍යය ඒකයි. මේ කතාවෙන් ඉස්සරහට සිතන්න දේවල් බොහොම තියෙනවා. මම ඒක අමතක කරන්නෙ නෑ ස්වාමීන් වහන්ස. යම්කිසි දවසක අපට බලයට එන්න පුලුවන් වුණොත් අන්න එදට මේ විශේෂ පැයක් හමාරක් ඔබ වහන්සේත් එක්ක කතාකරන්න මම එනවා. කොළ කොඩි නිල් කොඩි රතු කොඩි නැතිව සුදු කොඩියක් යටතේ රට පාලනය කළයුතු යයි එදට මට හිතෙන්න බැරි නෑ."



# 3

චන්ද්‍රරාම කෙරළුවෙර් පල්ලපු ගමේ පන්සලේ සෝරත හාමුදුරුවන් සමඟ විහාරස්ථානයට පැමිණියෝ ය. ඒ වන විට වයිමන් මහතා විහාරස්ථානයෙන් පිට වී ගොස් ය. ලොකු හාමුදුරුවන් පන්සලේ නැති බව චන්ද්‍රරාම දනී. කාමරයට වැදුණු වහාම දොර අඩවින් තබා උන්වහන්සේ කකුළට රෙදි උරයේ තිබූ කඩදාසි කොළයක ඔතනලද බෝතලයක් ලාච්චුවට දමා වැසුවෝ ය.

"ඔයේ බැරිවයි ආවෙ. හරියට සර්පයෙක් කටේ එල්ලාගෙන ඉන්නවා වගෙයි මට දැණුනෙ. කවුරුහරි දක්කොත් විනාසයි" චන්ද්‍රරාම සිවුර ගලවා අඳනකඩය පිටින් ඇඳ උඩ හිඳ ගත්තේ ය. ඔහුට තරමක හැකැල්ලුවක් ඇති වී තිබේ.

"එළියේ කවුද කතාකරනවා ඇහෙනවා" සෝරත භික්ෂුව කීවේ ය.

සිවුර පටලවාගෙන චන්ද්‍රරාම ආවාසය මැද්දෙන් ගොස්

www.sinhalaelibrary.com

එළියට කරගෙනවා බලා ආපසු ආවේ ය. "ඒ රාහුලගෙ කස්ටර්මයිල් දෙන්නෙක්"

"මට තේරුණේ නෑ"

"මිනිහ අලුත් බිස්නස් එකක් පටන්ගෙන. සෙත් කවි. වැඩේ ඉවර ඇති. ඔය දන් ඇවිත් ඉන්නෙ මිනිහට ගුරු පඬුරු පුදන්න වෙන්න ඕනෑ. ගෑනු කෙනාගෙ අතේ කෝලිකුට්ටු ඇවරියක් තියෙනවා දක්කා"

කෝලිකුට්ටු ඇවරිය දන ශාලාවේ තබා ආපසු යන ගමනේ රංජනා හෝනා කාමරයේ සුන් චන්ද්‍රරාම තේරුණුවින් දක සිනාසුනා ය.

"පොඩි හාමුදුරුවනේ, ලොකු හාමුදුරුවො අද එන එකක් නෑ නේද?"

"මම හිතන්නෙ නෑ එයි කියල. පිරිකසාවෙන වැඩිසෙ"

"එහෙමයි. ලොකු හාමුදුරුවොත් උන්න නම් තමයි හොඳ. අපේ රාහුල හාමුදුරුවන්ට පිංසිද්දවෙන්න අපේ ගෙදර මනුස්සයා නැතිවිටා. අද ආවෙ ඒකත් එක්කගෙනනමයි. අර ඉස්සරහ මිදුලෙ ඉන්නවා"

"මොකක්ද සිඳුණු අමාරුව?"

"ආනවිසය අමාරුවක්. ඇඳෙන් නැගිටින්න බැරිවයි උන්නෙ. කොච්චරනම් බේත් කළාද....... කොච්චර නම් දුක් වින්දද....... දන් හොඳයි"

චන්ද්‍රරාමට ඉවිසියාවක් ඇතිවී ය. ගෑහැනිය තව දුරටත් රාහුල විණිනා කරනෑ යි සිතුනු හෙයින් වැඩිදුර කතාවට නොගියේ ය.



"හොඳයි එහෙනම් කියගමින් ම දේවාලෙටත් ගිහිං ඇවිතනම්......."

රංජනා හෝනා නොපෙනී ගිය පසු චන්ද්‍රරාම සෝරත ගේ මුහුණ බැලුවේ ය. "මිනිහට බිස්නස් එක අල්ලල කනව වගෙයි. දන්නවාද මිනිහ ඔය වැඩේට කොහොමෙන් ඇයි කියල? ඔය ගෑනු කෙනාට ඉන්නවා ව්ලවිනි කියල ලස්සණ ගෑනු ළමයෙක්. ඔය ගෑනුකෙනා සෙත් කවිය හදෝගෙන එක කියවාගන්න ආවේ ඒ ගෑනු ළමයත් එක්ක. ලොකු හාමුදුරුවන්ට එද වෙන වැඩක් තිබුණා. ඉතිං අපේ මෑත් කොන්ත්‍රාත්තුවපෙව්වනත් පුතියත් තාරණෙව වැඩේ සිතට කළා!"

"මොඩියා" සෝරත කීය.

"කවුද – මම ද?"

"හාමුදුරුවනේ නේන්නම්. තමන් ම කළා නම් පසුතැවිලි වෙන්න සිද්ද වෙන්නෙ නෑනෙ"

"අල්ලෑම. අල්ලෑමු. ගමේ මිට කියාගැනීම කියානකයි"

"හාමුයො අහල නැද්ද අපේ ඉන්න කිරිල්ලි පඳුරේ ඉන්න කිරිල්ලියො රොත්තට වඩා අගේ බව?"

"ඒක මගේ ප්‍රතිපත්තියක්"

"හාමුයොට ඉතිරිවෙන්නෙ ප්‍රතිපත්තිය විතරයි"

"ඇලුමෙනො"

* * *

WWW.SINHALAELIBRARY.COM 23

ළිඳට ගොස් නාගෙන එන තරුණ පැවිද්දන් දෙදෙනා වෙතින් සබන් සුවඳ වහනය විය. සෝරත වටපිට බලමින් පැමිණ මහා මාර්ගයේ යන මෝටර් සයිකලයක ශබ්දය අසා හැරී බැලුවේ ය. නිවන් දකින්නට සෝරත හිමියන්ට කිසිම ආසාවක් නැත. ඔහුගේ ප්‍රධාන ආසාවක් ව ඇත්තේ මෝටර් සයිකලයක් පැදීම ය.

"එයි අර බලපන්කො"

තරුණිය තරුණයා ගේ ඇඟට තුරුලුව ඔහු බදාගෙන යයි. බැඳපු ජෝඩුවක් විය නොහැකි ය. පෙම්වතුන් දෙදෙනකු විය හැකි ය. කෙමින් යන ගමනකුත් නොවේ. වේගයෙන් යන ගමනකි.

"එක දවසක් මහෙනම යන්න ඇත්නම් මළත් කමක් නෑ. පුර සැප මිස්සෙනම් උනට! අපිට කෑංවි! අපිට ඒ දිහා කෙලින් බලන්නවත් තහනම්"

"ලෙඩේ කොහොම උස්සන්නයි වගෙ......" සන්දරාම සිනාසුණේ ය. "මිය ලෙඩේ මටත් තිබුණ කොහොම නැරට. දැන් ඒක එච්චර උස්සන්න නෑ. ගෑනු ළමයෙකුගෙ කවුරුන් වැල් පොටක වගේ තියෙනව දක්කත් මට කිසි නැවතිත කාලයක් තිබුණ. රාහුල හාමුයි මට කිව්වෙ ඇති. දැක්කම හිතින් අල්ලාගන්න එපාය කියල......"

"රාහුල විහාරස්ථාන රාහුලගෙ අප්පච්චිත් කියල තියෙන්නෙ. කවුරු කිව්වත් කොහොම ද නොකියා ඉන්නෙ? නාකින්ට හම් යාණක් තැවිව ඇති"

රංජෝ හෝන්නා හා ඇගේ සැමියා රාහුල තෙරණුවන් සමඟ සන්ද නාගිමින් විහාර ගේ දෙසට යනු සන්දරාම දුටුවේ ය.



සවස් මෝටර් සයිකලයක හඬක් ඇසුණු තෙයින් සෝරත හැරීක ද පසුපස හැරී බැලුවේ ය. එය කරණ මෝටර් සයිකලයකි. එය පැදවූයේ වයසක මහතෙකි. සෝරත ඒ දර්ශනය බලා වඩියෙන් කකාසෙහෙළේ නැත.

* * *

බෝධි, බෝධියේ මල් අසුන මත සැග සිටිනු රාහුල තෙරණුවන්ට දක්නට ලැබිණි. චන්ද්‍රා තෙරණුවන් දුටු විගාම බිමට නැත බෝධිය වටා ගොස් කාප්පය මතට පැන්නේ ය. චන්ද්‍රාට කඩිදවක් පස් වාරිනු පුරුදු කළ නො හැකි වෙතැ යි රාහුල තෙරණුවනට සිතිණි. එහෙත් උත්සාහය අත් නො හැරීමට සිතූ උන්වහන්සේ තරුණයබර පිහින් ගුතුව චන්ද්‍රාට යම්පටු හ. චන්ද්‍රරෝ බෝ ගසේ අතු පතර ළඟ සිටියි. එක වැදරක් බිමට පැන්නේ ය. රාහුල තෙරණුවන් දෙස බලා පුන් බෝධි, උන්වහන්සේට නියවා බිමට පැන බිම දිගේ ගොස් දෙල් ගසට නැග ගත්තේ ය. බෝ ගසේ බිමට පාත් වූ අත්ත දිගේ සියලු ම වැදරෝ බැස ගිය හ.

දෙන්තට මලක් ගෙන, බෝධි බෝධියට මලක් පුදන දිනය වැඩි ඈතක නොවේ යයි සිතා සිටියත් එය කවදාවත් නොකෙරෙන කාර්යයක් බව රාහුල තෙරණුවන්ට දැන් සිතේ. "මාත් මිනිහෙක් නිසා එකපාරට විශ්වාසෙට ගන්න එයා ලැජ්ජි නෑ"

දේවාලයට බාරහාර ඔප්පුකොට රංජෝ හෝන්නාත් ඇගේ සැමියාත් නිස්මිගොස් පුරු මොහොතකට පසු යසපාල දරු

WWW.SINHALAELIBRARY.COM 24

දෙදෙනා ද සමග විහාර භූමියට පැමිණියේ ය.

යසපාල බාල දරුවා බිම තබා හතිඇරියේ ය. ඔහු මේසන් බාස් කෙනෙකි. වයස තිස් පහකට වඩා නැත. ඔහු ඉරටුවක් මෙන් කෙට්ටු වූ එ බිරින්දගේ ක්ෂය රෝගය නිසා බව රාහුල තෙරණුවෝ දනිති. ක්ෂය රෝගයට ප්‍රතිකාර ගනිමින් සිටි කාලයේ, ඔහු ගේ බිරිඳ දරු දෙදෙනා ගෙදර දමා අන් වැඩකාරයා සමග පැන ගියා ය. යසපාල ප්‍රතිකාර ගැනීම නතරකොට දරු දෙදෙනා දඩිකර ගැනීමට දත දුක විඳී.

දැතින් ම මල් තොට්ට ඔසවා ගෙන පුන් කුඩා දරුවා සසටට වැටී තිබුණු ඵලිය ඔසවන්නට අසක් පසක් කරද්දී, ඉද්ද මල් කිහිපයක් බිම වැටිණි. වැටුණු මල් ඇහිඳිනු පිණිස දරුවා සැමණින් පහත්වනු දුටු යසපාල ඔහු ඉන් වළක්වා කොමේ ම ඒ මල් දෙක ඇත අකට ගෙන ගුවන ගෙන ගොස් දම්මේ ය.

"පුතා දන්නවද, බිම වැටුණු මල් බුදුහාමුදුරුවන්ට පූජාකරන්න හොද නෑ"

යසපාල දරු දෙදෙනාට මැදි ව සිටගෙන රාහුල තෙරණුවන් සමග කතාකෙළේ ය.

"පුතාල දෙන්නම කිව්ව හාමුදුරුවනේ පන්සල් යමුයි කියල. මාත් ඒ ගමන යායි කිව්වා. කපටින් වැටී ගෙන ආවට කාළකෝස්මක තිබුණෙ රෑට නිසාවෙන් කඳ එළිය වැටෙන්නෙ නැතෑයි තේද හාමුදුරුවනේ....."

"බොහොම හොඳයි. විහාර යේ ඇරල ඇති. පුතාල දෙන්නාත් එක්ක මල් පූජා කරන්නකො"

සමාධි පිළිම වහන්සේ අභියස නෙළුම ද බිම තොවා වැඳ



ගැට යසපාල වැරෙන්ට ගොස් කඳ තොළින්කරගෙන කැව්ක දැන් එක්කර ගනිත් ම ඔහුට කැස්ස මතුවී ය. ඔහු වැටී සිටි දරු දෙදෙනා ද පියාණන් දෙස බලා දණින් සිට නන්නට උත්සාහ කළ හ. යසපාල ගේ කැසි හඬ විහාර යේ අඳකාර හඬ නංවා සිටි වූ නොයින් රාහුල තෙරණුවෝ ඔවුන් අනුපසට අවුත් කර පොවා බැලූ හ.

යසපාල වෙවුලයි. ඔහු එක්කරගෙන සිටි දෑත එ ගේ කිසියදී ම හිස පැත්තකට කර එම දෑස එම උරයේ අතුල්ලා ගත්තේ ය. යසපාල වේදනාවෙන් පසුවන බවින්, ඒ නිසා ඔහු ගේ දෑසට කඳුළු උනා ඇති බවක් රාහුල තෙරණුවන්ට අවබෝධ වී ය.

දරුවෝ දණ නවාගෙන දෑත් එක්කරගෙන මාරුවෙන් මාරුවට සිය පියාණන් දෙසත් බුදු පිළිමය දෙසත් බලති. යසපාල බිමට අත ගසා නැගිසිටියේ ය. අනාථ වූ දරුවන් දෙදෙනා තමා ගේ ඇසත් අලවන්නට නැත් කරන්නාක් මෙන් දැතින් මිරිකාගන්නේ ය.

දරු දෙදෙනා දැතින් අල්ලාගෙන බුදු පිළිමය වෙතින් ආපසු එන යසපාලට රාහුල තෙරණුවන් දන්නට ලැබිණි. තමා ගේ දෑස පුරා කඳුළු බව යසපාල දනී. ගේ බිම බලාගත්තේ ය.

"ඇයි බායේ උන්නැහෙ?"

ශෝකීකරගත් මුහුණින් යුතු ව බිම බලාගත්විත ම ඉදිරියට ගිය ලෙස්ස මිනිසා කොයි අත යා යුතු ද යි නිශ්චයක් නැත්තකු මෙන් මිදුල මැද නතර ව වටපිට බැලුවේ ය. නොත්ර්ට කුළුණු මුහුණෙන් කතා බෝ හැලය දෙස බලමින් කුළුණු මිටට යාමින්නොට එමි පසක ම මාලයේ මිද යන්නේ ය. අනාථ ව සිය දෑතින් ම බද පතන් වූයේ ය. සිය පියා කිසියම්

WWW.SINHALAELIBRARY.COM 25

අමාරුවකින් පසුවන බව තේරුණියත් දරුවෝ ඔහු ගේ ඇඟේ එතෙකින් ඔබා ගත් හිස ඔසවන්නට තැත් කරති.

"ඔහට දකිපිය ඇකිකරගන්න බාප් උන්නැහැ. ඇයි එකපාරට පොඩි ළමයකුගෙ තත්ත්වයට පත්වුණේ?"

"මට අවසරයි හාමුදුරුවනේ. මං දන් ලෙඩෙක්" යසපාල හිස ඔසවා ඉතා අසරණයකු මෙන් බැගෑව ය.

"නිකං දුකවෙන්න එපා බාප් උන්නැහැ. බාප් උන්නැහැ පමණක් නොවෙයි සමාජයේ වැඩි දෙනා ලෙඩයි. ගතින් හෝ සිතින්"

"මං මෙච්චර දවස් ඇඳුවේ රට වීකරයි හාමුදුරුවනේ. ඒ ඇඳුමෙන් මේ පොඩි දෙන්නා පුරුදුකරගෙන ඒ දෙන්නට නිත්‍යයිවිගාට පස්සෙයි. අද මට බුදුහාමුදුරුවො ඉස්සරහ ඇඳුණා. මම දන්නවා මට තව වැඩි දොහක් ජීවත්වෙන්න බැ. මට දුක මේ මගෙ පොඩිලා දෙන්නා ගැනයි. මං නැතිදාට හාමුදුරුවනේ මේ පොඩි දෙන්නට........" යසපාල යළි මුහුණ ඔබාගත්තේ ය. දරුවන් දෙදෙනා ගේ දෑස්වල ද කඳුළු ය.

යසපාල ගේ දුකබර තරුණ මිරිද ගත් රුව රාහුල හෙරණුවන් ගේ සිතේ ඇඳිණි. ඇය කොතරම් පිළිකුලෙන් එක්වර ම තමන්ට ඇති වූ බව හැඟුණු හෙයින් ලෝක සබාවය මෙනෙහිකර ඒ හැඟීම නිකර කැතිගට උන්වහන්සේ උත්සාහගත්හ. අනුන් නිසාවත් තමන් නිසාවත් සිත කිළිටිකර නොගතයුතු යයි උන්වහන්සේ සිතති.

"ඇයි බාප් උන්නැහැ සිතින් ලෙඩෙක් වන්නෙ? බාප් උන්නැහැ මේ පොඩි දෙන්නාගෙන් සිත දුර්වල කරනවා. පිරිමියෙක් වගෙ කෙළින් ඉන්න. ඇයි කෙළින් ඉන්න පුලුවන්නම්



සිතෙද්දී ඇද වැටෙන්නෙ? සිත නිරෝගී නම් සිත සෙත්සිමින් නම් ගත සෙත්සිමින් කර ගැනීම පහසුයි. බාප් උන්නැහැ සතු ශක්තිය කවුරුවත් උදුරාගෙන නැ. ඒ ශක්තිය නැතිකරගන්න හදන්නෙ බාප් උන්නැහැම යි. පිරිමියෙක් වගෙ කෙළින් ඉන්න. බාප් උන්නැහැ වෙනුවෙන් මට කරන්න පුලුවන් උදව්වක් මම කරන්නම්........"

මුහුණ ඔබාගෙන සිටි මිනිසා එ සේ කීවිය ම දී ම සරණී දෑස් පිස මොහොතකුත් ගත නොකොට හිස එසවූයේ ය.

"මං පණිපෙත් හිටපු කාලෙක නම් මට සිත කෙළින් තියාගෙන ඉන්න පුලුවන්නම් තිබුණා හාමුදුරුවනේ. මං දැන පොරොයි, දැනී මේ ළමයි දෙන්නා ගැන අනුකම්පා කළා නම් මට ලොකු නැ. මං හිතාගත්තනම් හාමුදුරුවනේ ඒ නැති මිළා ය සිතුලා"

"බාප් උන්නැහැ මෙහෙම හිතුවොත් වඩාත් හොඳයි. ඒක ආගමානුකූල සිතිවිල්ලක්........"

"කියන්න හාමුදුරුවනේ. මං හාමුදුරුවො කියන විදිහට වැඩකරන්න පිළිගන්නම්"

"එක්තරා කාලෙක දී එක්තරා ගැනු කෙනෙක් බාප් උන්නැහැගෙ ගෙදර ඇවිත් බාප් උන්නැහැට උදව් උපකාර කරගෙන ජීවත්වුණා. ඒ ගැනු කෙනා බාප් උන්නැහැගෙ පවුල්කාරයට ගෙනියන්න බාප් උන්නැහැට පිරිමි දරුවන් දෙදෙනකු තැනි දීල යන්න ගියා. ඒ ගැනු කෙනා බාප් උන්නැහැට අයිති යි කියල බාප් උන්නැහැ හිතුවොත් වැරදි යි. කවුරුවත් කාටවත් අයිති නැ. තමන් ගේ ශරීරයවත් තමන්ට පාලනය කරගන්න තමන්ට අපහසු නම් තමන් කවුත් කෙනෙක්

WWW.SINHALAELIBRARY.COM 26

වී පාලනය කරන්නෙ අයිතිකාරයන්නෙ නොහොම ද?"

යසපාල ගේ මුහුණේ දුක්බර ස්වභාවය පහවෙමින් තිබිණි. යස් සොරණ්ණුවන් ගේ මුහුණ කෙළින් බැලුවේ ය.

"මං හිත හදාගත්තම් හාමුදුරුවනේ...... කාටවත් දෙස් කියල තේරුමක් නෑ නමයි"

"සියල්ලට ම පළමු තමා නිරෝගී ව සිටින්න උත්සාහ ගන්න. ඊනැම අසනීපයකට දත් බේත් තියෙනවා"

යසපාල සිරණ නිහිඩයකට එළැඹියේ ය. කොට ඒමට නොහැකි විපතකට තමා පත් ව සිටිනු යි සිතීම වැරදි ය. විපතට තමා ඇද දමුවේ තිබිද පිටිහු යි සැලකීම ද එ බඳු ම මිථ්‍යාවකි. පුරම්භකොට සොබා නක්ෂත්‍රය ආරක්ෂාකොට ගත යුතු ය. දරු දෙදෙනා තාවකාලික ව සිය සහෝදරියට භාරකොට රෝහලට ඇතුල් ව සුවපත් ව යළි ජීවිතය ඇරඹිය යුතු ය.

* * *

යසපාල දරු දෙදෙනා ද සමඟ ආපසු යනු පිටත් වූ රාහුල සොරණ්ණුවෝ, විහාර ගෙයි දොර වසා බිඳ පද එළියේ පඩි පෙළ බැස්ස හ. පඩි පෙළ මැදක් දුර බසින විට ආවාස ගේ දෙසින් උස් හඬක් නැගෙනු උන්වහන්සේට ඇසිණි. ඒ හඬ නන්දරාමගේ ය. නන්දරාම ගේ හාම් යස්ස නිසා සිනාසෙනු රාහුල සොරණ්ණුවන් මීට පෙර අසා නැත.

ආම්ලංස ගෙයි විදුලි පහන් දල්වා තිබිණි. ආලෝකයක් තුවයේ



රාහුල සොරණ්ණුවන්ගේ කාමරයේ පමණි. කාමරයට පැමිණි විදුලි පහන දල්වන් ම උන්වහන්සේ හමුවට සිංදෙප්පු පැමිණියේ ය.

"හාමුදුරුවනේ ඇහෙනවද සද්දෙ?"

"යාරංවෙත් ඇවිත් කොට, සිංදෙප්පු උන්නැහෙ, ලොකු හාමුදුරුවොත් නැතැ කොට......... ඒ ඇත්තෙට හිදාගෙන ඉන්නම් විදිනවා වෙන්න පුළුවන්. ලොකු හාමුදුරුවො ඉන්න කොට ඕය ආකාරයට සිනාසෙන්න බෑ නොවැ"

"සංඝයා මේ විදිහට 'හිදහනස්' මුළුත්ම විනේදෙන් සෑපෙනෝට දෙවියන්ට සිහිව නමයි!" සිංදෙප්පු බැරරූම් ලෙස කියේ ය.

රාහුල සොරණ්ණුවන් ගේ දකුණක උන්වහන්සේ නොදනුවන් ව ම උන්වහන්සේ ගේ හිස දක්වා හොඳ හිස වියට තියේ ය.

"හාමුදුරුවනේ දන්නවද වැඩේ. සෙන්තලයක් ගෙනැල්ලා දෙන්නත් එක්ක බොනවා! කාමරේ දොර වහලවට ජනේලෙන් මම දැක්කා. ඔය කැගහන්නෙ හිනාවෙන්නෙ වෙරිමිට! වෙන මොනා කළත් ඕය වැඩේ නම් හොඳ වැඩක් නෙමෙයි. ලොකු හාමුදුරුවො ආපු හැටියෙ මම කියනවා. නැමේ මිනිස්සු දැනගත්තොත් මොකද වෙන්නෙ?"

"ඒ උන්නාන්සේලා අපිනියෙන් කැගැහුවට සිංදෙප්පු උන්නැහෙ කලබල වෙන්න එපා"

"මං මේ පන්සලට ඇවිත් හෙළිස් හත් අවුරුද්දක් වෙනවා. හාමුදුරුවො පූර්පානය කරනවා දැක්කෙ අද තමා. අනේ අපොයි මේ පන්සලට වෙච්ච විනාසේයක්. රට කිස්සට හාත එක පට මොකද කිව්ව නැති, නිල පෙරිමැද්ද වගෙ කෑගහන්නේයි

WWW.SINHALAELIBRARY.COM 27

කන කන ගාල හිනාවෙන්නයි කියාගන්න නොවැ. මට ඉහිලුම් නැතිවයි මේ ඉන්නෙ. ලොකු හාමුදුරුවො නැති තැන මේ පන්සලේ ලොකු හාමුදුරුවො මම වහන්සෙ. සිඟිං අහන්නකො මේ විනවම මොකක්ද කියල. මේවට ඉඩදෙන්න හොඳ ද මං අහන්නෙ. සැසගේ ඉඳගෙන සැසගෙම ගඳගස්සන වැඩක් නොවැ මේ කොරන්නෙ"

හන්දරාමින් සෝරතත් උස් හඬින් කතා කරන්නේත් විටින් විට සිනාගගන්නේත් සිමිත්තම නිසා බව රාහුල තෙරණුවන්ට නිසැක ය. ඇතැම් නැවිද්දන් රහසින් සුරා පානය කොට නිදාගන්නා බව මුත්, මෙසේ අවිනීත ව හැසිරෙන බවක් උන්වහන්සේ අසා නැත.

රාහුල තෙරණුවන් ගේ ප්‍රතික්‍රියාවක් බලාපොරොත්තුවෙන් සිංඥන්ද්‍ර උන්වහන්සේ අසල ම රැඳී සිටී. තෙරණුවෝ මිශ බලාගෙන කාමරයේ සක්මන් කරති.

සිංඥන්ද්‍ර යළි කතාකෙළේ ය. "මිය ගිනාවයි හෝසාවයි නවත්වන්නැ යි කියන්නකො හාමුදුරුවනේ. මේක පන්සලක්! කෝලම් මඩුවක්වත් මිනුල් ගෙයක්වත් නොමෙයි! මොකද මිශ වහන්සේ බිය ද උන්නාන්සේලාට"

සද පියන් සහිත දොර, වැසූ පියනන් හැපෙමින් සෝරත හික්ෂුව කාමරයට කඩාවැදුණේ ය. රාහුල තෙරණුවෝ හැරී බැලූ හ. සිංඥන්ද්‍ර රවාබලා කාමරයෙන් පිටවී ය.

"ඒ මේ ඇතිකන නාකියනෙ! උං මට රවිවා! ඔව්! උං මට රවිවා!"

සිංඥන්ද්‍ර කුලුපස එළවා යන්නට මෙන් ගිය සෝරත හික්ෂුව යළි කාමරයට ඇතුල් වී යහන මත කඩා වැටුණේ ය. දැන්



පිටුපසට ගසා නොසෙල්වෙන්නට සිඳගත් සේ රාහුල තෙරණුවන් ගේ මුහුණ බැලුවේ ය. සිඳක් කට ඇද කරමින් කතාකෙළේ ය.

"රාහුල ස්ථවිරයො මාත් එක්ක තරහ ද?"

"නැහැ"

"එහෙනම් හන්දරාමින් එක්ක තරහ ද?"

"නැහැ"

"ඇයි එහෙනම් එක වහලෙ යට ඉඳගෙන අපිත් එක්ක කිසිම කතාවක් නැත්තෙ? මගෙ නම් සෝරත. දන්නවා නොවැ. මගෙ වැඩ කෙළින්. හැංගි හොරා වැඩ නෑ"

"කතා කළ යුතු දෙයක් ඇත්නම් අපි කතාකරමු"

"අන්න එහෙම කමයි ඉන්න ඕනැ. අපි එළිපිට ම කතා කරමු කෙළින්. හරි කෙළින්. අතාමිතනම් බෑ. කෙළින්. අද හන්දරාමයි මමයි පොඩියක් ගත්තා. රාහුල ස්ථවිරයො තරහ ද ඒකට? කෙළින්. හරි කෙළින් උත්තරයක් ඕනැ!"

"මම ඒ බව දැනගත්තා. නමුත් මම මගේ සිත කිලිටිකරගන්න උනන්දු වුයේ නෑ"

"නැහැ! එහෙම නොමෙයි! හරි කෙළින් උත්තරයක් ඕනැ! තරහ ද නැද්ද?"

"මම තරහ නෑ"

"අන්න හරි. විනය දන්න වෙරිවෙන්න කැතෝ ගාන්න නොමෙයි අපි පොඩියක් බිව්වෙ. මේකයි ස්ථවිරයො. අපි මහවිටාශය හොඳ තරහ දැනගෙන සිටියන්න ඕනැ. රාහුල ස්ථවිරයො දන්නවා නොවැ අපි විතර විනය තිබ්බලිතුයි

WWW.SINHALAELIBRARY.COM 28

සමාජ නීතිවලිනුයි කොටුවෙච්ච පෑගිච්ච කොන්වෙච්ච අසරණයො ජාතියක් මේ ලෝකෙ නෑ. ගිහියො ඔක්කොම කරනවා. අපිට මොකුත් කරන්න බෑ. මේ ඇහැට මේ ප්‍රතිපෝෂී එක වැටුනෙ මොකද? දන්නව නොවැ. ඒක දන්නවා. එතකොට ඒක එහෙම නම් අපි ඉඳල හිටල විනෝදවුණොට කාටවත් මොකෝ! සියලුම පව්කත් උනට. අපිට මොකුත් නෑ. අන්න ඒකයි. මළ කෙළියක්නෙ! මොකද අපි නිරහාරයොද?"

රාහුල තෙරණුවෝ මේසය ළඟ පුටුවේ වාඩිගත් හ. "ගිහියො අඬනවා දුක්වෙනවා වැලපෙනවා දකල නැද්ද ඔය උන්නාන්සෙ?"

"එතකොට රාහුල ස්ථවිරයො කියන්නෙ අපිට තියෙන්නෙ අඬන්න දුක්වෙන්න වැලපෙන්න කියලද?"

"අපිට අඬන්න දුක්වෙන්න වැලපෙන්න කියල බුදු හාමුදුරුවො දේශනා කරල නෑ. පිරිසිදු පවිත්‍ර වෙහෙසාවෙන් යුතු ව සැහැල්ලු නිදහස් ජීවිතයක් ගතකරන්න කියලයි උන්වහන්සේ කියල තියෙන්නෙ. උන්වහන්සේ අපට පමණක් නොවෙයි. ලෝකෙට ම කියල තියෙන්නෙ ඒකයි. එහෙම හිටියොත් ඒක අපේ ම සතුටට සැනසිල්ලට හේතුවක්"

සෝරත භික්ෂුව නැගිසිටියේ ය. මිදෙන් වැනි වැලි පිට ගිය වැනුණේ ය.

"උත්තර දෙන්න මම එනවා......" කියා නොවැදී, දොර පියන අල්ලාගෙන සෝරත භික්ෂුව කාමරයෙන් පිට ව ගියේ ය. ඔහු මොහොතකින් ආපසු ආයේ දෙතොල් පියදමිනි. වේගයෙන් ඇසි පිය ගසමින් ද, ඇස් පලල් කොට බලමින් ද හේ යළි ඇඳේ වාඩිවී ය.

පිළිකුලක් සැලකිරිමින් අනතුරුව කෝපයක් තම සිත තුළ



ජනිත වන බව රාහුල තෙරණුවන්ට හැඟිණි. තමන් ඉදිරියේ සිටුවන්නේ බෞද්ධ භික්ෂුවක් නොව, චීවරයක් පොරවාගත් අවිචාර අසංවර මනුෂ්‍යයකු පමණක් බව සිතමින් හැඟීවන කෝපය මැඩගත් තෙරණුවෝ ඉතා අඩුවෙන් කතාකිරීම මැනැවැ යි සිතමින් නිහඬවූ හ.

සෝරත භික්ෂුව යළි රාහුල තෙරණුවන් ගේ කාමරයට පැමිණියේ බොහෝ දුර කතාකිරීමට විය හැකි වුවත් ඔහු ගේ ගත හා සිත ඔහුගේ පාලනයෙන් බොහෝ දුරට මිදී තිබූ නිසා ඇඳ මත හාවාවැටෙන්නාට ඔහුට සිදුවී ය. ඔහු ගේ දෙකකුල සිට ඇඟිල්ලෙමින් තිබුණු අපාර දෑස් ඇඳ මත විසිද තිබිණි. විදුලි කොණකින් ගුණුණ් දාන්ඩිය අපිහිගෙන් පිසදගත් පැවිද්ද, කතාකෙළේ තාන්දරාම තෙරණුවන්ට ය. තාන්දරාම මේ වේලාවේ අසලකවත් නො සිටියේ ය.

"තාන්දයො, උඹත් නිදගනිං, මාත් නිදගන්නම්. උඹ සිත හොද එකා. මාත් සිත හොද එකා. ගත නැත එගෙ තාන්දයො. හිතත් නැත එගෙ තාන්දයෝ. නිවනට ද මේ යන්නෙ තාන්දයො......"

# 4

රාහුල තෙරණුවන් පැවිදිවූයේ දෙළොස් හැවිරිදි වියේ දී ය. පැවිදි බිමට එළැඹීමට උන්වහන්සේට කාරණය තුනක් හේතුවී ය. වයෝවෘද්ධ ව හුන් අපවත් වී වැදූ ධම්මාරාම ලොකු හාමුදුරුවන් වහන්සේ, ළමා වියේ හුන් සිරිසේන ගේ යහන්කදන්ත ගතිපැවතුම් කෙරෙහි පැහැදීම, උන්වහන්සේට දෙගි සම්බන්ධයක් තිබීම හා බිමින්සාමින් පූර්වයන් නිසා සිරිසේන ගේ පියා අභියෙයින් අයට වැටීම ඒ කාරණය තුන ය. ළමා වියේ සිටිය ද කුඩා සිරිසේන ගේ යහපත් ගති පැවතුම්වලට හේතුව ඔහු ගේ සංසාරික පැවැත්ම යයි ධම්මාරාම ස්ථවිරයෝ සිතූ හ. රාහුල තෙරණුවන් පැවිදි බිමට එළැඹ සිවු වසරකට පසු හදිසි රෝගාබාධයකින් නායක ස්ථවිරයෝ අපවත්වූ හ. උන්වහන්සේ ගේ ජ්‍යෙෂ්ඨතම ශිෂ්‍යයා වූ සෝමාරාම, පන්සලේ අධිපති ධුරයට පත් වූ අතර, එයින් අවුරුදු දෙකක් ඉක්මෙන්නටත් ප්‍රථම, උන්වහන්සේ නම සහෝදරයාගේ පුතෙකු නන්දාරාම නමින් මහණකර ගත්තෝ ය. එය කනිකර ම පන්සලේ අධිපති



ධුරය හා මුදලය මිට යා නොදීමට සෝමාරාම ස්ථවිරයන් නන්දාරාම ගේ දෙමාපියන් ගේ අනුදැනුම් ඇති ව කරන ලද්දකි. නන්දාරාම වයසින් ද, පැවිද්දෙන් ද උපසම්පදාවෙන් ද රාහුලට දෙවැනි වූවක් ඔහු හැදුරුවේ පන්සලේ දෙ වැනියා හැටියට ය. හැමී දනායකට වඩිනු පිණිස නායක ස්ථවිරයන් මිදුලට බැස ඉදිරියට වඩින විට නන්දාරාම රිළප හැන ගැනීමට වහා ඉදිරිපත් වී ය. මෙ වැනි අවස්ථාවල දී හුදෙවිවාස් මෙන් කරමින ගමන් කිරීම සෝමාරාම ස්ථවිරයන් ගේ පුරුද්ද ය. තමන්ට දෙ වැනි තැන නොව තුන් වැනි තැන ලැබීම ගැන රාහුල කිසිවිටෙක තැම්බිල්ලක් නොපෑහ, පන්සලේ ප්‍රධාන දායකයා වන වෙද මහතා දිනක් නායක ස්ථවිරයන්ගෙන් මේ ගැන ප්‍රශ්න කරන ලද බව සිංහදත්තු රාහුල තෙරණුවන්ට කියාසිටියේ ය.

"හාමුදුරුවෝ ගණන්ගන්නෙ නැතිවට එක පොට හරියන්නෙ නැති වග පොඩි හාමුදුරුවන් මහණකාරයත් ද මයි මං තේරුම් ගත්තෙ. ඕනෑම පන්සලක නායක හාමුදුරු නමක් පොඩි උන්නාන්සේලාට කතා කරන්නෙ "ලොකු හැන" "පොඩි හැන" කියලා. නම කියනව මිසක් මෙහෙ එහෙම කතාකාරකවා මම දකල නෑ. තුන් නම ම පිට වඩිනකොට කවුද ලොකු හාමුදුරුවො ළඟින් වඩින්නෙ? දන ගෙදරකදි කවුද ලොකු හාමුදුරුවො ළඟින් වාඩිවෙන්නෙ?"

මේ කාරණය සම්බන්ධයෙන් තමන් ගේ දැනීම් ද තමන්ගෙත් ප්‍රශ්න කරන බව රාහුල තෙරණුවෝ සිංහදත්තුට කීහ.

"ඉතිං ඔය හාමුදුරුවො මොකක් ද දුන්නු උත්තරය"

"එක ගණන් ගත යුතු නිරපෙල කාරණයක් නොවන බව

කිව්වා. ඒ කාරණය සිහින් අම්මාත් කර දන්න කියලත් මම කිව්වා"

"ඔබ වහන්සේ කතාව හරියි. මිය හොඳ හොඳට හිටින හොඳක් නොමෙයි හාමුදුරුවනේ! ඔබ වහන්සේ තුන් වැනියා නොවෙයි දෙවැනියා වග මුළු ලෝකෙම දන්නවා. ඇයි පොඩි හාමුදුරුවො පස්සෙන් යන්නෙ? මට හරි ෂෝක්නිසි මේ වැඩේට. දන්න පළමුවෙනි දවසෙ මට ෂෝන්තිය උණුසුම් තැවිට ගියා. ෂෝන්ති පියතාර මං කළ වැඩේ යනකල් ඉඳලා, අලුත් කැටේකින් වහල පිහිලිඹු උන්නාන්සෙගෙ කාමරේ ජනෙල් පියන තුන් පණකම තුනෙ ඉලක්කම ලිව්වා. මං ලියල තිබුණෙ තුන නෙමෙයි, අන්තිය කිරිතුන වග මට තේරුණා. "කවුද මේ අන්තිම තිස් තුන ලියපු එකා?" කියල උන්නාන්සේ මගෙන් අහනකොටයි, මං අහගෙනයි මේ ලෙඩ්ද වෙද මහත්තයෙක් ලොකු හාමුදුරුවොත් එක්ක ඔය ගැන කතා කරනවා ලොකු හාමුදුරුවො කට්ටියා........"

"මම ඒ ඇත්තගෙ මහත්තා නොවැ. ඒ ඇත්තො පොඩි කාලෙදිත් මට බොහොම මහාපයි. ඇයි වෙද මහත්තයාට කියන හැද්ද, පොඩි කාලෙ පන්සලට ආපුවාම මගෙ කාමරේ දොරෙ ගෙ වාඩිවෙලා තියෙනකුවල ආණි ලුද්දකරනවා" කියන උන්නු උන්නාවේ. ඔය කොයිගොම කිව්වත් එහෙම සිද්ධවෙන්නෙ මොකක්දැයි බලමු"

"අපි වෙන දෙයක් ගැන කතාකරමු සිංහදත්තු උන්නැහැ. මම ඔය කාරණය ගැන දිනින් දිනට කතාකරන්න කැමති නෑ. කොහොත් ම මම ඔය ගැන හිතන්නෙ නෑ. මට අධිපතිකම් අවශ්‍ය නෑ. ලොකු හාමුදුරුවන්නෙන් පස්සෙ පොඩි හාමුදුරුවන්ට මේ පන්සලේ අධිපතිකම අවශ්‍ය නම් එහෙම වුණාවේ. ඒ ගැන



සිංහදත්තු උන්නැහැත් කරදරවෙන්න එපා. මම කරදරවෙන්නකෙත් නෑ."

සිංහදත්තු ගේ ඇස් උඩයියේ ය. ඔහු රාහුල හාමුදුරුවන් ගෙන් බලාපොරොත්තු වූයේ මේ වැනි පිළිතුරක් නොවේ.

"පුණ්‍යවන්තයන්සෙ අතින් හාමුදුරුවන්ගෙන් වැඩිය වෙනස් නෑ මම දන්නවා. එත් තිබිම හාමුදුරු නමින් නොකියන කතාවන්නෙ ඔබ වහන්සේ කියන්නෙ! ඉතිං පොඩි හාමුදුරුවො මේ පන්සලේ ලොකු හාමුදුරුවො වෙච්ච දට ඔබ වහන්සේට උන්න හැකියි මේ පන්සලේ? හිටියත් පළ නොකියා පළා කදයි. ඒ උන්නාන්සෙ පළා ගෙදර විතරක් නිතාගිරියෙන් ඇති——"

"සිංහදත්තු උන්නැහැ ධම්මපදය කියවල තියෙනවද"

"පාලියෙන් නොවැ තියෙන්නෙ. මං කොහොම ද තේරුම් ගන්නෙ?"

"සිංහල තේරුම් සහිත ධම්මපදය මං සිංහදත්තු උන්නැහැට දෙන්නම්. ඒ පොතේ එක තැනක මෙහෙම තියෙනවා. 'අසත්පත් හිස් සිහසුව අනුන් ගේ ගරු බුහුමන් කැමති වේ. පෙරටු බව කැමති වේ. ආවාසයන්හි අධිපතිකම කැමති වේ. අනා කුලයන්හි පුද පැළඹිලි කැමති වේ.' බොහොමයක් උන්නාන්සෙලා පැවිද්දත් විදියට නොහිතනවාට මම මොකද කරන්නෙ සිංහදත්තු උන්නැහැ? ඉස්සර නම් ඒ ඇත්තන් ගැන හිතල දුරුවුණා. මට දැන් ඒ ඇත්තන් ගැන අනුකම්පාවක් ඇතිවෙනවා"

සිංහදත්තු කතා නැති ව බිම බලාගෙන බොහෝ වේලාවක් කල්පනා කරමින් සිටියේ ය. අවසානයේ ඔහු ගේ කලකිරීම වැඩිවී ය. ඔහුට අනුකම්පාවක් උපදවා ගත නැති වූයේ රාහුල

WWW.SINHALAELIBRARY.COM 31

කොරණුවන් ගැන පමණි.

* * *

රට කොටු කොළ පාත්තිය ළඟ වාඩි වී එයට ගොම පොහොර දමමින් සිටි රාහුල කොරණුවන් ළඟට සිංහදත්ත ගියේ ය. ඒ රට කොටු කොළ පාත්තිය ඉන්දවා තිබුණේ නාන්දරාම කොරණුවෝ ය. රට කොටු කොළ පාත්තිය රැකබලා ගැනීම ද, එයට අයිතිවාසිකම් කීම ද නාන්දරාම කොරණුවන් සතු යයි සිංහදත්ත සිතයි.

"ඇයි හාමුදුරුවනේ නාන්දරාම හාමුදුරුවන්ගෙ කොටු කොළ පාත්තියට පෝර දන්නෙ? උන්නාන්සෙ දන්නවා නම් ගස් කවට ම කියනවා තමන්ගෙ දේවලට ඇඟිලි ගහන්න එපා ය කියල. ඕක අයිතිකරගන්න හදනව කියලත් කියාවි"

රාහුල කොරණුවෝ හිස ඔසවා මඳහස පෑහ. "කොටු කොළ පාත්තිය ගැන සිතුවා ඇරෙන්න ඒ ඇත්තො ගැන මට කල්පනා වුණේ නෑ. කොටු කොළ පඳුරු සරුසාර ව තියෙනවා දකින්න මම කැමති යි"

"කොටු කොළ තමුන්නාන්සේගෙ නොමෙයි නම් ඇයි තමුන්නාන්සෙ මහන්සිවෙන්නෙ?"

"ගොම පෝර වැටුණොම අතුරුවට වැඩෙනවා. මෙය කවුරු අයිතිකරගත්තත් කමක් නෑ, ගොම පෝර වැටිල තියෙනවා දුටුවාම ඒ ඇත්තො එයින් සතුටුවේවි"

"ඒ උන්නාන්සේ එහෙම ඇත්තෙක් නොමෙයි. මගෙන් අහාවි



කවුද පෝර දමල තියෙන්නෙ කියල. මම වහන්සෙ කියල කිව්වොත් ඉතිං හාස්‍යකරගෙන කියාවි උන්නාන්සෙගෙ දේවලට ඇඟිලිගහන්න එපා යයි කියන්න කියල........"

"මළ පොතේ අකුරක්වත් නොදන්න, ඉස්සර උන්නු අපේ ලොක්කා පොතෙන්ත් ගැන අපේ අම්මා කියනවා මම අහල තියෙනවා සිංහදත්ත උන්නැහැ. ඒ අපේ අම්මාගෙ ගාත්තයෙත් ගාත්තා. ඒ ලොක්කා අනුන්ගෙ කුඹුරු පනුකරගෙන තමන්ගෙ කුඹුරට ගිහිං තියෙන්නෙ කොහොම ද, අනුන්ගේ කුඹුරුවල දකින දකින වල් පැළෑටි ගලවාදාලා වතුර බැඳිය යුතු නම් වතුර බැඳලා. කියන්නෙ කොහොම ගොඩවන් තිබුණ නම් ඒක ඒ කුඹුරට ම වැටෙන්න කපුගලන් කල්පසාර දම්මා. ඒ වගෙ ඇත්තෙකුට තමන්ගේ කුඹුර වගේ ම අනුන්ගෙ කුඹුරුත් සරුසාර ව තැඩිල තියෙනවා දකින්න මහාසයක් පහළවෙනවා. දැන් ඒ වගෙ සිංහදත්ත උන්නැහැ මටත් මහාසයි මේ කොටු කොළ පාත්තිය සරුසාර වෙනවා දකින්න........"

සිංහදත්තට යමක් අවබෝධ වූවා විය හැකි යි. ගේ කතාවෙන් කොර ව විද ළඟට කොස් වතුර කනිට්ටුවකුත් පොල් කටුවකුත් රැගෙනවුත්, හැම කොටු කොළ පඳුරකට ම වතුර පොල් කටු අඩක අඩක බැගින් බෙදුවේ ය.

සවස් කාලය නොයිත් ඉර අව්ව සැර නැත. කොටු කොළ පාත්තියේ ඉතිරි ව තුබූ වල් ගෙළීම පදහා සිංහදත්ත පහත්වි ය. පන්සලේ බැළලිය දන කාලාව දෙස සිට අපහසුවෙන් මෙන් පැමිණ ඔහු අව්වේ වැතිරුණා ය. ගැබිබර හෙයින් ඇගේ උදරය විසාල ය. උදරයට හොඳින් අව්ව වැටෙන්න සලස්වා මිදුස් උඩුබැල්මලන් බොරලු ගොඩ උඩ වැතිරගත් බැළලිය, කණ වූ ඇස අතින් වසා ගත්තා ය. ඇගේ ඒ ඇස කණ වූයේ නාන්දරාම

WWW.SINHALAELIBRARY.COM 32

යේ කොළු මිටි පහරක් නිසා බව සිංඥප්පු දනී. ගොටු කොළ පාත්තිය ගැන රාහුල හාමුදුරුවන් දක්වන ප්‍රතිචාර පිළිබඳව ම ඔහු ගේ සිතට සිතිවිලි පහළවෙ යි.

"අපි දන් ගොටු කොළ පාත්තිය වල් පැළ උදුරන්නැහැ. බැරි ද හාමුදුරුවනේ මේ රටේ ඉන්න තරුණයො ටික උදුරල දාන්න?"

"හොඳ මිනිස්සු කී දෙනෙක් ඉතිරිවෙයි කියල ද සිංඥප්පු උන්නැහැ හිතන්නෙ?"

හොඳ මිනිසුන් යයි කියන්නේ, හොඳ දෑ කරන හොඳ දෑ සිතන උදවියට පමණක් බව සිංඥප්පු දනී. පළමු ව ගේ සත්සල ගැන සිතුවේ ය. සත්සලේ පසුවන හාමුදුරුවන් නිදෙනාගෙන් කට පුරා හොඳ යයි කිව හැක්කේ රාහුල හාමුදුරුවන්ට පමණි. ගම ගැන සිතුවොත් ගමේ හොඳ මිනිසුන් වශයෙන් හැඳින්විය හැක්කේ වෙද මහතා ඇතුළු තවත් දෙතුන් දෙනෙකු පමණි. ඒ අනුව මුළු රටෙන් ම හොඳ මිනිසුන් හත් අට දහසකට වඩා සොයාගත නොහැකි යි. සිංඥප්පු පෙරණියකු මෙන් කොරණ්ඩුවන් දෙස බැලුවේ ය.

"බුදු හාමුදුරුවන්ටත් බැරිවෙච්ච හොඳ මිනිසුන් හදන්න අපිට මොන ජගතට ද පුළුවන්......"

"සමාජයේ සියලුම දෙනා සහමින ගලවන්න බුදු හාමුදුරුවන්ට ප්‍රමුඛවන් වුණා පුළුවන්. ඒත් ඉතා විශාල පිරිසක් යහමින ගලවන්න උත්සාහයේදී පුළුවන් වුණා. අනුරුද්ධ දෙදාහක් සත්තියකට පස්සෙ අදත් උත්සාහවන්තයන් ධර්මය නිසා සුළුකිය ප්‍රභූ පිරිසක් ධර්මයෙහි හැසිරෙනවා. හොඳ ඇත්තකා වගේ ම නරක ඇත්තෙකුත් ඉන්නවා. ඒ ඇත්තෙකුත්



නිසා උන්නාවේ සිංඥප්පු උන්නැහැ......"

සිංඥප්පු ගේ සිතිවිලි නැවතත් අවුල්වීමට වල් පැළ සමග වැඩෙමින් සිටි මෙනෙහි පැලෑටියක් හේතුවි ය. ඒ සිංහල මෙනෙහි කපායට නැතිව ම බැරි කවුවැල් බදු පැළයක් බව ඔහු හැඟාගත්තේ අසවින් වී වැඩ ලොකු හාමුදුරුවන් වහන්සේ ගේ කාලයේ දක කාලාව ඉන්දියාවේ ලොකු කවුවැල්බද්ධ පැළයක් සිටියේ නිසා ය.

"මේ බලුන්නායෙකු හාමුදුරුවනේ...... මං දන් මොකාදැයි කරන්නේ? මේ කවුවැල් බදු පැළයක්. ඉන්දියාවේදිය මේවා හොඳට හැදෙන්නේ. මේක බොහොම අමාරුයි පැළයක් පැළකරන්නට"

කවුවැල්බදු පැළෑටිය වල් පැලෑටියක් නො වේ. ගොටු කොළ පාත්තියට ම වඩා ඒ පැළෑටිය අගයේ යයි කොරණ්ඩුවෝ සිතූ හ. කළු ප්‍රස්ථයේ විදුලත් පැලෑටිය විදුලත් තැනක කරන්නය සිටියේ ය.

"එහි මේ පැළෑටිය හොඳට අපිට වැවෙන තැනක ඉන්නේලු?" රාහුල කොරණ්ඩුවෝ යෝජනා කළ හ.

"වසකොට හාමුදුරුවනේ මට නොතේරෙන දෙයක් මෙතැන තියෙනවා. මං මේ කල්පනා කෙළේ ඒක ගැනමයි. බොහොම කලාතුරකින් වල් පැලෑටි අස්සෙත් හොඳ පැලෑටි හැදෙනවා නේද? කවුවැල් බදු පැළේ අපි තියෙව්වැයි? ඒ වුණාට මිය තැබුණේ. හොඳයි හාමුදුරුවනේ අපි නොදන්න නම් මේ පැළේට මොකද වෙන්නෙ? කණ කොළ මේ පැළේ මරයි ද? මේ පැළේ කණ කොළ මරයිද? අනික, ගොටු කොළත් හොඳයි, කවුවැල් බද්ධත් හොඳයි. අපි එහෙනම් මොකෝ කවුවැල් බදු පැළේ

WWW.SINHALAELIBRARY.COM 33

උදුරලා වෙන තැනකින් හිටවන්න හදන්නෙ? මගෙ ඔළුව අල්ලපු මුණ හාමුදුරුවන් මෙව්වා කල්පනා කරල......"

සිංහදත්ත ප්‍රශ්නය මතුකරද්දී සුදුමැයට මෙන් රාහුල තෙරණුවෝ ද ඒ ගැන සිතමින් සිටියෝ ය. ලක්වකන්ගේ ඒ ගැන කතාකෙළේ, වියළි ගොම් මුසුකොට බුරුල් කළ පසේ පැළෑටිය රෝපණය කිරීමෙන් පසුව ය. සිංහදත්ත කැකිල්ල අතු කිහිපයක් පැළෑටිය වටේ ගැසුවේ පැළෑටියට සෙවණ පිණිස ය.

"මේ ලෝකෙ පවතින්නෙ ප්‍රදුමිකාර සම්බන්ධතාවකින්. එක්ක අනිකට සම්බන්ධයි. ගහකොළ අපිට සම්බන්ධයි. අපි ගහකොළට සම්බන්ධයි. නරක ය කියල, හොඳ නැහැ ය කියල, හුසුදුහු ය කියල කිසිම දෙයක් අයින් කළ යුතු නෑ......" රාහුල තෙරණුවන් කතාකරද්දී, සිංහදත්ත උදල්ලට එක් අතක් ද, කුණුවියට අනික් අත ද ගසාගෙන නිහඬ ව අසාසිටියේ ය.

"...... අපි අනුභවකිරීමට නැතිව තණ කොළ උදුරල දමනු එකක් වැරදියි. තණ කොළ පවා ප්‍රයෝජන නැතිවාට තරකුසුත් බොහොම ප්‍රයෝජනවත්. ඒ තණ කොළ තරන් ප්‍රයෝජනවට ගස්වට පස්ස අපිටත් කිසිම එකකින් ප්‍රයෝජනවත් වෙනවා. ගවයා කොච්චර ප්‍රයෝජනවත් සතෙක් ද? ඒ සතාගේ ප්‍රධාන ආහාරය තණ. මිනිස්සු ගවයාගෙන් දහසක් වැඩ ගන්නවා. අපි කිරි කියල බොන්නෙ මොකට ද සිංහදත්ත උන්නාන්සෙ? කිරිබුලෙන තණ කොළත් අපිට අනියම් විදියෙන් වැදගත් වෙන හැටි අපි කටුවැල් බිඳු පැලේ දක්නෙ නැතත්. මට විශ්වාසයි මේ කටුවැල් බිඳු පැළේ තණ කොළ අස්සෙන් කඩ්ද නාලීන් මතුවෙනවා. ස්වභාව ධර්මයේ කටුවැල් බිඳු පැළෙත් එකයි. තණ කොළත් එකයි. බුදුහාමුදුරුවො වගෙ තමා. හොඳ මිනිස්සුන්ටත් නරක මිනිස්සුන්ටත් සමාන ප්‍රලසිල්ලක් දක්වන්නෙ. වැස්ස වහිනකොට



හැම තැනට ම එක විදියට වැහි බිඳු වැටෙන්නා වගෙ තමා. ලෝකෙ වැඩියෙන් තියෙන්න ඕනෑ තණ කොළ. කටු වැල් බිඳු නොවෙයි. එකයි කලාතුරකින් තමන්ගේ කටුවැල් බිඳු පැලයක් පැළවෙන්නෙ. සමහර විට කටුවැල් ලොකුවට හැදෙනකොට ඒ දත තියෙන තණ මැරියන්න පුලුවන්. හැම තැනම තණ වැවෙන නිසා සාත්තුවක් නෑ. මිනිස්සු ස්වභාව ධර්මයේ එක්ක මිනාවට වැඩිය හැප්පෙනවා. මිනිස්සු නිකන්ගෙ ගහකොළ ඇටි අදල කැපැකීතාවට තමන්ගෙ අවශ්‍යතාවට ම පවතිනවා කියල. ඒ නිසා මිනාව දේ විනාශකරනවා. අනවශ්‍ය යයි සිතන දේ විනාශකරනවා. එතකොට වෙන්නෙ ස්වභාව ධර්මයාගේ පවත්නා සමබරතාව බිඳීමෙන් එකයි. ඒ සමබරතාව නැහැතක ලෙස මිනිසුන්ට ම විනාශයට පත්වෙනවා. එදා කාල ගුණය දැනගත් වෙලා ලෝකෙ වනන්ට හැරී කෙන්නියක් ලැබෙයි."

සිංහදත්ත උදල්ලෙන් දකුණත මුදු හිස කසුවේ ය. "එතකොට හාමුදුරුවන් කටුවැල්බිඳුත් එකයි, තණ කොළත් එකයි නම්, හොඳින් හිටියත් එකයි, නරකින් හිටියත් එකයි: එක ද එකම නේද්‍යම්? බුදුහාමුදුරුවො හොඳ මිනිසාට හොඳයි කිව්වෙ නැද්ද? නරක මිනිසාට නරකයි කිව්වෙ නැද්ද?" සිංහදත්ත මෙවර්ධියෙකු නොවෙයි. ඔහු ඇසුවේ වැදගත් ප්‍රශ්නයකි.

"බුදුහාමුදුරුවො නරක වැඩ කරන මිනිසුන් දක්කා. නරක වැඩ කරන මිනිසුන් නරක මිනිසුන්ය කියල හැන්වකට කෙළේ නෑ. බුදුහාමුදුරුවො දේශනා කෙළේ නරකක් කළොත් නරකක් ම වෙනවා, හොඳක් කළොත් හොඳක් ම වෙනවා කියල. හොඳ නරක ලෝකයේ පවතිනවා. හොඳ අඩුයි. නරක වැඩියි. හරියට කටුවැල් අඩුයි තණකොළයි වගෙ. අප වගෙ පැවිද්දෙක්

උන්නාවේ. දරු පවුල් රකින ගිහියොත් ඉන්න ඕනෑ. හොඳ ඇවිද්දන්නගෙනම ලෝකය පිරුණොත් ඊට පස්සෙ මිනිස් සම්පතක් ඇතිවෙන්නෙ නෑ. හරියට කුට්ටිලැල් තුවු පළුරු වලින් පොළව වැසුනොත් තණ කොළ සම්පූර්ණයෙන් ම වැසෙවන්නා වගෙ"

"අපි තණ කොළ උගුල්ලපු එක වැරදියි ද එහෙනම් හාමුදුරුවනේ?"

"හරි වැඩක් නොවන වගයි කල්පනාවට එන්නෙ"

"මගෙ සිතට අවුල්වුණා හාමුදුරුවනේ......"

"හැබැ පිංසදප්පු උන්නැහෙ. මිය ආකාරයට කල්පනා කරල අපි ලෝක ස්වභාවය තේරුම්ගන්න ඕනෑ. ප්‍රඥාව තියන්නෙ ලෝක ස්වභාවය මනුෂ්‍ය ස්වභාවය තේරුම් ගැනීම"

"අනිකා හාමුදුරුවනේ...... කුට්ටිලැල් තවුස් තණ කොළත් එකයි නම්, මාත් එකයි මිය හාමුදුරුවොත් එකයි ද?"

"පිංසදප්පු උන්නැහැයි මටයි කොච්චර නම් සමාන ද? වෙනස පිංසදප්පු උන්නැහැට වඩා මම සතුටින් පිරිම තමනයි. අපේ බුදු හාමුදුරුවො මුළු ලෝකෙට ම අනුකම්පාවෙ මිනෙනෙ. සැනැල්ලුවෙන් හැප්පියෙන් ජීවත්වීම"



# 5

ගිරු කැළ යන ගොම්මන් වේලාවේ විහාර මළුවෙන් මෙරු පියවනානට පුන. කපුවෝත් කවුඩෝත් ගාන්ධාර කුරණ අවට ඉගිල්ලෙමින් ඔවුන් වැනැයෙතිනී. ඉගිළෙන මෙරුන් වැනැගැනීම අසිරු කාර්යයකැ යි වැටහුණු නිසා දෝ කපුවන් ගිමට වැය නිම ඇවිදින මෙරුන් ගිලී.

මැරුරු ගෙහවන් ම පළමු ව කපුවෝත් දෙවැනි ව කවුඩෝත් නිහඬ ගියෝ ය. දෙවනු ව ඔවුන් ගේ නැත ගැනීමට ඇමිණියෝ ගෙම්බෝ ය. විහාර ගෙයි මතුව දල්වල ඇවිණුණු මෙරුන් ගේ පිහාටු සමනෙස් බිම වැටේ. බිම වැටුණු පිහාටු කුහුඹුවෝ මිසරා යති.

මෙරුනාට උන්දිහා කවුස් හරියට බලයෙන් වනයෙන් මිම්බි එයි යන්නට නානා මිනිසාගේ අයිතිය ආසාවනට සමානකොට සියලින් දරලිය යස මුළුව ඇමිණී රාහුල තෙරණුවෝ මිද ආලෝකයෙන් පවත්නා බටහිර අහස දෙස බැලූහ. මහ පොළවම

WWW.SINHALAELIBRARY.COM 35

අඳුරින් වැසියන සේ එක් වේලාවට විහාර මලුවේ හුදෙකලාව පසුවෙමින් තිහඬ සිසිත් පසු විමට තෙරණුවෝ රුචියක් දැක්වූහ.

තෙරණුවන් ගේ පමාවිය බිඳිගියේ සන්සල් වැටේ යසපාල ගේ බල්ලා එන්විට ම බුරාහැපෙන්නට වූ නිසා ය. යසපාල ගේ දුම්බි දෙදෙනා ද බොරදෙති. ඒ අතර බැණවැදීමකි. බල්ලා ගේ බිරුම් හඬට අවට බල්ලන් ද එක් වූ හෙයින් මහා ගෝසාවක් පවති. ගෝසාව අසමින් යසපාල ගෙන් ද උභෝගී හඬක් නැගිණි.

රාහුල තෙරණුවෝ විදුලි පන්දම දල්වාගෙනවන ම කලබැගෑහිය සිදුවන යසපාල ගේ ගේ දෙසට වහා නික්මුණෝ ය. අවක් දුර යන් ම වෙඩි හඬක් නිහෙමිණි. බුරා හැපෙමින් සිටි බල්ලා මරණ තළමින් දිවගොස් නිහඬවී ය.

රාහුල තෙරණුවන් යසපාල ගේ ගේ සමීපයට යන විට ළමයින්ගේ කෑගැසුම ද නතර ව තිබිණි. ගේ ඇතුළේ කුප්පියක් දල්වමින් තිබිණි. මිදුලේ කෙඳිරිගෑමකි. පොල් ගස මුල කලුතුලුවකි. එ තැන සිට රාහුල තෙරණුවන් ගේ මුහුණට සුදු විදුලි පන්දම් එළියක් වැටිණි. තුවක්කුවක් ගත් සාහසිකයෙක් ඉදිරියට ආවේ ය.

"එයි හාමුදුරුවනේ, බණ අහන මිනිස්සු මෙහැන නෑ. හොඳ සිහිං යන්නයි කියන්නෙ. අඩියක් ඉස්සරහට තිබ්බොත් වෙඩි තියනවා"

මිදුලේ වැටී සිටින යසපාල දුබල හඬින් දරුවනට කතාකරයි. "පුතේ...... මගෙ ලොකු පුතේ..... වතුර උගුරක් පුතේ........"



පරම කැසකාවාගෙන ලොකු පොල්ලක් අතේ තබාගෙන පුන් සාහසිකයෙක් අඳුර අතරින් හෙතුලට ගොස් කෑගැවේ ය. "සෙල්ලෙන්න එපා එකෙක්වත්. නැගිට්ටොත් මරනවා!"

මාරාවේශව සිටින සාහසිකයින්ට එරෙහිවීම මරණය ළඟාකර ගැනීමක් බව රාහුල තෙරණුවන්ට හැඟුන ද, පෙරළා යාමට උන්වහන්සේ අදහස් නොකළහ.

"මේ ඇත්තො අසරණයෙක්. රෝගියෙක්. කුරා කුහුඹුවෙකුටවත් වරදක් නැති පුද්ගලයෙක් නොවේදී......."

"බණ් කාවකියගන්නෑවා හාමුදුරුවනේ. හොඳ සිහිං ආපසු හැරිලා යන්නයි කියන්නෙ!"

සාහසිකයින් යන්නකින් ගෝ මෙල්ලවන පාටක් නැත. යසපාල ගේ ගෙට යාබද ගෙවල් දෙකක් ඇත ද, ඒ ගෙවල් දෙකේ සිටින්නෝ මිනු ගේ දෑතින් ඩූව ද ඒ කිසිවෙකුත් පෙනෙන්නට නැත. යටත් පිරිසෙයින් විදුලි පන්දම් එළියකුදු නොපැවේ. බස් රථයක් ආවේ ය. ඒ බස් රථයේ එළියෙන් මදක් යසපාල ගේ ගෙමිදුලටත් සාහසිකයින් ගේ ඇඟටත් වැටිණි. මිනිනු නොපෙළුණෙ හ.

"මේ ඇත්තො වරදක් කළා නම් ඒ වරද මට කියන්න"

පොල් ගස මුල සිට විදුලි පන්දම තෙරණුවන් ගේ මුහුණට ම දල් වූ පුද්ගලයා සමීපයට ම පැමිණියේ ය. "...... යනව හාමුදුරුවනේ!" ගේ කුණුහරුපයක් මුළට දමා පැරෙන් කීවේ ය. ඒ, යසපාලගෙන් මෙතක් වැඩ ඉගෙන, කලක් මිනුගෙන් කමින් බොමින් ශක්ති ගත කොට, යසපාල ගේ නිවිත්දු එසෙත සලාපිය පියදස බව තෙරණුවන්ට හඳුනාගත හැකිවී ය.

යසපාල වතුර ඉල්ලා දිගින් දිගට ම කෙඳිරිගායි. රාහුල

කොරළුවෝ විදුලි පන්දම කිහු දෙසට එල්ල කළෝ ය.

"...... කිලන්නෙ හාමුදුරුවනේ? අන්තිම වතාවටයි මේ කියන්නෙ. යනව හොඳ හිතිං යන්න!"

යසපාල ලේ විලක වැතිර සිටින බව කොරළුවන්ට දක්නට ලැබිණි. පොල්ලක් ගත් සාහසිකයා දරුවන්ට තර්ජනය කරයි.

සාහසිකයින් සමඟ තර්ක කිරීම නිරර්ථක හෙයින්, සාධු චේතනාව පෙරදැරි ව අසරණයාට පිහිටවීම සඳහා ඉදිරියට යා යුතු යයි කොරළුවෝ අධිෂ්ඨානය කොටගත් හ. මරණය ගැන සිතා පසුබට විය යුතු අවස්ථාවක් නොවේ.

"මම දාසව ඔය ඇත්තන්ට හොඳ තරහ කියා දෙන්න නොවෙයි. ඔය ඇත්තො කරපු හොඳ තරහ ඔය ඇත්තො ගෙනියයි. වතුර ඉල්ලා, කෙඳිරිගාන අසරණයාට පිහිටවීම මගේ යුතුකමක්. අසරණයාට වතුර දෙන්න යන මට ඔය ඇත්තො වෙඩි තබනවා නම් වෙඩි තබන්න. ඒක ඔය ඇත්තන්ගෙ කාර්යයක්"

දැඩි අධිෂ්ඨානය හා මෛත්‍රීපූර්වක සිත පෙරටුකොට රැගුම් කොරළුවෝ ඉදිරියට ගමන්ගත් හ. තුවක්කු ගත් සාහසිකයා ඉදිරියට පැන තුවක්කු කට කොරළුවන් ගේ පපුවට තැබුවේ ය.

"යන්න එපා. ආයින් දෙකක් නැ. කියන එක කියනවාමයි!"

තුවක්කු කඳ පැත්තකට තල්ලු කළ කොරළුවෝ තුවක්කු ගැනවත්, පොලු මුගුරු ගැනවත්, තැකීමක් නොකොට වතුර ගෙනෙනු පිණිස ගේ තුළට කිඳාබසිද්දී අන් වරක් තමා පසුපසින් කොකා ගැස්සෙන හඬ උන්වහන්සේට ඇසිණි.



කොරළුවන් ගේ හිස් කොඩියට එල්ලකොට තුන් වරක් ම කොකා ගැස්සූ සාහසිකයා පුදුමයට පත් විය. තුවක්කු කට අහසට එල්ලකොට යළි කොකා ගැස්සුවේ ය. තුවක්කුව පත්තුවී ය. කොරළුවන් හැරී බැලුවේවත් නැත.

තුවක්කුව පලුවා හිස් පහරවන් හිසෙන් රැඳවා ගනිද්දී සාහසිකයා ගේ අත වෙව්ලුවේ ය. ඒ ප්‍රතිවිලිය තුවක්කුවට අලුත් පසුරෝමිත් ද බිඳු පසුවීත් ආශ්චර්යයේ නැත. ඔහුට කඳ සියක් දුනිණි. ඒ බිය, තුවක්කුව තෙ වරක් ම පත්තුනුවූ බව දන්නා පෙකිස්සුන් තුළ ද ඇති වී තිබිණි. එක්තැන් වූ මිනිසු අලුවේ ම තොවෙනි කියයේ ය.

තුවක්කු ගැන, පොලු මුගුරු ගැන මඳ ගෙන් අවධානයක් යොමු නොකළ කොරළුවෝ විදුලි පන්දම දල්වා ගෙන කුස්සියට ගොස් කළය උඩ තිබූ පොල් කට්ටට වතුර පුරවා ගෙනවුත් අසරණයාගේ හිස ළඟ පසඟුව හ. බියෙන් ගුලිගැසී සිටි දරුවෝ දිව ආහ. යසපාල ගේ ලෙයින් තෙත්ගිය මුහුණේ වැලි පිසදමා දල්වන ලද විදුලි පන්දම බිම තැබූ කොරළුවෝ දකුණතින් වතුර පොල් කට්ට ගෙන, වමතින් හිස අල්ලා මඳක් එසවූ හ. වමතේ ඇඟිලි දෙකක් හිස් කට්ට ඇතුළට ගිය බව උන්වහන්සේට දැනිණි. දරුවෝ බිරාන්ත ව සිටිති. ගැහෙමින් සිටි මිනිසු තමන්තමන් කියවූහ.

එතක බුරුල්කොට හිස යළි පහත්කළ කොරළුවෝ වතුර පොල් කට්ට වමතට මාරුකොට දකුණතින් වතුර ගෙන අසරණයාගේ කටට වත්කළ හ. අඩු ලේ පෙදි බිම වැටිණි. යසපාල හුස්මක් නොගනී. අතපය නොසොල්වයි. ඔහු මිය ගොසිනි.

* * *

WWW.SINHALAELIBRARY.COM 37

රාහුල තෙරණුවන් පන්සලට පැමිණියේ මහ වැස්සට තෙමෙමිනි. ඇඟපත සෝද තෙමුණු සිවුර මාරුකොට ගන්නටත් පෙර, දුම් දමන කෝපි කෝප්පයක් රැගෙන සිංහදත්තු කාමරයට පැමිණියේ ය.

"කෝපිත් හැදුව ද සිංහදත්තු උන්නැහැ?"

"ඕං දන්නවා තෙමිතෙමි එන වග"

කෝපි කෝප්පය දුනිත් ම තෙරණුවනට සිදු සිංහදත්තු බිම වැතිර තෙරණුවනට නමස්කාරය කෙළේ ය.

"ඇයි සිංහදත්තු උන්නැහැ........"

"එහෙමයි. එහෙමයි. මම හයියාකාර ව හාමුදුරුවන්නාන්සේ දුටුවේ අදයි. බැටකිය එළිය කරගෙන හාමුදුරුවන්නාන්සේ සිංහයා වගෙ ඉස්සරහට යනකොට අරු සිවුපාවුන් එළව එළවා කොහෙ ගස්සනවා මං බලාගෙනයි........"

"සිංහදත්තු උන්නැහැ උන්න ද ඒ කිට්ටුව?"

"උන්නැදත් අහනවා. මං උන්නෙ කඹරල පළුවේ. හාමුදුරුවන්නාන්සෙ විහාර ගෙයින් එනවත් මම බලාගෙනයි"

"කොයි වෙලාවෙද එතැනට ගියේ?"

"හාමුදුරුවන්නාන්සෙට ටිකකට කලින් බිල්ල ඉල්ලා කොට මං උන්නෙ බණ මඩුව ළඟ. ළමයි ටික එකතු වෙලා හැංගෙනකොට කඹරල පදුරට මුවාවෙලා බැලුවා. ගොඩක් ගහන අපරාධයක් හාමුදුරුවනේ. උන් බිල්ලව මරල ගේ ඇතුළට ගියා. එහෙත් බාස්උන්නැහැගෙ බිල්ලෙන් ඉල්ලාගෙන ඇවිල්ලා මිදුලට කළා. වුවුණා. අර බාස් උන්නැහැගෙ ගෑනි කොහෙත් අරංගිය එක හමයි මහ වැටිච්ච බාස් උන්නැහැට කතරයට



ගහන්න වගෙ ගැහැවීවෙ. කොහොමෙම ගැහැව්වද මම දන්නෙ නෑ. බාස් උන්නැහැ 'අයියෝ........ සිදු අම්මෝ.......' කියල ගුත් හතර සැරයක් කෑගැහුවා. හිමිවහන්සේ ආවෙ ඊට පස්සෙ"

"හිතුවටත් වඩා මිහිපසු දරුණු කොටු සිංහදත්තු උන්නැහැ"

ආයෙක ජරාජීරණයේ රාහුල තෙරණුවන් ගේ කාමරයට කර තොටා බැදී හ. කෝපි කෝප්පය මේසය මත තැබූ රාහුල තෙරණුවෝ ගෞරවයෙන් එකත්පස් ව සිටිය හ.

"ඕං හොයියට සිංහදත්තු මට කිව වෙච්ච සිද්ධිය. දන් කොලීසිය මෙහාටත් එයි. සාක්කි දෙන්න වේවි. උසාවි යන්න වේවි. මිනීමරුවන්ට හාමුදුරුවන් එක්ක වයිර බැඳගනීවි. ඇයි මෙහෙම කරදරවලට පැටලෙන්නෙ? වෙලාව හොඳ නිසාවෙත් හාමුදුරුවන්ට නිකරු වෙච්ච පත්තුවුණේ නැති එක දැක්ක. බැරි වෙලාවක උන්නැවුණා නම්? එහෙනම් හාමුදුරුවො අද බාස් උන්නැහැගෙ මිදුලෙ! ඇයි මෙහෙම දේවල්වලට යන්නෙ? හාමුදුරුවො නිසාවෙ ඒ අසල පහළ එක මිනිහෙක් ගියා ද? බාස් ගෙ කැඳැලෙයා කෝද ගේ වටේට ම ඉන්නෙ?"

කරබා සිටිනවා ඇරෙන්න උත්තර කියන්න යාම සාපෙලාචිත නොවේ යයි රාහුල තෙරණුවෝ සිතති.

"භාජනෙ දුමයින්ට දන මිතුල දෙනවා. බාස්ට පන්සලේ කැලි බාගෙ දෙනවා. ඇයි හාමුදුරුවො මේ බාස් ගැන මෙච්චර හැක්කුම්? අපි පන්සල්වලට වෙලා ඉන්නෙ ඒ ඇත්තන්ගෙ කරදරවලින් ඇත්වෙන්න. ඒ ඇත්තන්ගෙ කරදර අපේ කරදර විදියට ඇයි හාමුදුරුවො බාරගන්නෙ? හාමුදුරුවන් මහ දර්ශනිකයා....... උසාවි නඩුයාන්න බියෙන් කැලි බාගෙ ඉල්ලනවා නොවෙයි. මේ කරදරවලට මාව පටලවාගන්න එපා!"

නායක ස්ථවිරයන්ගේ සටහන් යළි නොලැබුණු නිසා රාහුල හෙරණුවෝ හිස ඔසවා බැලූ හ. සිංහදත්ත හිස දමා බැලුවේ ය.

"මං අහගෙන හිටියා. මිං දන්නද උන්නාන්සෙගෙ හැටි මිංගොම් නම්යි" සිංහදත්ත කලකිරුණු සිනින් කී ය. "මහණවහන්සේටත් කලින් මං පන්සලට දුවගෙන ඇවිල්ලා ලොකු හාමුදුරුවන්ට මේ සිද්ධිය කිව්වේ උන්නාන්සෙ ආඩම්බරයෙයි කියල හිතාන. හාන්සි පුටුවෙන් නැගිට්ටෙ නෑ. බුලත් කොළ ගගහ මගෙ කතාව අහගෙන ඉඳල වචන දෙක තුනක් සැරෙන් සැරේට කිව්වා. 'මොන ඒකෙකට ගියා ද?' 'පන්සුව්ලෙන් නෑ ඒක හොඳ.' 'සාක්කි දෙන්න වෙවි.' අන්තිමට කිව්වා, 'දන් ඉතිං උසාවි බඩගාපල්ලකො.' කියල"

රාහුල හෙරණුවෝ කෝපි කෝප්පය යළි අතට ගත් හ. එක උගුරක් පානය කළහ. "ප්‍රශ්නයක් ඉෂ්ටවිය යුතු අවස්ථාවේ දී ඉදිරිපත්වීම වරදක් නොවෙයි. ලොකු හාමුදුරුවො හිතන්නෙ උන්වහන්සේට කරදරයක් වෙයි කියල. මගෙ ප්‍රශ්නය උන්වහන්සේටත් කරදරයක් නොකිරීමයි......"

හෙරණුවන් කතාකෙළේ කලකිරීම මුසු හැඟීමෙකැයි සිංහදත්ත සිතුවේ ය.

"හිටා ගණන්ගන්න එපා හාමුදුරුවනේ" සිංහදත්ත කීය. "මං දන්නවා ලොකු හාමුදුරුවො මොන කිවුත් රටේ මිනිස්සු හාමුදුරුවන්ට තවත් පැහැදෙනවා. ඒ මිනිස්සු හාමුදුරුවන්ගේ ගැන ආඩම්බරයෙන් කතාකරනවා අහං ඉන්න මං මහායයි"

සිංහදත්තට පිළිතුරක් නොලැබිණි. තමන් වෙනි උණ්ඩයට මිනුණ ඉරන්නේ දේශපාලනඥයකු මෙන් තමන් ඇති කර



ගන්නවත්, කිසිවෙකුගෙන් කීර්ති ප්‍රශංසාවක් ලබන්නටවත් නොවේ, මිනුෂය ධර්මය උඩයයි උන්වහන්සේ සිතූ හ.

නායක ස්ථවිරයින්ගේ කතාව නිසා රාහුල හෙරණුවන්ට සැබැවින් ම කලකිරීමක් ඇති නොවී ය. උන්වහන්සේ අනුන් ගැන නොව තමන් ගැන සිතති. පණ්ඩිත අනුන් ගැන නොව තමා ගැන සිතන්නට මිනැමි මිනිසෙකුට ශක්තියක් තිබේ.

* * *

රාහුලයන්ගේ සාක්කි සටහන් කරගනු සඳහා පොලීසිය එතැන පැමිණෙනු ඇතැ යි පෝෂාරාම ස්ථවිරයෝ සිතූ හ. පාරේ යන වාහන ගැන උන්වහන්සේ වෙහෙදට වඩා කැළඹිලිමින් වූයේ එහෙයිනි. ඒ අතර යසපාල ගැනත්, යසපාල සේ මිනිස්සු ගැනත් උන් වහන්සේට කල්පනාවී ය.

යසපාල මියගොස් ඇත. මිනීමැරුම් චෝදනාවට පියදස එල්ලුම් ගසට හෝ දිගුකාලීන ව හිරේට හෝ නියමිවනු ඇත. එ විට සමිලාවතී තම දරු දෙදෙනා නිසා යළි ගෙදර පදිංචියට එනු නියත යි. යන්තම් සතහ ඉසම්වා සිටින නායක ස්ථවිරයන්ට ඒ හැලුම් ප්‍රීතිය ගෙන දෙන්නක් විය. කෙසේවූ, සමිලාවතී සම්බන්ධයෙන් උන්වහන්සේ ගේ හිතේ තිබූ "සිළිබිඳ සිත" මේ අවස්ථාවේ උත්සන්න ලෙස මතුවීම යි.

සමිලාවතී, යසපාල සමඟ දිග ආ දිනය, අද වගේ මෙන් පෝෂාරාම ස්ථවිරයන්ට මතක ය. එද පාලම් කඩේ වතුර පාරට දමන්ට තරම් සදින් වැයි අද වැටුණු දිනයකි.

WWW.SINHALAELIBRARY.COM 39

උදේනියන්ගේ සාමාවතී නියමාකාරයෙන් ද්‍රවිඩ මිතුරට සාමියාට පමණ පසු විහාර මලුවේ දී ය. සාමාවතී අද සිරියේ රජු මිස් මිස් කියන පුදු විත්තයකි. සාමාවතී පිළිබඳ මතක අලුත් කරගනිමින් හාන්සි පුටුවේ ඇල වී සිටින නායක ස්ථවිරයින් අසලින් කොස් ඇට මීයෙකු කටින් ගත් බැලලිය දිව ගියා ය. කොස් ඇට මීයා ගේ හිස තිබුණේ බැලලිය ගේ කට ඇතුළේ හෙයින් උගේ අනුකම්පා කිරීම් තේරුමක් නැතැයි සිතූ ස්ථවිරයෝ සාමාවතී ගැන ම සිතූහ.

දිවි හිමියෙන් ස්ත්‍රී සමාගමය අත්දකිමින් නැති ව සිටි ඝෝෂිතාරාම ස්ථවිරයින්, ඒ අත්දැකීම සාමාවතීගෙන් ලබාගන්ට නැමුණත්තෙන් සිටියත්, ඒ දුෂ්කර ගත නොහැකි වූයේ සවර් ගෙහාහුරේකු හෝ හැමදෑම මැද්දට පැන්න නිසා ය. සාමාවතී, ළමයා ගෙදර දමා මහ දවාලේ විහාරයට අවුත් විහාර ගෙයි මකුළු දැල් කැඩුවෙන්, තවත් වරක් කවු කැළවලට දමන්නට යයි කියා පරණ විහාර ගෙයි වවුල් ගෙවී එක්කාසු කොළේ හාමුදුරුවන් ගේ ආසාව ඉටුකිරීමට වුවත්, ඒ හැම වේලාවක ම කවුරුන් හෝ විහාරයට පැමිණියේ ය. මුල් දිනවල සාමාවතීට දේශනා කළ පුද්ගලික බණ මිහෙන්මිනෙන් පිනාවත් ද, ඒ සමඟ ම මද ලජ්ජාවත් ද ඇතිවෙමින් ඝෝෂිතාරාම ස්ථවිරයෝ හිස් ගෙඩිය දැකින් ම දුටහ. මුල් ම සිද්ධිය සිද්ධ වූයේ විහාර ගෙයි බුදු හාමුදුරුවන් ඉදිරියේ දී ම ය.

සාමාවතී බුදුහාමුදුරුවන්ට මල් පුදා උත්වීගෙන්ගේ ඉදිරියේ පසඟ පිහිටුවා වඳිමින් සිටියා ය. ඇය පිටුපසින් සිටි ඝෝෂිතාරාම ස්ථවිරයන්ට බිරියක් මෙන් උඩට නිතු වූ ඇගේ උකුල් පෙදෙස දක්ක විස්සුම් නැතිවී ය. විහාර ගෙයි හෝ අවට කිසිවෙකුත් නැති බව දන්නා ස්ථවිර තෙමේ, සිතට ගෙවීම



උදෙව්වා පිටුපසින් කොස් ඇගේ සත මඬල හසුවන සේ තිසවා දැඩි ලෙස ග්‍රහණය කොට අද වරක් සිතන්නේ ය. බලාපොරොත්තු නොවූ සිද්ධියෙන් තළුම්ට විස්මිතයවත්, අද වුනු ව කියවත් පත් සාමාවතී ග්‍රහණයෙන් මිදී, උඩුකට පැන හිස හිලා ගත්තා ය. අනතුරුව වටපිට බලන්නාවත්, සිටගෙන සිටින්නාවත් වාරු නැත්තියක මෙන් හුන් තැන ම හිඳ හිඳ විහාර මලුවට ගණ උකුල්ලන්නට වූවා ය. තමන් මුදුනට සාමාවතී තමන් යටත කැඳවාගැනීමට ඝෝෂිතාරාම ස්ථවිරයන්ට වුවමනා වුවත් ඇය තමන් දෙස නොබලා හිමින් බලා සිටි හෙයින් අවධානයේ තමන් සොඳ ඉහට යා යුතු යයි සිතා උත්වීගෙන්ගේ එහි ගියෝය. එදා තමන්ට පලුමිතාකාර ආත්ම ශක්තියක් තිබූ බව ඝෝෂිතාරාම ස්ථවිරයන්ට මතක ය.

ඝෝෂිතාරාමගෙන් වර පුහුදුන් මිනිසුන්ට බුදුරජාණන් වහන්සේ අනුකම්පා කළා මිස දඬුවම් නුදුන් හෙයින්, තමන් ගැන ද උත්වීගෙන්ගේ අනුකම්පා කරනු ඇතැයි ඝෝෂිතාරාම ස්ථවිරයෝ සිතූ සිතති.

"සාමාවතී බයවුණා ද?"

"හාමුදුරුවන්ට පව් නැද්ද? මටත් පව්. හාමුදුරුවෝ බුදුහාමුදුරුවෝ ඉස්සරහ යස වැරදින කෙළේ!"

"සාමාවතීට පිස්සු"

"මට නෙමෙයි පිස්සු – හාමුදුරුවන්ට!"

"මට පිස්සු හැදෙන සාමාවතී උන්නු ඉරියව්වට තොපා!"

"එහෙම නෝන්නම් බුදුහාමුදුරුවන්ට වඳින්නෙ. මවවර බණ කියනතන් හාමුදුරුවෝ අනාගතයෙන්නා හඳනාවා! එකට මටත්

කවුල්කරගන්න හදනවා!"

සෝභාරාම ස්ථවිරයින්ගේ සාමිකාවට ගෞරවයකට යටපත් ව ලජ්ජාව මතුවී ය. එහෙත් පසුබට නොවිය යුතු යයි කල්පනා කළ උන්වහන්සේ, මඟ ඛණ්ඩවලින් ම සිඳිය යුතු යයි සිතූ හ.

"සාමලාවතී විනය පිටකය කියවලා තියෙනවා ද?"

"ඒක තියෙන්නෙ අපිට නෙමෙයි, හාමුදුරුවනේට"

සාමා නිම නිඳ ගෙන සිටිය දී හාමුදුරුවන් තමා ළඟ සිටගෙන සිටීම හොඳ නැතැ යි සිතූ සාමලාවතී, නැගිට අහස දෙස බලාගෙන ගොස් පරණ විහාරගෙයි බිත්තියක් අල්ලාගත්තා ය.

සාමලාවතී ගෙදර තුළුවා විහාර භූමිය වටේ හැරකැවෙන්නේ ඇය තමාට කැමති නිසා බවත්, ඇය ඔය වී සිටින්නේ පටිට මිස තමන්ට නොවන බවත් සෝභාරාම ස්ථවිරයින්ට සක්සුදක් සේ පැහැදිලිවී ය. උන්වහන්සේ යළි සාන්ද ළඟට සමීපවූහ.

ඈත්පල් වන්නේ දිගෙලිකාර ගුත් ගරුකුන් දෙදෙනා ලියාගෙන අඹරයියා පල්ලම බහී. එළු වැඹෙන කාලය හෙයින් බල්ලෝ භාර පැත්තේ පොරකති. දෙදෙනෙක් පොරකදී, පොඩි බල්ලෝ බැල්ලිය පසුපස දුවති. මේ බලු කිද්දිය තමන්ගේ සිද්ධියට ගොයගොමකම සම්බන්ධකර සිතන්නට ස්ථවිර නමගේ කල්පනා නොකෙළේ ය.

"සාමලාවතී බයවුණොට බයවෙන්න දෙයක් නැ. සාමලාවතී කැමති නම් ඒක තමයි හාමුදුරු නොගොනකුට දෙන්න පුළුවන් උතුම්ම දානය! ඒව වැඩිය උත්තරීතර දානයක් තවත් නැතැ කියල



විනය පිටකයෙ තියෙනවා"

සාමලාවතී ඇස් දෙක ම උඩ යවා ස්ථවිරයින් දෙස බැලුවා ය. ඉන් වැනි මඟක් ඇය කවදාවත් අසා නැත.

"ඇයි කියාගන්න බැරි ද?" සෝභාරාම ස්ථවිරයන් තව දුරටත් කතාකරන්නට වන්න. "සුපාමිත්තන ගෙළෙන්ගෙනකුට මේ සසාරේ උන්නාම ඒක පරලොව සැප සම්පත් උණින්න තරම් පිනක් නම්, මිනිසුන් උන්නාන්සෙ නොගොනකුට මේ දානය උන්නාම සවිතියාවට දිව්‍යාංගනාවන් වෙන්න තරම් උතුම් කුසල කර්මයක්. ඒක තමයි සාන්නාවකට දෙන්න පුළුවන් උතුම්ම දානය. හැබැයි සාමලාවතී මෙ නැතිනත්ත තියෙන්න ඕනැ"

අද තමින් ඒ බොරු ඒක කිවේ කෙසේ ද යි සෝභාරාම ස්ථවිරයන්ට අනුත් පුදුමයකි. බුදුහාමුදුරුවන්ගේ කාලයේ සිටි ඇති වැනි කාමුක පැවිද්දන් තරුණ උපාසිකාවන්ට මේ විදියට "බණ" දේශනා කර ඇති බව උන් වහන්සේ විනය පිටකයෙන් කියවා තිබිණි.

සාමලාවතී එද හාමුදුරුවන් මෙ නිම කියේට කිය ම පිළි නොගත්තත්, ඇයට උන්වහන්සේ ගැන දුකක් ඇතිවි ය. පැමියකු ද සිටින තමාගේ රාගයාට නොතිබෙන ශිල්පයක් ලෙසින් ඇවිලෙන කළ, කිවුර දරා සිටින මේ සවිකලෑති භික්ෂුවයාට එය කෙසේ පවසිනු ඇද්ද යි ඕ කල්පනා කළා ය. බිඳුම් වියැගත්තේ මේ බර හා වේදනාව උන්වහන්සේ දරාගෙන ඉන්නා ඉලුම් වි ය!

"හාමුදුරුවනේට පව් නැත්නම් මට මොකද?"

සෝභාරාම ස්ථවිරයින්ට ඒ වචන ඒක ජීවිතයට ම අමතක නොවෙයි. ඇය වචන ටික කීවේ කට කොණකින් සිනාසෙමිනි.

WWW.SINHALAELIBRARY.COM 41

එද කමලාවතී දනය පිළිගන්වන්න පුදනාම වෙද්දී, ඇගේ මලයා කොහෙක් ඇය සොයාගෙන විහාර මළුවට අවුත් "අක්කේ......." යනුවෙන් කැඟසන්නට වූයේ ය.

කමින්ට වැරදුනේ ඒ දවස්වල ය. මේ ද ආවාස් වරදින්න විදියක් නැතැ යි සෝමාරාම ස්ථවිරයෝ සිතති. හේතුව, විහාරයෙන් ආරාමයෙන් කමින් ගේ අණයක පවත්නා හෙයිනි.

කොයි ආකාරයකින් හෝ ස්ත්‍රී සම්බන්ධතා ඇපුරක් නොසිතීම තමින් ගේ සිල්වත්කමේ ලක්ෂණයක් හා ශක්තියක් බව යළි සිහිපත් කළ ස්ථවිරයෝ හැම්දේ ම වන්නේ හොඳට යයි සිතූහ.

* * *

කමලාවතී දෙ දුන් දිනක් ඇතුළත තමින් හමුවට පැමිණෙතැ යි නායක ස්ථවිරයින් කල්පනා කළත්, පොලීසිය පැමිණෙන්නට ප්‍රථම මධ්‍යම රාත්‍රියේ ම පන්සලට පැමිණියා ය. පොලීසියේ පැමිණීම බලාපොරොත්තුවෙන් කොහිද සිටි ලොකු හාමුදුරුවන් ළඟට පසුළු ඒ පැමිණියේ ඩිංඥප්පු ය.

"ලොකු හාමුදුරුවනේ, අර ගැනි ඇවිල්ලා. අර මරාපු යසපාල බාස් උන්නැහැගෙ ගැනි"

"කාගිවම ද ඇවිත් ඉන්නෙ?"

"එකී කිව්වා නම් එයාම තමයි. මිනිමරුවන් එන්න ඇවිදින් ලං මග නතරවෙලා මේ ගැනි විහරක් පන්සලට එන්න ඇති.



තමන්ගෙ මිනිහගෙ මිණියවත්, තමන්ගෙ දමයින්ගෙ මිණියවත් නොබලා මේ ගැනි කැලෑ පාරෙන් පන්සලට මේ මග ඒ ඇවිත් තියෙන්නෙ. මං හිතන විදියට පොඩි හාමුදුරුවන්ට කාරණය දෙන්න එපැයි කියන්න වෙන්න ඇති. මන්න එකියි හාමුදුරුවනේ එල්ලුම් ගස යවන්න හිතෑ! ඕකි තමයි මේ ඔක්කොටම මුල!"

"දැන් කෑ ගොහන ගිරිපත් ඩිංඥප්පු"

මාය ගණනකින් තුටට කමලාවතී දන බලාගැනීමේ ආශාවෙන් ස්ථවිරයින්ට ඇහිම ය. කෙසේ වෙතත්, සිතා මුහුණේ ප්‍රදර්ශනය නොකොට ගාම්භීර මුහුණින් යුතුව බිම බලාගෙන නාසයි පුටුව ළඟට ගිය සෝමාරාම ස්ථවිරයෝ තමන් ඉදිරියේ වැටී මග සඬින් හඬන්නවුන් ස්ත්‍රිය දෙස කෙළින් බැලූහ.

"කොහෙඩා ආපු කාරණය කිව්ව නම්........"

කළුකින් පෙනියිය මුහුණ සිඹමින්නි පොලවට කිබාගෙන හැඩි ගැහැනිය සිය මදක් ඔසවා ඉකිගසන්නට වූවා ය.

"කමලාවතී හඬන්නෙ කා වෙනුවෙන් ද? බාස් උන්නැහැ වෙනුවෙන් ද, හැත්තෑම දුන් ඉන්න පුරුෂයා වෙනුවෙන් ද?"

"ඒ දෙන්නයි දරු පැටවුන් දෙන්නයි වෙනුවෙන් හාමුදුරුවනේ....."

කමලාවතී ගේ තතාව අසා නායක ස්ථවිරයින්ට වඩා ප්‍රදර්ශ බිමේ සිංඥප්පු ය. කමලාවතී ගේ දෑසින් තවමත් කඳුළු බේරේ, ඒ හිස ඔසවා වටපිට බැලුවා ය, බලා ඉතා සෙමින් කතාකළා ය.

www.sinhalaelibrary.com

"මේ මිනිහත් එක්ක ගිය ද අඳුර මං සිහිං වින්ද දුක් සාන්දරාට දෙයි හාමුදුරුවනේ විසරයි දන්නෙ. කන්න උයන කොටත්, කන්න යන්න කොටත්, මගෙ දරු පැටව් දෙන්න මට මතක් වෙනවා"

"ඇයි සාමිලාවතී උඹ එහෙනම් ඒ මිනිහත් එක්ක තවමත් ඉන්නෙ?"

"කරුමෙ, මගෙ කරුමෙ හාමුදුරුවනේ" සාමිලාවතී මිදුල දෙස බලා යළි සිංසෙප්පු දෙස බැලුවා ය. සිංසෙප්පු සිටින නිසා කිවයුතු දෑ කෙළින් කිව නොහැකි වූ ඇගී වෙව මී ඒ බැල්මෙන් භාෂාව ස්ථවිරයිනට හැඟවූවා ය.

"සිංසෙප්පු උඹ පැත්තකට පලයන්. උඹ උඹේ නිදි ගන්න තැනට පලයන්"

සිංසෙප්පු කුඩි කුටි ගා කනියම කියවමින් ගියේ ය.

ඊස් රථයක් පන්සල පසුකොට ගොස් යසපාල ගේ ගේ කඩ නවත්වනවා සිංසෙප්පුට ඇසිණි. ඒ සුවිත පොඩි හාමුදුරුවන්ට දනුම් දී පොහුරු ව එහි ගොස් බැලීමට ගේ අදහස් කරයි.

"සාමිලාවතී, උඹ දන් ආවේ කා එක්ක ද?"

"මියදසත් එක්ක. ඒ මිනිහ පන්සලේ පාත නිදි ගෙ හැවිකිලා මට එන්න කිව්වා" සාමිලාවතී කතා කරන්නේ දුකා පෙමිනි. ඇයේ මුහුණේ කඳුළු දන් නැත.

"......ඊයා යන්නා යවිසයන් ගෙදර හිකිල්ලා, මගෙ කොස් වල්පලෙන් අල්ලාන මට කිව්වා. අන්න කොයගේ මිනිහාට මම වැඩේ දන්නා. ඇයි කෝ කොට්ටවරවානම් කඳුළු පෙරන්නෙ උඹ සින්දෙන කියල. මට තුපේ අල්ලන්න බැරිව වගෙ කියා. ඒ



ගෙ විටව ගැහුවා. මං ඇහුවා උඹයි දෙන්න ගැන. උන් මැරුණෙව නෑ, මරන්න ඕනෑ කාලකණ්ණියා මැරුණ කිව්වා. ඊට පස්සෙ මාව එළියට දල උඹේ දොර වැහුවා. මං පස්සෙත් එර කියල හැලු පායරත් ආවා, මං හිතුවා මගෙ මිනිහ පෙන්වන්න එක්කාපු සරනෙන එනව කියල. පන්සලේ වින්න බිදුණොත් මං අපේ වින්න දිනාට උවින්න කාලකෝට උං ආයිත් මගෙ කොස් වල්පලෙන් අල්ලාගන්නා. 'උඹෙ මොනාව බලන්න ද?' උං මැරිලා, කෝ මං එක්කාපු සරනෙන පාව උඹව පෙන්නනන්න කොහෙයිඩ. දන් ගෝ පල පන්සලට. පොඩි හාමුදුරුවො මාවත් දන්නා. උනුත් උඹෙත් දන්නා. කෝ ලොකු හාමුදුරුවන්ට කියාපිය පොඩි හාමුදුරුවන්ට පාත්කි දෙන්න එපායි කියන්න කියලා' මට මකෝ කියල උං ඊට පස්සෙ සල්ලම් බැහැළ හාවුලිය දීයත් ඇවිත් නිදි ගෙ හැවිකිලා මාව එව්වා"

"සිංසෙප්පු කියන්නාත් වගෙ මේ මිත්තකාරම මුළ උඹයි සාමිලාවතී. ඒ මිනිහ මිරිදයෙහෙත් වගෙ දනගන්නකම් උඹට මිනුමෙන් කෙදර එන්න. ඇයි උඹ ඒ මිරිසනා ළඟ හැවිකුණෙ?"

"මිය මිළ යි කියන මගෙ මිනිහා දිවිය ලොකු උත්පාදකවෙන්න ඕනෑ හාමුදුරුවනේ. මට ඒ මිනිහ හොඳ වැඩිවුණා. ඒ මිනිහ මට ගිය පිටින් පාරක් ගහල නෑ. බැණල නෑ. මේ මිනිහා එහෙම නෑ. මට ගහනවා. බණිනවා. ඒ මිත්තකාරම කරල මං මිනිහාට උස්සගෙන ගිහිං බාගෙට මරාපු මියෙක් එක්ක බිලලෙත් සෙල්ලම් කරන්න වගෙ හරි සන්තෝෂයෙන් මාව තියලෙනවා........"

සාමිලාවතී පසුව කී අදහස් සෝමාරාම ස්ථවිරයිනට තේරුම් අවබෝධ නොවී ය.

"සාමිලාවතී ආපු කාරණය කිව්ව නම්...... පොඩි හාමුදුරුවන්ට

WWW.SINHALAELIBRARY.COM 43

සාක්ෂි කියන්න එපැයි කියල කියන්නවත්ද ආවේ? එහෙමු නැත්නම් දුටු හැටියට සාක්ෂිය කියන්න කියල ද කියන්නෙ?"

සියදස අසලක සැන්දිගෙන සිටින් දැයි කමලාවතී යළිත් අසා බැලුවා ය.

"ඔබ වහන්සේට මනාපයක් කරන්න. මං ආවෙ ඒ ඕනිය ඇදගෙන ආපු නිසා"

නායක ස්ථවිරයෝ කමලාවතී දෙස ප්‍රසාදකාරී ව බැලූ හ. ඇගේ දෑසේ කඳුළු පිරී ඇතත්, මුහුණ සවිමත් බියෙන් හා සන්තෝෂයෙන් බැබලී ඇත.

වාහනයක එළිය එක්වර ම පන්සලට වැදිණි. විදුලි අඩියෙන් හා එළිය දුටු ස්ථවිරයෝ කලබලයට පත් වූහ. උන්වහන්සේ ගේ ඉල්ලීම අනුව කමලාවතී පන්සල ඇතුළට ඇදුනා ය. නායක හාමුදුරුවන් ගේ සාමිරයට වැද දෙර අඩවන් කරමින් ම දෙර ළඟම හිඳ සිදගත්තා ය. ඇගේ නාසයට සඳු සුවඳක් දැනෙයි. කලකට පෙර විහාර ගේ ඇතුළේ දී ද ඇගේ නාසයට ඇතුල්වූයේ මේ සඳු සුවඳම ය. කමලාවතීට ඒ ගැන කල්පනා කරන්නට වෙලා වෙලාව නොවේ. සාලය ඉදිරි ඉදිරියට යන රාහුල කෝරළුවන් ගේ ඡායාව දැයේ පෙනිණි.

* * *

කමින් ඇස දුටු දේ හා තමන් මුහුණ පෑ සිද්ධිය රාහුල කෝරළුවෝ පොලීසියට හෙළිකළෝ සිත. සියදස ගේ නම ද කියැවිණි. සියදස කමලාවතී ගේ අනියම් සැමියා බව ද රාහුල



කෝරළුවෝ දනිති. සාහසිකයින් රාහුල කෝරළුවන්ට කෙටියක් පොකා ගැස්සුව ද, එක වෙඩිල්ලක් හෝ පත්තු නොවීම පිළිබඳ පුවත පොලීසියට ඒ තරම් වැදගත් නො වී ය. ඔවුන්ට වැදගත් වූයේ යසපාල මරන්නට පොලු එසවූවෝ කවරහු ද යන්නයි. ගෙදර සිටි ළමයින් දෙදෙනා ද ඒ දුක නැත. ළමයින් දෙදෙනා කියා සිටියේ ගේ ඇතුළේ සිටි සිය පියා දෙතුන් දෙනෙකු විසින් මිදුලට ඇදගෙන ගිය බවත්, පොල්ලක් අතින් ගත් මිනිසෙක් තමන් දෙදෙනා බියගන්වමින් රැක සිටි බවත් ය.

රාහුල කෝරළුවන් ගේ සාක්ෂිය අවසානයේ දී කිසිවෙකුත් බලාපොරොත්තු නුවූ පරිදි සිංහදත්ත උප පොලිස් පරීක්ෂකයා වෙතට ගියේ ය.

"මම ගල්ලම හංසාකන්නිලාගේ සිංහදත්ත. මම මේ පන්සලේ දුප්පත් නායකට කිව්වා කාලයක් හිටපු ඉන්නවා" සිංහදත්ත කීයේ ය.

උප පොලිස් පරීක්ෂකවරයා සිංහදත්ත ගේ හිස සිට දෙපා දක්වා බලා කොල් කරකර සිතාදුරුණේ ය.

"මේ මිනීමැරුම සිද්ධවෙනකොට තමා කොහේ ද හිටියෙ?"

"හිටියෙ කමිරල පළුවෙ?"

"කමිරල පළුවෙ! කොහේ කමිරල පළුවෙ ද?"

"කොහෙවත් නෙමෙයි. යසපාල මාස්ටර්හාමුගෙ ගේ ගාව තියෙන වල් කමිරල පළුවෙ!"

"තමා එතැන මොකක් ද කෙළේ?"

"මොකක් කළාවත් නෙමෙයි මහත්තයො, ළමයි කෑගහනවයි ඇහිලා බුරනවයි ඇහුනාම මං ගියා මොකදැයි බලන්න. අර

WWW.SINHALAELIBRARY.COM 44

පොඩිපාදයෝ බණිනවා. කුණුහරුප කියනවා. යසපාල සිංහයෙක්වු වෙනවා. එක ජර්මණ්......"

උප පොලිස් පරීක්ෂකවරයාට සතුටක් ඇතිවිය. කිසිවකු ගේ කියෝරියක් නොමැති ව සිංඥප්පු ඉදිරියට ආ විට ඔහු සිතාගත්තේ සිංඥප්පු නාන්දෙඩවන්නකු වශයෙනි. එහෙත් රාහුල හාමුදුරුවන් ගේ සාක්ෂියටත් වඩා මොහු ගේ සාක්ෂිය වැදගත් විය හැකි බව පසු ව ඔහුට අවබෝධවී ය.

"බොහොම හොඳයි. බොහොම හොඳයි. තමුසෙට ස්තුති කරන්න ඕනැ හොඳ පිරිමියෙක් විදිහ ඉදිරිපත් වුණාට. මුල ඉඳලාම ආයිත් කියන්න. මට සටහන් කරගන්න ඕන"

"කියන්නම් මහත්තයෝ ඇත්ත සිද්ධිය ඒ විදියට ම කියන්නම්. මේ අපරාදෙ සිද්දකළු එවුනට නෙණ හත යන්න ඕනැ. යසපාල ඔයස් උන්නැහැ විතර අහිංසක මිනුස්සයෙක් මේ අසල්වාසියක හිටියෙ නෑ. හැනි හොරෙන් පරාඹියා එදිරාට පියදසයා මේ මිනිහත් මැරුවා! මේ කිස්සොටම මුල මේ ගෑනි......"

උප පොලිස් පරීක්ෂකවරයා සිංඥප්පු විස්තරවන විට ඔහු පිටිසේ වෙඩිලන කරම් සොයයෙනි. තත්පර දෙකක් පමණ බියාගෙන සිටි සේ යළිත් කතාකරන්නට විය. "මෙය අඹුවක් ගෑනියෙක් නමයි. ඒ වුණත් ඇත්ත කියන්න ඕනැ. හැම අපරාදෙකට ම මුල ගෑනු. මේ අපරාදෙටත් මුල යසපාලයාගේ ගෑනි"

සිංඥප්පු කතාකළෙල් උප් හඩිනි ඒ හඬ නායක ස්ථවිරයන්ගේ කාමරය තුළ ලෙ සිටි ඇඟ සිටින කමලාවතීට ඇසා ඇඟිදිද් ව ඇසිණි. ඇය සිඩුපියේ නමා කන්සල ඇතුළේ සිටින බව



සිංඥප්පු පොලීසියට කියතැයි සිතා ය.

සිංඥප්පු ගේ උස් හඬ ඇසී නින්දිට නාන්දරාම ද අවදිවී ය. ඉදිරියට අඩුත් සිප්පුරු පොටින් හිස වසාගෙන මොහොතක් ගත සඟ ගේ නින්දම වඩාත් උනුම්සකාට පලකා නින්දට ගියේ ය.

* * *

සිංඥප්පු පැන ව සිටි හබරල ගාල හා මිහු එකී සිට ඇඳුරු දක පිලාගැනීමට පොලීසියට අවශ්‍ය වූ හෙයින් පොලීසිය ඔහු යසපාල ගේ ගෙදරට යාමට සිංඥප්පුට සිදුවී ය. පොලීසිය ගියමකිය පසු පන්සල හොඳට ම නිහඬවී ය. ඉදිරි දැඩ වියා ද රාහුල පෙරණුවෝ නායක ස්ථවිරයන්ට වැඳ නමස්කාරකොට නින්දට ගියහ. කමලාවතී පිළිබඳ කිසිදු කුතුහලයක් උන්වහන්සේට නොවී ය. එහෙත් නායක ස්ථවිරයන්ට නිදිමත නැතිවූයේ කමලාවතී නිසා ය. ඇය තම කාමරයේ ම වෙසෙන බව උන්වහන්සේ දනිතත් කරන්නට දෙයක් නැත. 'ඒ ඇත්තියෙ ඔබේ ගින්දර කියෙද්දි මං ඒ ගැන සිතා වගක් හොඳ නිදි. අද ඔහොම ගියාවේ. නින්ද ගිහිං නැත්නම් හැගිවිල එන්නෙ නැතැයි. මිනිහ මලා. දන් ඉන්න මිනිහ පොලීසියෙන් අල්ලාගෙන යාවී. හිරේ වැටේවි. මං හිතන්නෙ කමලාවතී ආයිත් මෙහෙ පදිංචියට එවි. එතකොට මොකක්හරි බලනවා ඇරෙන්න දන් ඒ වගක් අහවන්න නැතැයි"

කමලාවතී නැගිට ඉතා සෙමින් සාලයට අවුත් කර පොඩා බැලුවා ය. නායක ස්ථවිරයෝ හාන්සි පුටුවේ ඇල වී දෑස්

පියාගෙන සිටිති. ඉරියව් අනුව උන්වහන්සේට නින්ද ගොස් ඇතැ යි සමිලාවති සිතුවා ය. ඉදිරි දොර වසා ඇත. දොර ඇරගෙන අනවසරයෙන් පන්සලෙන් පිට ව යාම හොඳ නැත.

ශබ්ද නගා කකුල් බිම අතුල්ලාගෙන නායක හාමුදුරුවන් ඉදිරියට ගිය ස්ත්‍රිය උන්වහන්සේ ඉදිරියේ කතා කළා ය.

"හාමුදුරුවනේ......"

නිද නොසිටි තෙරණුවෝ ඇය දෙස බැලූහ. "යන්න ද?"

"එහෙමයි. මම පන්සල ඇතුළෙ ඉන්න එක හොඳ නැ, ගියත් හිමිනාවා එළියට යන්න. ඒ වුණත් යන්න කියලයි හැගිච්චෙ. මගෙ මැරිච්ච මනුස්සයා බලන්නත් ඕනැ. අර මිනිහ මං එකෙසල් දන්තුරු කනවා ඇති......"

"පිංඇත්තු එක්කොරාගෙන පොලිසිය ආයින් වරක් ඒ පැත්තට ගියා. පොලිසිය එතැන නිසාවෙන් එක පාරට යන එක හොඳ ද කියල කල්පනා කරල බලන්න වෙච්ච"

"මං එහෙනම් ටිකක් ඇතින් ඉඳල පොලිසිය ගියාට පස්සෙ යන්නම් හාමුදුරුවනේ"

ඇනුම්ක් දෙර නිසඬ වූවා මිස, නායක ස්ථවිරයන්ගෙන් උත්තරයක් නොලැබිණි.

දණ ගසා ස්ථවිරයින්ට වැඳ නැගිටි සමිලාවති මිදුල් පස්සෙන් පස්සට ගමන්කොට දොර ඇරගෙන නොපෙනී ගියා ය. ඇය ගමන්කොළේ එක මිදුල අසාට බව අඩි ශබ්දය ඇදීගෙන ආකාරයෙන් තේරුම්ගත හැකිවී ය.

නංගී බුදුවේ ලුහින බැල්ල බුරයි. නාහ මිදෙ ගහ තරමක විට්ට ...



විනාඩි හත අටක් පොලිසිය නාන මිදෙ ළඟ කුමක් කෙළේ ද යි නායක ස්ථවිරයින්ට සිතාගත නොහැකි විය.

පුළුම්පන් ඇඳුම්පන් පිට කළ ස්ථවිරයෝ පුටුවෙන් නැගිට දොරලුව ලා සාලයේ විදුලි පහන ද නිවාදමා කාමරයට ගොස් බැල්ලේ සමිලාවති ගෙග ඇත්තේ නොහැකි ද කියා ය. දොර ළඟ බිම කකුලට පැගුණු ලේ පැල්ලම් ... විය. ස්ථවිරයන්ගේ ඉදිරි හැගීම් ... ලේ පැල්ලම් ප්‍රමාණවත් විය. ලේ පැල්ලමේ සිට අඩියක් තරම් ඈත ලේ තිබ ... ඇඟිල්ලක් තරම් ... කුඩැල්ලෙක් පෙරළෙමින් සිටියේ ය. ... කුඩැල්ලා නිසා ස්ථවිරයින්ට කද පිළිකුලක් ඇතිවී ය.

... ස්ථවිරයෝ කවදත් කුඩැල්ලන්ට බියක් දක්වති. ... උන්වහන්සේට ඇතිවූයේ කද පිළිකුලකි. කුඩැල්ලා ... එළියට දමන්නටත් බැරි ය. ... කාමරයේ සිටිය දී නිද ගන්නටත් බැරි ය.

ස්ථවිරයෝ චන්ද්‍රරාම තෙරණුවන් ගේ කාමරයට ඇදීගොස් උන්වහන්සේ ගේ ඇඟ අත ගසා කැගැ හ. "චන්ද්‍රරාම නැගිටිනවා, නැගිටිනවා චන්ද්‍රරාම"

නැගිට ඇවි පිනියෙන් වටපිට බැලූ චන්ද්‍රරාම, නායක ස්ථවිරයන් ගේ බියපත් මුහුණ හඳුනා ගෙනම ද බිය පත්වී ය. "හොරෙක් ද ගොරෙක් ද හාමුදුරුවනේ?"

"කුඩැල්ලෙක්"

"කුඩැල්ලෙක්?"

"කුඩැල්ලෙක් නොවෙන්නම්....... ඇඟිල්ලක් විතර මහත

ඇති. ඔබෙ සාමිරය පුරා ලේ"

චන්ද්‍රරාම් සමිඳුන්ගේ සාමිරයට හැඳුවාගෙන යන සෝමාරාම ස්ථවිරයෝ මෙසේ ද කියති.

"අර ගෑනු කෙනා පොලිසියට ගිහින් වැදිල උන්නෙ ඔයගෙ සාමිරයට නොවැ...... මදයි අනුකම්පාකොළා. මේ ගෑනි කුඩැල්ලො එල්ලාගෙන නොවැ ඇවිත් තියෙන්නෙ......"

කුඩැල්ලා හිස උස්සා යළි හිස බිම ගසා ලේ පිරුණු පස්සා පැත්ත උස්සයි. පස්ස බර නිසා පෙරළෙයි. චන්ද්‍රරාමට හිනාගියේ ය. ඔහු කුඩැල්ලන්ට බිය නැත.

"මරන්න නම් එපා. කොහොමද මූ අල්ලන්නෙ?"

කුඩැල්ලා අල්ලන ක්‍රමය නායක හාමුදුරුවන්ට බරපතල ප්‍රශ්නයක් වුවත් චන්ද්‍රරාමට එය ඉතා පහසු කාර්යයක් විය. පත් කඩදාසියක් බිම තබා තවත් කඩදාසි කෑල්ලක් ගෙන තබාගෙන එයින් කුඩැල්ලා පත් කඩදාසියට දැමීමට ඔහුට තත්පර දෙක තුනකට වඩා ගත නොවී ය.

"දැන් ඉතිං ඔය පත මිදුලෙන් ඈතට ගිහින් දාන්න ඕනැ. ගිහිං දිය ඇවිදින් මේ තියෙන ලේ පැල්ලම් පිහදාන්නත් ඕනැ. තේරුණා ද චන්ද්‍රරාම?"

චන්ද්‍රරාම් කුඩැල්ලා කඩදාසි කොළයේ ගුලිකරගෙන පිටුපස දොර ඇරගෙන ගොස් දාසුපු එත පොරට්ටාරයේ, නායක ස්ථවිරයෝ කාමරාමිනී උගේ නුත් කැන තවත් හොඳට විපරම් කර බැලූහ. 'ලේ පැල්ලම් ඇරෙන්න ඇතැට කෝහ වෙන වරදක් නම් නැ. ඒ වුණාට තවී ප්‍රාර්ථනා ඉන්න ඇති. කඩී බිම වැටිල ඇති. කිහිල ලිලවාහත් ගෑනු කියාපුවාම මොන තරම් පිළිකුල්



ජාතියක් ද? අර ඔං කල්පනාකර බලල ගෑන්සි සුදුපටම උන්නු නිසාවෙන් හොඳට ගියා. බැරි වෙලාවත් ඒ ගෑනු කෙනා සාමිරයේ ඉන්දිදි මාත් කරපුවන් සාමිරයට යෑම් නම්........ එහෙනම් මට කුඩැල්ලා පේන්නෙ නෑ නොවැ. ඒ කුරියක් හිතනද එහෙම එන්න ඕනෑයි කියල......'

ඔහු ඒ කල්පනා කෙළවර සමිඳුන් නොව, කල දැනට ද කච්චන හොඳ යයි සිතා සෝමාරාම ස්ථවිරයෝ යහනට පැන්නු හ.

WWW.SINHALAELIBRARY.COM 47

# 6

පියදස ගේ මළ ගෙදරට පැමිණි බොහෝ දෙනා තමන් දෙස මහත් ගෞරවයෙන් බැලූ බව රාහුල තෙරණුවෝ දුටිහ. ඒ අතරේ උගත් වැදගත් කිසිය දෙනෙක් සෙසු භික්ෂූන්ගෙන් තමන් වෙන්කොට ගෞරව පූර්වක ව කෙටි පිළිසඳරේ ද සතුටු හ. එහෙත් ආගමික විනාවන් සඳහා රැඳී වැඩසිටි භික්ෂූන් ගෙන් කිසිවෙක් තමන් හෙත් කිසිවක් නොවිමසූවා පමණක් නොව, ප්‍රියමනාප බැල්මක් නොහෙළූ බව උන්වහන්සේට පිහිටන් වෙයි. ඔවුන් සහත් අදහස් ඇති හිස් මිනිසුන්, යි යන හැඟීමක් ද, ඒ හැඟීම නිසා තමන් ඔවුන් ද නොතකා පසුවිය යුතු ය යන සිතිවිල්ලක් ද උන්වහන්සේ ගේ සිතේ පැදිණි.

අවමංගල උත්සවයේ කටයුතු අවසන් වූ විගස ම ඉක්මන් බවක් අහවා, සෙසු භික්ෂූන්ගෙන් වෙන් ව පන්සල් විස්ස තරණ ආවාස ගෙට පැමිණි රාහුල තෙරණුවෝ අදනය පසෙක ඒ යහන මත වැතිරුණහ ය. දොර හැර ද සලුවීම ද ප්‍රිය නොකළ උන්වහන්සේ හැකිට දොර වසා යළි යහනට විත් හ. ඒ

කල්‍යාණවත් ම සතුටු වූ තෙරණුවෝ තමන් පසුවන දුර්විපාක ගැන තමන්ට ම ප්‍රසාදයක් තුටු කොයින් නොසංසුන් සිත සංසුන් කළ හැක්කේ කෙසේ ද යි කල්පනා කළ හ.

කල්පනා කළයුත්තේ අනුන් ගැන නොව, තමන් ගැන ය. භික්ෂූන්ගේ හිස් පැසසුම් නිසා තමන් පළමුවෙන් මානයෙන් ඉපිලී ගිය සවින්, ඒ පෙරටු හැඟීම නිසා භික්ෂූන් පහත්කොට සිතීමට පෙළඹුණු සවින් උන්වහන්සේට කල්පනාවී ය.

මානය සිතට පිවිසෙන්නේ තමන් නොදැනුවත්ව ම ය. එය අකුසල චෛතසිකයකි. එය ළඟ නැතිම මැඩිය යුතු වෙයි.

සෙසු භික්ෂූන්ගෙන් දැන් ඒ බෙහෙවින් පුහුදකලා ජීවිතයක් ගෙවාසිටින්නට තමන් පෙළුම්සිටින්නේ උද්ධච්චකමේ ප්‍රතිඵලයක් විනි යි රාහුල තෙරණුවන්ට අද වැටහී ඒ කල්පනාවී ය. මනුෂ්‍ය වර්ගයා කෙරෙහි පමණක් නොව, සියලු සත්වයින් හා ගහකොළ කෙරෙහිත් දයා කරුණාවක් ඇති තමන්ට තමන් ඇසුරු කරන පුද්ගලයින් කෙරෙහි පමණක් අප්‍රසාදයක් හා අසන්තෝෂයක් පහළවන්නේ නම් තමන්ගේ දයා කරුණා ගුණයෙහි අඩු ලුහුඬුකමක් තිබිය යුතු ය. මෛත්‍රිය පූර්වමනොට තමන් කෙරෙහිත්, අනතුරු ව අවට සිටින්නවුන් කෙරෙහිත්, ඇසල්වැසියන් රට වැසියන් ලොව්වැසියන් හා සියලු සත්වයින් කෙරෙහිත් පතුරන්නේ තමන් ඇසුරෙහි සිටින්නවුන් නිසා පැරවන සිත සමනය කිරීම සඳහා නොවේ ද? තමන් දුටුවිට නම් දෙනුත් හෙළන රැවුම් බැලුම්, නොඑම් සතෙකු ජලය නොරැඳෙන්නා සේ ම නොඇලෙයි. සහෝදර තාන්දුරාම උපාසක මුනියන් තමන්ට "සොණ රාජයෙකැයි" තමන් පටබැඳ ඇති බව සිංහලුන් කී අවස්ථාවේ ද තමන් ගේ සිත නොසංසුන් වූවා පමණක් නොව, තාන්දුරාම කෙරෙහි දැඩි අප්‍රසාදයක් ද හටගත්

බව රාහුල කෝරළේවන්ට මතක ය. එය සිදුවූයේ උදය කාලයේ ය. චන්ද්‍රරාම ගේ උපහාස විදහා තමන් විසින් භාරගන්නා ලද බව තේරුම් යන්නේ තමන්ට සසලවීමට සිදුවූ නිසා ය. සිංහලේවූට සිනාවක් පමණක් පෙන්වා ඒ කාරණය එ පැතින් අමතක කර දමන්නට සිතුණා නොවේ ද?

තරුණ වයසේ පසුවන චන්ද්‍රරාම තමන් ගේ සහෝදර භික්ෂුව ය. ඔහුට අනුකම්පාවක් දයාවක් දක්විය යුතු ය. ඔහු අතින් නොදැන සිදුවන වැරදිවලට සමාව දිය යුතු ය. "චන්ද්‍රරාම නිදුක්වේවා නිරෝගී වේවා සුවපත් වේවා, ඔහුට යහපත් සිතිවිලි පහළ වේවා, ඔහු කෙරෙහි මා සිත් තුළ කිසිදු වෛරයක් ද්වේෂයක් නැත" යයි අවංක චේතනාවෙන් කිහිප වරක් සිතා රාහුල කෝරළේවෝ, මුළු ගෙදරට පැමිණි සියලු භික්ෂූන් කෙරෙහි ද මෙත් සිත පැතිරවූ හ.

බන්ධනයකින් නොහොත් බරකින් සිත නිදහස් වූ කලෙක මෙන් කෝරළේවන් ගේ සිත ප්‍රබෝධයට පත්වි ය. සවුදරම යහනෙහි රැඳීසිටින්නට කැමැත්තක් නූවූ හෙයින්, උපවීවගේ යහනින් නැගිට මැද මිදුල දක්වා ගිය හ.

චන්ද්‍රරාම ගේ කාමරය දෙසින් අවිනීත සිනා හඬක් නැගිණි. ජෝතිපාලෝක භික්ෂුව තවමත් ගොසු නොන් නැත. චන්ද්‍රරාම විහාරදේවින්ගේ ශිෂ්‍ය සමින ය. ජෝතිපාලෝක භික්ෂුව ද චන්ද්‍රරාම භික්ෂුවට සමාන ය.

ඉදිරියට යාමට හෝ ආපසු හැරෙන්නට හෝ ශක්තියක් නැත්තා සේ මොහොතක් සිට බලාගෙන රාහුල කෝරළේවෝ තමන්ගේ සිත සැලී නොසංසුන් වූ බව සිතා සිත සමනය කරගනු වස් ප්‍රඥාවෙන් ගනී ඇති තරුණයින් දෙදෙනා කෙරෙහි අනුකම්පා සිත් උපදවාගත් හ.



සිනා හඬ අසමින්, කරන කතාවන ද ඉවසාය වෙයි.

"ගිය සැසරෙමින් වෙන්න ඇති හිටි කියන්නා ඇහුනා. එහෙම නැත්නම් කළුව පහළ නොකරයි මෙලෙස දැනෙන ඇති......"

"ප්‍රශ්නයක් නොමැයි කාලෙ බෝකලයක්!" චන්ද්‍රරාම ගේ කතාවට චන්ද්‍රරාමත්, ජෝතිපාලෝකයා එක්විට සිනාසුන හ. ඔවුන් කතාකරන්නේ තමන් ගැන බව රාහුල කෝරළේවන්ට පැහැදිලි ය.

සිය යළිත් යංගන්නේ ගැනීමට මින වෙනසක් ගත් ජරාවර ගෙයයි, ගිනි නිවීය නැත්තේ ජලයෙන් පමණක් බව සිතා, සිත සැනසී කරුණාවට වෙර දරමින්ම ඉදිරියට ගමන් ගත්තේ ය.

චන්ද්‍රරාම ගේ කාමරයේ දොර අඩවිත්කොට තිබිණි. දොර තුරුණෙක එක්වට ම කාමරයට ඇතුල්වීම නුසුදුසු ය.

"චන්ද්‍රරාම, මම රාහුල. ඇතුළට එන්න ද?"

සෝපාව හැඩිනි කාමරය තුළ දැඩි නිහැඬියාවක් පවත්නේ ය. එපයේ පෙනළුන හඬක් දෙවිනුව ඇසිණි.

"මම රාහුල. ඇතුළට එන්න ද?"

අඩවින් දොර හෙමින් ඇරිණි. චන්ද්‍රරාම ගේ සිය පළමු ව මතුවිය.

"එන්න එන්න. මගේ කාමරයට එන්න අවසරයක් ඕනෑයි?"

ජෝතිපාලෝක භික්ෂුව හිටගෙන සිටියේ ය. රාහුල කෝරළේවෝ [illegible] දෙස බලා සිනා පහළකළෝ ය. "මට ඇසුනා මම [illegible] ලොකු හඬවකින් සිනා වෙනවා. මාත් කැමතියි

සතුටින් ඉන්න. ඒකයි මං ආවෙ."

"කොච්චර හොඳ ද ආශු එක......." ප්‍රේමාලෝක කීයේ ය.

"ඔබ වහන්සේ මගෙ කාමරයට කවදවත් එන එකක් යැ?"

"ඔබ වහන්සේ විහිළුවක් කොරලොප්පුවක් කරනවා. මම කවදවත් දකල නැ. නමියට හැට පිරුණු නායක හාමුදුරු නමක් වගේනෙ. ඒ වගෙ ඇත්තන්ට අපේ බිජන හමියන්නෙ නැ කියල මම හිතාගෙන හිටියා!"

රාහුල තෙරණුවන් සමග කතාකරන්නේ ප්‍රේමාලෝක තෙරණුවන් පමණී. මඳ සිනා මුහුණින් යුතු ව හාන්දරාම පසෙක සිටී. තමන් අවුරුද්දකිනුදු හාන්දරාම තෙරණුවන් ගේ කාමරයට නොපැමිණි බව රාහුල තෙරණුවන්ට සිහිපත්වේ යි. අන්තිම වරට තමන් මෙහි පැමිණ ඇත්තේ අවුරුද්දකට තරම් උඩ දී හාන්දරාම උණහැනි සිටි අවස්ථාවේ ය. හාන්දරාම ගේ පොත් රාක්කයක් ඔහු ගේ වැඩ වගේ ම ය. කිසිදු හොඳුවක් නැත. එක සිතුවමක් ඇඳ උඩ ය. තවත් සිතුවමක් පුටුවක් මත ය. අඳනයක් බිම ය. සිවුරු රාජ්‍ය නායිකාවක් හිටපු ඇමති තුවක් සමඟ බිඳ ගත් ඡායාරූපයක් බිත්තියේ එල්ලා ඇත. විවෘත කළ සඟරාව පිටු සිහියක් ඇඳ මත දිගහැර තිබේ.

"මිනිමරුවො ඉන් පැරයක් වෙඩි තියලත් එක වෙඩිල්ලක් පත්තුවුණේ නැකිය නේද? මට මේ හාන්දරාම දනයි කීවේ. නම් පුදුමයි නේද හාමුදුරුවනේ........"

අනා ප්‍රවේශමෙන් කතාකළ යුතු යයි රාහුල තෙරණුවෝ සිත හ.

"ඒක සාමාන්‍ය සිද්ධියක් විදියට යි මම පලකන්නේ"



"කොහොම ද සාමාන්‍ය සිද්ධියක් වෙන්නෙ හාමුදුරුවනේ? එක පැරයක් පත්තුවුණා නම් මොකද වෙන්නෙ? එහෙනම් අද අපිත් එක්ක මේ වගෙ කතාකරන්න ඔබ වහන්සේට ලැබෙන එකක් නැ."

"සුවින්ඳුවෙ" කිවුමෙණ ගිය පතරෝමින් නම්?" රාහුල තෙරණුවෝ ඇසී හ. "බල්ලට එක වෙඩිල්ලක් තියනවා මං හොයනවයි. ගිය පතරෝම අමිස්සට සුවින් ගිය පතරෝමින් දුන් බව හොයා ගැන්නුව නම්? මං හිතන්නෙ කොහොමත් හෝ වැරද්දක් සිද්දවෙන්න ඇති ඒ මිනුමරුවට. සුවින්ඳුවට කොහොම හරි, පතරෝමම් නම් වැරද්දක් කියන්න ඇති. සුවිඳුවක් කියනවා නම් මගෙ වාසනාවට ඒ හැත්තම් තැපැල්වට සුවින්ඳුව පත්තුවුණේ නැතත් ය කියල මම ඒ කතාවට එකඟවෙන්නෙ නැ."

කවින් අඩියක් එපසෙකින් ම සිංහදත්තු ගේ දෑත තරුණයින් දෙදෙනකු විසින් ද, හිස කෙස රාහුල තෙරණුවන් විසින් ද අල්ලා ගන්නා ලදි. දහඩියෙන් තෙත් වී ගිය දුබල දෑත ලිස්සා නොයාම පිණිසත්, ශ්‍රී පත්ලට ඔහුත් පමණ ලිස්සා නොවැටෙනු පිණිසත් ඉතා ඉවසිල්ලෙන් කටයුතු කළ යුතු විය. රාහුල තෙරණුවන් සිංහදත්තු ගේ කෙසින් වැරයේ ඇල්ලාගනු ලැබුවත්, ඔහු වේදනාත්මක හඬක් නොනැගුවේ ඒ වන විට සිහිසුන් ව සිටි බැවිනි. සිංහදත්තු ගේ දෙපා ද කඹ පොටින් මිදී තිබුණේ ය. දෑත අල්ලාගෙන සිටි තරුණයින් දෙදෙනාට තවත් දෙදෙනකු ගේ සහාය ලැබිණි.

සිංහදත්තු මළ කදක් මෙන් ගොඩට ඇද බිම දිගා කරනු ලැබිණි. ඔහුගේ මවොත්තුවට සිටි බලු පැටවුන් හතර දෙනා එළියට ගෙන බිම තබන්නටත් පෙර, බැල්ල ඉවතර බලා නොසිට එබුවා ය. පැටවුන් හතර දෙනා බිම තබත් ම ඕ කෙඳිරිගා එකිනෙකා ලොවා, තැගුට වනා එසෙකු කටින් ගෙන නික්මගියා ය.

වතුර මුහුණට ඉසින්නට පෙර සිවිසිදු වාතය ආශ්වාස කරන්නට ලැබීම නිසා සිංහදත්තුට සිහිය ලැබිණි. ගේ වනාත් ගෙඩි දැන් කෙණ්ඩිය සටේ තබා එහි තිබූ සියලුම වතුර බී, දෑත් බිම ගසාගෙන රාහුල තෙරණුවන් ගේ මුහුණ බැලුවේ ය.

"බලු පැටව් කෝ හාමුදුරුවනේ.......?"

"ගම් ඉන්නෙ තුන් දෙනෙක්. බැල්ල දන් පැටියෙක් රැගෙන ගියා"

"කොච්චර හොඳ ද? මං බලු පැටවුන් හතර දෙනාම බේරාගත්තා ඔබ දන් පව් නැ!"



"ඇහව අමාරු හෝද සිංහදත්තු උන්නැහැ?"

"ඒ තැටී අමාරුවක් නැ. බහිනකොට මොනුත් නෑ. නගිනකොටයි මට මොකක් ද වුණේ. කකුලින් තෑරුණා. එනකොට බිත්වත් තෑරුණා. කවදවත් මට කොඩ එන්න ලැබෙන්නෙ නැ කියලයි මං හිතුවේ. එත්කොට බලු පැටවුන් හතර දෙනා එක්ක මං ගොඩට එන්න ඕනැ. නැත්නම් උන් හතර දෙනා එක්ක ආයිත් මං පල්ලට යන්න ඕනැ කියන එකයි අහනිමට තිබුණෙ"

සිමට අත ගසා නැගිටිමින් සිංහදත්තු රාහුල තෙරණුවන්ට මෙසේ කීවේ ය. "මීද ඇතුලට කෙමින් කෙමින් බහිනකොට මට අංගුලිමාල මතකවුණා. අංගුලිමාලත් මං වගෙ අහිංසකයෙක් නැද කොට හාමුදුරුවනේ?"

* * *

ගුරු පත්වීම ලැබ සිටි හේමාලි නම් ගේ පුරම වැඩිසෙන් නැගී මෝග රැගෙන රාහුල තෙරණුවන් මිනෑ දකිනු සඳහා පුජාරාම විහාරස්ථානයට පැමිණියා ය. ඒ වනාවිටත් රාහුල තෙරණුවෝ පන්සලට පැමිණ නොසිටිය හ.

තරුණිය සිය පියා ගේ අතින් අල්ලාගෙන ඔහු සමග පන්සලට එනු පළමුවරට දුටුයේ කාන්දාරාම ය. සාන්තා පක්ෂය ගැන සිතේ තවමනා තිබුණු කද පිළිතුල නිසා ඉදිරියට එමට උත්ථානක් ගේ නැමැත්තක් නොවී ය.

රාහුල තෙරණුවන් ඔස් රථයෙන් බැස්සේ තරුණියන්

WWW.SINHALAELIBRARY.COM 97

මහල්ලාගේ උගුරේසය ගස මුල රැඳීසිටිය දී ය.

කොරළුවෝ කොරහසමින් පැමිණෙති. මහ බලමින් සිටි සිංහළුපු පෙර මහට දිවගියේ ය. හාන්දුරාම් කොරළුවෝ ද මිදුලට බැස්ස හ.

"කකුලට මොකද වුණේ හාමුදුරුවනේ......?" සිංහළුපු ඇසයි.

"කලබලවෙන්න කාරි නෑ."

පල්ලම්පටිවලින් බැඳ තිබුණු කකුල දෙසත්, යළි මුහුණ දෙසත් බැලූ සිංහළුපු කතාකෙළේ ය. "සිවුරත් තුන් හතර පොළක් පිච්චිලා. කකුලත් බැඳගෙන. සිංහළුණා ද දෙයියනේ...... කවුරුත් නෑ අසස්"

මිදුලේ සිටගෙන පසුවෙන මහල්ලා හා ඔහු ගේ දියණිය කොරළුවන්ගේ නෙත ගැටිණි. 'ඒ ඇත්තොත් ඇවිල්ලා' යයි තමන්ට කියාගත් කොරළුවෝ සිංහළුපුගෙන් පමණක් ඇසූහ. "අර ඇත්තො ඇවිත් දුන් වෙලාවේ ද සිංහළුපු උන්නැහේ?"

"ඔව් දන්නෙත් දනුයි. කවුද කියන්න මං දන්නෙ නෑ. සිවුර පිච්චුණෙන්, කකුල බැඳගෙන ඉන්නෙ. මෙයාවිලාද සිය කියන්නාවෙ හාමුදුරුවනේ...... කොළුම් කල්ලල කියල අපිටත් ආරංචිවුණා, හාමුදුරුවො එහාකල් අපි ගෙදර උන්නේ"

"කියන්න බැරිවුණයි...... සත්සලවන් මං යන්නෙ සිංහළුපු උන්නැහැ"

හාන්දුරාම් විමසීමයක් කිලෑසිටියි.

හාන්දුරාම් කොරළුවන් ගේ බිය සනසාලනු සදහා උත්සාහනෙන්ට



සිනාවන් පාමින්, ඒ සිනාවෙන් ම කරුණිය හා ඇගේ පියාගේන් දෙස බැලූ රාහුල කොරළුවෝ කරුණිය ඇමතූ හ. "රීයෙ දෙකට පන්සලෙන් පිටත්වෙච්ච මං දනුයි එන්නෙ. සත්සලට ගෙනිං වාඩිවෙලා ඉන්න. මට කරමින් අසාහනුයි."

කොරළුවන් සහාකරත්තෙන් නැඹිරෙන්නෙන් වෙදනාට යටපත්කරගෙන යයි කරුණිය සිතුවා ය. ඒ වැන්නක් හාන්දුරාම්ට ද නැඟුන නිසා ඔහු සහෝදරයා වෙනුවට කරගන්නට උත්සාහයක් දැරුවේ ය.

"එපා. මට ඒ තරම් අපහසුවක් නෑ."

කරුණාට වඩාට වෙලාව සිට අද මහ වැසිරගත් රාහුල කොරළුවෝ සිංහළුපුට කීහ. හාන්දුරාම් කාලයට අත තබා බැලුවේ ය. නායක ස්ථවිරයෝ ද පැමිණිය හ. උන් වහන්සේ ද හාන්දුරාම් අනුගමනය කරනු පෙනිණි.

"දැල්වතුර ගෙනෙමයි සිංහළුපු, ඉක්මනට තැඹිලි ගෙඩියක් කපාගෙන එන්ඩ" කාලයෙන් අත ඉවත්කරගත් නායක ස්ථවිරයෝ පල්ලම්පටිවලින් වෙලන ලද දනුණු කකුලට අත තබා බැලූහ. තුවාලය ඇත්තේ යටිපත්ලේ බව වෙලුම් පටි මඟහරිනෙන පිටතට ගෙනෙන ලේ පැල්ලමෙන් පෙනේ. සිවුරේ කිසිත නැතත් පිළිස්සී ඇති හෙයින්, ඇඟ ද පිච්චී ඇතැයි ස්ථවිරයෝ සිතති. දුන්නා කිරිමෙන් කොර වූ ඇගේ විවිධ ප්‍රධාන පරීක්ෂා කිරීමේ දී දනුණු ගෙන් මැණික් කවිට අගල පිළිස්සීමකට මුහු වූ දිය බිබිලක් දකනට හැකිවී ය. හාන්දුරාම් කොරළුවෝ ඉවතළ කකුල පොතිටියක් උඩින් තියවා තැබූ හ.

සිංහළුපු තැඹිලි ගෙඩිය ගෙනෙනු ප්‍රමාද වූ නිසා නායක ස්ථවිරයෝ පිටතට ගියෝ ය. හාන්දුරාම් ඉතා සෙමින්

www.sinhalaelibrary.com

සභාගෙලේ ය. "මට කියන්න හාමුදුරුවනේ. මොකද වුණේ රිලය් කොහේද උන්නේ? අද දෙළහත් පසුවුණා නම් සොයන්න යන්නයි ලොකු හාමුදුරුවෝයි මායි හිතාලුන්නේ"

"අද උදේ පයින්ම ආපසු එනවයි මේ සිද්ධිය වුණේ. මගේ උත්සාහයෙන් කිසිම වැඩක් වුණේ නැ. නැම නැනම බෝතල් කඩු. ජාතිවාදේ කියන්නෙ ඒක ද? මම මිනිස්සු අතරින් රිංගාගෙන ගිනි ඇවිලෙන මිනිහට ඇදලගන්න උත්සාහ කළා. ඒ මිනිස්සු මාව තල්ලුකරල දැම්මා. එකකොට ම තාඩි ව්‍යෙල පටාගෙන අවාසනාවන්ත මිනුස්සයාගේ ඇඟ උඩට වැටිලා එකම ගිනි ජාලාවක් වුණා. මිනිස්සු මාව තල්ලු කරල දම්නකොට මගේ කකුලේ පොරෝප්පුව ගැලවුණා. එකකොටම බෝතල් කට්ටකට කකුල කැපුනා. අතක් සිවුරත් පිච්චුණේ ගින්දර අස්සෙන් අත දික්කරද්දී........"

"හාමුදුරුවෝ රිලය හිටියෙ?"

"අම්මා ඉන්න වාට්ටුවෙමයි. මම දැය කුණක් නැත්තම් හතරක් මම්ම අග පුටුවක් තියාගෙන අම්මෙයි එයයි හිටපු ලෙඩ්ඩුන්ටයි බණ කිව්වා. බිය නැති නිසා පයින් එනවට කොළඹ නගරය ඇතුළෙදිමයි මෙහෙ වුණේ"

විස්තුින් සොන්නතුන් සමග නැතිලි වතුර පානය කිරීමෙන් පසු රාහුල හෙරණුවන් ගේ පොහසුකාට හරමක් දුරට මිහාතුවිණි. හමින් නුපන්නොයි දී බිද් රුටයකට ගොඩබූපේ කුට්ටලයට බොන් දම්මාගෙන මවත් අත පිලිස්සී ඇති බවක් ඒ අවස්ථාවේ තුවාළ බවත් රාහුල හෙරණුවෝ කීහ.

"අපේ සිංහල මිනිස්සුන්ට හෝනයි නැද්ද රාහුල දෙමළට් කරන වැඩවලට. ඉවසල ඉවසලා නැතිම නැත කමයි මිනිස්සු



මේ වැඩේ කෙළේ. මිය මස්තෝට්ටම වනකියන්න මිනු. මිහ එකා! රට මේ හත්පොට් පෙරකණ කල් බලාහිටියෙ මේ මිනිහා නෙද? නියමි තිස්සාරණේ රාහුලත් මිත්තැති දේවලට එකදෙන්න පනවා. එක ගමිනක් තුවක්කුවක් ඉස්සරහට පැනලා වෙඩි හොහා බේරුණා. මෙද ගින්දර නොවරිල්ලට පැනල ඉවරවෙන දෙමළ මිනිහෙක් බේරාගන්න ගිහි කකුල කපාගෙන. අත පුච්චාගෙන. රාහුල දුන්වන් ගෙව්වායින් පාඩමක් ඉගෙන ගන්නොත් හොදයි. සිලිප්තීම නිසා මතු වූ දිය බුබුල මත කෙල් ගාමින් හායන ස්වර්ඨයෝ රාහුල හෙරණුවන්ට අනුශාසනය කළු හ.

කෙල් කුප්පිය ද රැගෙන නායක ස්වාමීරයින් නිසෑම ගිය පසු රාහුල තාන්ද්‍රාමිගේ මුහුණ බිලුවේ ය.

"ගේගැවින් ඉන්න ඇත්තන්ට කියන්න ලොකු හාමුදුරුවන්ගෙන් අවසරය අරගෙන මෙහාට එන්න කියල. ඒ ගැනු ළමයගෙ ගුරු පත්වීම හරිමින් හරිගිහි නැද්ද දන්නෙ නැ?"

හේමාලි දැනේ හිටු පාර්සලය මේසය මත තබා රාහුල හෙරණුවන් ඉදිරියේ දණ ගසා වැද නැගිටින විට ඇගේ දෑස් කැලුන් පෙත් ව තිබිණි. තාන්ද්‍රාමි ඒ වේලාවේ කාමරයෙන් පිටව ය. මහලු ගුරු මහතා ද දැන් එක්කර ගෙන කොල් මිපුරමින් සිටගන්වන ම හිටියේ ය.

"අනේ හාමුදුරුවනේ මම මොකද කරන්නෙ? මිකි වනත්තේ වේදනාවෙන් එනවා දක්කාම මට ඉවසන්න බැරිවුණා"

"ශරීරයේ පුර කොටසක් පිදුරුවීම, පිළිස්සීම මිස නරක්කර නැතිවට හේතුවක් නොවෙයි. තුවාලය බෙහින් සනීපකරගත හැකි යි. කොහේ ද හෙගණිය ගුරු පත්වීම?"

WWW.SINHALAELIBRARY.COM 99

"ඔබ වහන්සේට සිං සිදුවන්නට මම ඉංගිරිය ජ්‍යෙෂ්ඨයා උගන්වනවා"

"මට ඉතාම සතුටුදායක ආරංචියක්," රාහුල තෙරණුවෝ කී හ. උන්වහන්සේ ගේ මුහුණ ඉතා පැහැපත් විය.

"මට කලින් එන්න බැරිවීම ගැන සමාවන්න සාමිදුරුවනේ. පණ්ඩු පයියෙන් ඔබ වහන්සේට දුර කැයිතක් අරගෙන එන්න සිටපු නිසයි සුමිංදුවිණේ. ඒත් සානක්කයි මාරි ඇවිත් තියෙන්නෙ ඔබ වහන්සේ වේදනාවෙන් සිටින වෙලාවකයි"

රාහුල තෙරණුවෝ හැකිළ කෙණ්ඩේ ඉක්ම පුටුව ගුරු මහතාට සංකේත කළ එහි ඉන්ද්‍රු හ. පුටුව අතනා බැලූ මහල්ලා පුටුවේ උස අතින් බැන බලුවේ ය. පුටුවේ උස දණ මට්ටමට වැඩි වූ හෙයින් ඔහු එහි හිඳගැනීමට අකැමැත්ත පළකරන බව දුටු තෙරණුවෝ මහල්ලා කෙරෙහි අනුකම්පාව උපදවා කතාකළ හ. "කමක් නැහැ, ඉඳගන්න මහත්තයා. කොහැත සිදගන්නත් භික්ෂූරුවන් කෙරෙහි පවතින ගෞරවයෙන් අඩුවක් ඇතිකර නොගන්නා බව මම දන්නවා"

"එහෙමයි සාමිදුරුවනේ එහෙමයි. භික්ෂූරුවනට [illegible] දරුවාක් දක්වන ආදරය ගෞරවය නිසාමයි අපිට ලෙඩ්ඩර උදව්වක් කරන්න ඔබ වහන්සේට සිත් [illegible] සියලයි මම හිතන්නෙ. ඔබ වහන්සේට මුදු බවම අත්වෙන්න ඕනෑ අපිට කරපු මේ උදව්ව. දන් සාමිදුරුවනේ මට ඔය නැතිව බැලෙන්න පුලුවන්. මගෙ [illegible] නොදෙයි. මගෙ දුගෙ [illegible] නොදෙයි. ඔබ වහන්සේ අපිට පෙනෙළ මේ ලොකක මනුස්සයෙක් කරන උදව්වක් නොවෙයි. උපනුපන් ජාති දහවා මගින් මගෙ දූත් මේ උදව්ව අමතක කරන්නෙ නැ"



"ඒක පුදුම දෙයක්" රාහුල තෙරණුවෝ අවංකව ම කීහ. "මම තැති වෙනින බලිලාපාචර්යෝකුනෙනි නැ. මම [illegible] සතුටුදායක ආරංචියක් පමණයි. ඔය නැති [illegible] ලැබෙනු නොහැයෙන්න අකැමැති නම් ලොකු සාමිදුරුවන් වහන්සේට පිළිගන්වන්න. එහෙනම් ඔය ඇත්තනට ලොකු සාමිදුරුවෝත් පැහැදෙයි"

නැති පාර්සලයේ මුලය වටිනා අඳ ඇතිරිල්ලක් හා ලොකු කොලිකුට්ටු ඇඳුමක් විය. ඒ ඇඳ ඇතිරිල්ල සන්සලේ [illegible] කැමති නුවුවා ය.

"අනේ සාමිදුරුවනේ ඒ ඇඳ ඇතිරිල්ල මම ගෙනාවේ ඔබ වහන්සේට ම යි"

"නැතිවෙන් නැ. මට ම දන්නවායි හිතන්න, මට සුදුසු දෙයක් නම්, මට අවශ්‍ය දෙයක් නම් ලොකු සාමිදුරුවෝ මට දෙයි. මට [illegible] අයත් දෙයක් මේ විහාරස්ථානයේ නැ. මේ සියල්ල අප සියලුදෙනාට පමණක් නොවෙයි, නැම දෙනාටමත් අයිති දැ සිතලයි මම හිතන්නෙ. යමක් අයිතිකරගන්න හෝ [illegible] වෙනවා. සිත අපිරිසිදු වේවායන්න නම්, ඇලීම් බැඳීම් රැස්කර ගැනීම් අත්පත් කරගැනීමවලින් මිදෙන්න ඕනෑ"

"එහෙමයි එහෙමයි සාමිදුරුවනේ......" රාහුල තෙරණුවන්ගේ කතාව මහාව ශ්‍රවණය කරමින් සිටි මහලු ගුරු මහතා කියේ ය. "ඔබ වහන්සේ වගෙ කතා කරන කිසිම සාමිදුරුනමක් මම දැකලා නැ. ලුහාන් සාමිදුරුවරු බණට මහෙකාම කතා කරනව නම් මම අහල තියෙනවා. නමුත් මේ වගෙ අවස්ථාවල දී [illegible] විදියනට. මිදුංසාමිදුරුවන්ගේ [illegible] ඔබ වහන්සේ රකින බවයි මම

WWW.SINHALAELIBRARY.COM 100

තෝරුම්ගත්තෙ. මහා සංඝයා වහන්සේ ගේ පැවැත්ම වෙන්න ඕනෑ ඒක තමයි" මහලු ගුරු මහතා වේගයෙන් ඇසිපිය ගසමින් කියාගෙන ගියේ ය. අද දෙනෙතට පැහැපත් දර්ශනයක් හසු වූ කලෙක මෙන් ඔහු ගේ චිත්ත අතිශයින් ම ප්‍රසන්නවී ය.

"වාසනාවන්, වාසනාවන්" ගේ යළි කීය. "මං වගෙ ඇස් අන්ධ මිනුෂ්‍යයෙකුට කොච්චර නම් හිත පිරෙන වචන ටිකක් ද ඔබ වහන්සේ දේශනා කෙළේ. ඔබ වහන්සේ වගෙ ක්‍රියාකරන ඔබ වහන්සේ වගෙ හැසිරෙන හාමුදුරුනමක් මම කියන් ඕවාගෙන හිටියා. සාධු! මට ඔබ වහන්සේ ගේ දෙපා අල්ලාගෙන වඳින්න ඕනෑ. මගේ කැමැත්තට මට ඉඩ දෙන්න හාමුදුරුවනේ........"

# 12

ධර්මපාල ගේ මිනීමැරුම් නඩුව කොළඹ මහාධිකරණයේ විභාගයට ගැනිණි. පැමිණිලි පාර්ශ්වයේ ප්‍රධාන සාක්ෂිකරුවෝ රාහුල හෙරණුවන් වහන්සේ ය. මුදල් ගෙවා නීතිඥ සහාය ලබාගැනීමට විත්තියටවත් පැමිණිල්ලටවත් පුළුවනකමක් නොතිබිණි. නඩුව ගැන කමලාවතී කිසිම උනන්දුවක් දැක්වූයේ නැත. වේදනාවට වැරදිකරු වී පියදාස යළි නොඑනවා නම් එය ඒ තරමට හොඳ යයි ඕ සිතයි.

රාහුල හෙරණුවන් සාක්ෂි කූඩුවට නගිනවිට පළමු වැනි විත්තිකරු වන පියදාසත්, ඔහු ගේ සහචරයින් වන අනෙක් විත්තිකරුවන්නුත් විත්ති කූඩුවේ හිඳ බලාගෙන හුන්නේ කිසිදු වරදක් නොකළවුන් ලෙසිනි.

නම සහ වයස විමසීමේ දී ප්‍රශ්නයක් මතු නුවූවත්, රක්ෂාව කුමක් ද යි ඇසූ ප්‍රශ්නයට රාහුල හෙරණුවන් දුන් පිළිතුර තවත් ප්‍රශ්නයකට තුඩුදෙන්නක් විය.

www.sinhalaelibrary.com

"උපාලිය තමාගෙන් ප්‍රශ්න කරන්නෙ තමා ගේ රැකියාව ගැනත් ද කියලයි........"

"මම බෞද්ධ භික්ෂුවක්" රාහුල සෙරණුවෝ නැවත ද කීහ.

"තමා බෞද්ධ භික්ෂුවක් බව උපාලියට තේරුම් ගත හැකි යි. උපාලිය ප්‍රශ්න කරන්නෙ තමා ගේ රැකියාව ගැනත් ද කියායි"

"මා යැපෙන්නෙ පන්සලේ දායකයින් දෙන දානයෙන්. ඒ හැර උපාලිය අදහස් කරන රැකියාවක් ගැන මා සිතුවෙ නැ"

"තමාට රැකියාවක් නැ?"

"රැකියාවක් තියෙනවා. ඒ තමයි මහණකම, භික්ෂුවක......"

උපාලියේ සිහින් කළුකුපුවක් ඇතිවි ය. පෝල්කයා විනිශ්චයකාර තුමා දෙස බැලුවේ ය. විනිශ්චයකාර තුමා පෝල්කයාට තිබිවක් කීවේ ය. එය අන් කිසිවෙකුටත් නැසිණි.

හිස උපාලියේ ම අවධානය රාහුල සෙරණුවන් වෙත යොමුව තිබේ. සාක්ෂියට ඉදිරිපත් වූ මුල් අවස්ථාවේ ම පැහැදිලි වූ පටලැවිල්ල, සෙරණුවන් යන් සාක්ෂිය නොදෙන බවට හොඳට ම ප්‍රමාණවත් යයි නීතිඥවරු සිතූ හ. එහෙත් ඉන්න හැන්පත් ව, ලුව්සිල්ලෙන් වඩනා සෝමි ගම්භීර කතාකරන රාහුල සෙරණුවන් ගැන විනිශ්චයකාර තුමා විශේෂ සැලකිල්ලක් දක්වූයේ ය.

පැමිණිල්ල වෙනුවෙන් සාක්ෂි පුද්දසරගැනීමට පළමු ව ඉදිරිපත් වූයේ නඩුව ඉදිරිපත්කළ උප පොලිස් පරීක්ෂක නැත ය. ඔහු අලුත් වෙස්සට බැඳුණු වැඩි පළපුරුද්දක් නැති නිලධාරියෙකි. විත්තිකරුවන් වෙනුවෙන් පෙනී සිටි ජ්‍යෙෂ්ඨ



නීතිඥයා තම ශිල්ප දක්වීමට අවස්ථාව එළැඹෙන තෙක් නිස ඉන්මින් සිටියේ ය. උප පොලිස් පරීක්ෂකවරයා ප්‍රශ්නවලට පිළිතුරු ලබාගනිමින් සිටිය දී රාහුල සෙරණුවන් ඔහු ගේ මුහුණ බලා උත්තර දෙන්නාට වූ හෙයින් උගත් විනිශ්චයකාර තුමා භාෂා පරිවර්තකයාගේ සහායක් නොමැතිව ම රාහුල සෙරණුවන්ට කෙළින් ම මෙ සේ කීයේ ය. "ස්වාමීන් වහන්ස, නඩුරු ඔබ වහන්සේගෙන් ප්‍රශ්න කළත් මා දෙස බලා මට උත්තර දෙන්න"

නඩුකාර තුමා සෙරණුවන්ට ගෞරව කරන බව පෙනිණි. සාක්ෂිකරු ගේ සාධු චරිතය උපාලිය හමුවේ හෙළිදරව්කොට [illegible] පුද්ගලයකු බව සිත්ප්‍රකීර්ණමට උප පොලිස් පරීක්ෂක හැටව අවමන්ඩියක් හෝ මූඩකීතාවක් හෝ නොවී ය.

මොහොඩි කිහිපයක ඇවෑමෙන් විත්තියේ නීතිඥයා නැඟිටිසිටියේ ය. උගුරේ රැල් බුරුල්කොට කළු කෝට් සාක්කු දෙකට දැත් දමාගෙන කතාකෙළේ ය.

"හාමුදුරුවො බෞද්ධ භික්ෂුවක් බව උපාලියට ප්‍රකාශ කළා?"

"ඔව්. මම බෞද්ධ භික්ෂුවක්"

"හාමුදුරුවො විත්තිය වෙනුවෙන් ද සාක්ෂිදෙන්නෙ? පැමිණිල්ල වෙනුවෙන් ද?"

"පැමිණිල්ල වෙනුවෙන් ද විත්තිය වෙනුවෙන් ද යි මම දන්නෙ නැ. මා මෙහි පැමිණියේ මා රැඳුන ඒ අවස්ථාවේ ඇත්ත ඩ්වී දැ මේ උපාලිය හමුවේ ප්‍රකාශකර සිටීමට යි"

උපාලියේ යළි කළුකුපුවකි. සෙරල්ත මුදලිට උපාලිය

WWW.SINHALAELIBRARY.COM 102

නිහඬකිරීමට සිදුවී ය.

"පැමිණිලි පක්ෂය විසින් තමා සාක්ෂියට ඉදිරිපත් කර ඇති බවවත් තමා දන්නෙ නැද්ද?"

"අපරාධය සිදු වූ ද රාත්‍රියේ පොලිසියෙන් පැමිණ මගෙන් කට උත්තරයක් ලබාගත්තා. ඊට පසු උසාවියෙන් සිතාසියක් ලැබුණා. මම දන්නෙ එ පමණයි"

"හොඳයි. හාමුදුරුවන්ගෙ පන්සලට අල්ලපු වත්තෙයි මේ යසපාල කියන පුද්ගලයා මැරිසිටියෙ?"

"මං එහි යන විට මැරිසිටියේ නෑ. ඔහු කෙඳිරිගාමින් සිටියා. දරුවන්ගෙන් වතුර ඉල්ලුවා"

"හාමුදුරුවො උත්තර දෙන්න ඕනෑ මම අසන ප්‍රශ්නවලට පමණයි. හොඳයි........ මේ මැරුම් කෑ යසපාල කියන මිනිහයා කාස රෝගියෙක් බව හාමුදුරුවො හාමුදුරුවන්ගෙ මුලින සාක්ෂියෙන් පිළිගෙන තිබෙනවා. කාස රෝගියෙකුට ලෙඩෙකුට සාර්ථක විවාහ ජීවිතයක් ගතකරන්න අමාරුයි. මේ යසපාල ගේ භාර්යාව තරුණයි. පෙනුම යි. මේ ස්ත්‍රිය රූප ලක්ෂණයෙන් අඩුවක් නැති, සිත්ගන්නා ආකාර ගැහැනියක් විදියට හාමුදුරුවන්ට පෙනුනා ද?"

රාහුල තෙරණුවන් සත්‍යය ම ප්‍රකාශ කරන කෙයින්, උන්වහන්සේට අභිප්‍රායෙන් සිතාමතා උත්තර දීමට අවශ්‍යතාවක් නෑ. "මට ඇගේ විශේෂත්වයක් පෙනුනෙ නෑ. කුඩා දරු දෙදෙනෙක් ඇති, දුක්කරගා මැද ජීවත්වන සාමාන්‍ය කාන්තාවක් විදියටයි මම ඇය දකින්නෙ"

තම පිළිගැනුම් වූ පිළිතුර තෙරණුවන්ගෙන් නොලැබුණු නිසා ජීසිඳු නැත සල්පාකාර කියා යළි කතාකෙළේ ය.



"හොඳයි, මේ පසුබිමැති විත්තිකරු සමග යසපාල ගේ තරුණ පෙනුමැති රූමත් බිරිඳ පළායාම ගැන හාමුදුරුවන්ට ඇසිවුණේ ඇහුණ්තක් ද අසාමැත්තක් ද?"

"රෝගී සැමියාත්, කුඩා දරුවන් දෙදෙනාත් අතහැර වෙනත් තරුණයකු සමග යාම වරදක් නෑ යි මට හැඟිණියා"

"ඊයින් අදහස් කරන්නෙ හාමුදුරුවො කැමතිවුණේ කමලාවතී කියන මේ ගැහැනිය පන්සලේ වත්ත අයිතේ ම සිටියා ගෙදර ඉන්නවා දකින්න — එහෙම ද?"

ජීසිඳුවර්යා නැත්කරන්නේ තමාත් කමලාවතීත් අතර අනියම් සම්බන්ධයක් පැවති නිසා පියදසට මුල සිට ම විරුද්ධ ව සිටි බවත් හා ඔහුගෙන් පළිගැනීම අරමුණුකොට ඔහු සිරගත කිරීම සඳහා බොරු සාක්ෂි දීමට පැමිණ සිටින බවත් උසාවියට ඇඟවීමට යයි රාහුල තෙරණුවන්ට නොවැටහේ. උන්වහන්සේ කවදාවත් උසාවියට පැමිණ නැත. උසාවි ගැන නීති ගැන කිසිදු අවබෝධයක් ද උන්වහන්සේට නොවී ය. එහෙත් හදවතට එකග ව සපල්වීමෙන් තොර ව ඇත්ත ප්‍රකාශ කරන තෙරණුවන්ට වැරදුනේ නැත.

"යසපාලගේ භාර්යාව ගෙදරින් පිට ව ගියේ ඇගේ කැමැත්තෙන් විය හැකි යි. එය කෙසේ සිදුවුවා දැයි මම දන්නෙ නෑ."

රාහුල තෙරණුවන් ලජ්ජාවට හෝ කෝපයට හෝ පත්කර සාක්ෂි කොටගෙන යැවීමටත්, පරස්පර විරෝධී කිරීමටත් අදහස් කළ ජීසිඳුයා කෝට් සාක්කු තුළින් දෑත ගෙන ඒ දෑත ඔසවා උස් හඬින් කතාකෙළේ ය. "මම කෙළින්ම ප්‍රකාශකරනවා මේ පියන කමලාවතී කියන ස්ත්‍රිය සමග අනියම් සම්බන්ධතාවක්

WWW.SINHALAELIBRARY.COM 103

තමා මුල සිට ම පවත්වාගෙන ගිය බව? මේ පළමුවැනි විත්තිකරු ඇය කැඳවාගෙන යාම නිසා හාමුදුරුවෝ ඔහු සමඟ වෛරයක් ඇතිකරගත්තා. මේ මිනීමැරුම සිදුවන විට හාමුදුරුවෝ සිටියෙ පන්සලේ?"

විනිශ්චයකාර තුමා නීතිඥවරයා වෙත හැරුණේ ය. කරදවුවක ස්වරූපයෙන් එතුමා නීතිඥවරයා අමතා සිටියේ. හරස් ප්‍රශ්නවලින් සිත්තුව කිලිටි චරිතයක් ඇත්තෙකැයි ඔප්පු කළ නොහැකි තැන, උපාලිය හමුවේ ගෙලින් ම උත්තමයන්ගේ ගේ චරිත ඝාතනයක් කිරීමට තමාට කිසියේ ම ඉඩදිය නොහැකි බව ය. අනතුරුව එතුමා රාහුල තෙරණුවන් ඇමතුවේ ය.

"ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේට තව දුරටත් සිත සංසුන්කරගෙන සාක්ෂිදීම කරගෙන යා හැකිද?"

"ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර තුමනි, මා පැමිණියේ මිනීමැරුමක් සම්බන්ධයෙන් මා දුටු දෑ ඇසූ දෑ ප්‍රකාශකිරීමට යි. නමුත් මෙහි දී මගෙන් ප්‍රශ්නකරනු ලබන්නේ වෙනත් කාරණා ගැනයි. මට මෙය නොතේරේ. මේ සියලු ලබන ස්ත්‍රීය සම්බන්ධව, වෙනයම් පුරුෂයෙකු සම්බන්ධව මගේ විශේෂ ඇල්මක් බැල්මක් හෝ බැඳීමක් නැති හෙයින් මම ඔහු කියන්න භාරගන්නෙ නෑ. මට වේදනාවක් ඇතිවූයේ නෑ. ඒ මා සිහිනෙනුදු නොසිතූ දයක් ඔහු ප්‍රකාශ කළ නිසයි. ඒ මා ගැන නොවේ. නමුත් මෙ වැනි ගරුගාම්භීර ස්ථානයක දී මා ගැන කිසිත් නොදන්නා පුද්ගලයෙක් මෙවැනි ප්‍රකාශයක් කිරීම ගැන මම පුදුමවෙනවා. විනිශ්චයකාර තුමනි, මා පැමිණියේ මා සිතැතින් දුටු දෑ ප්‍රකාශ කිරීමට හෙයින්, ඒ ගැන ප්‍රශ්න කරනවා දකින්න කැමතියි"



හමුව කල් තැබිණි. උපාලියේ කටවුත්‍ර මඳකට නවතා විනිශ්චයකාරතුමා තම කාමරයට නික්මගියේ ය.

* * *

පූජාරාම ශ්‍රී සුචරිත දහම් පාසලට පළමු දිනයේ ළමයින් පනලිස් එක් දෙනෙක් පැමිණි අතර, දෙ වැනි දිනයේ තිහක් ද, තුන් වැනි දිනයේ විසි අටක් ද, හතර වැනි දිනයේ පහළොවක් ද පැමිණිය හ. මෙය තමන් ගේ අවංක ප්‍රයත්නයක් ලද දරුණු පරාජයක් යි නන්දරාම සිතූ අතර, රාහුල ද එය පසුබෑමකැයි සිතුයේ ය.

"අපි කොච්චර මහන්සිවුණත් හාමුදුරුවනේ අපිට හදන්න පුළුවන් රටක් නෙමෙයි මේ. අපි පොල්ලෙන්න කොල්ලන්නෙ ආගා අනගැඹවෙන් ගෙයයි. අන්තිමට අපිට අහගන්න වෙන්නෙ ගරහ නාමය යි" නන්දරාම හතර වැනි දිනයේ දහම් පාසල පවත්වා එය අවසානයේ පෙරළා ගෙවල් බලා යන දරු පිරිස බලා කීවේ ය.

දහම් පාසල මගහැර සිටින්නෝ ප්‍රධාන දහමට හොඳුරු කළ යුතු යයි සිතාසිටි වයසක අවිනීත දරු දැරියෝ ම ය.

"මේ වේගයෙන් දහම් පාසල පිරිහෙන්ට ගියොත් තව සඳුරකට වැඩිය පාසල පවත්වාගෙන යාමට ලැබෙන්නෙ නෑ. සිත්හැත්ම නවතිනී"

"හේතුව මොකක් කියලද නන්දරාම හිතන්නේ?"

"අපිට හදන්න වෙලා තියෙන්නෙ ළමයින්නෙ සිත් නොවෙයි.

WWW.SINHALAELIBRARY.COM 104

දෙමාපියන්ගේ සිත්. දෙවැනි දවසේ ළමයින් එකොළොස් දෙනෙක් නාවෙ ඉඳගන්න පුළු නොතිබුණු නිසා. තමන්ගෙ ළමයින් බිම ඉඳගන්නවාට ඒ ළමයින්ගෙ දෙමාපියන් කැමති නැ. ළමයින් පන්සල් ඉස්කෝලෙට එවන්නෙ තුටාළුවලට මෙහෙ දමන්න නෙමෙයි. සියලු ඒක ළමයෙකුගෙ අම්මා කෙනෙක් කියල කියනවා. අම්මා ඒ ළමයට එවල කියන්නෙ දහම් පාසල් සහතිකයක් ලබාගන්න. ඊයි අට එක පාරට පසළොවට බහින්න හේතුව පිංදුන්නු මට කීවා. අපි දෙන්නා බොරු බණ ළමයින්ට උගන්වනවද......"

රාහුල තෙරුණුවෝ පුදුම වී බැලූ හ.

"සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය ගැන කියද්දී ඔබ වහන්සේ ළමයින්ට බොරු බණ ඉගැන්නුවද. සිදුහත් කුමාරයා ඉපදුණු මොහොතේ ම නෙළුම් මල් හතක් උඩින් ගමන් ගැනීමත්, අග්ගෝහමස්මි ගාථාව ප්‍රකාශ කිරීමත්, සිද්ධාර්ථ චරිතය මිනැවට වැඩිය ඔසමට්ටම් කරන්න කර තිබෙන නිර්මාණයක් කියල ඔබ වහන්සේ කියනවා මටත් ඇහුනා. ඒ ළමයි ඒ කතාව ගෙදර ගිහිං කියා තියෙනවා. පොතේ නැති බණ, පාහපු බණ අපි ළමයින්ට උගන්වනවා කියල අපි දෙන්නට ම බැණල අම්මල ළමයින්ව නවත්වාගන්නා"

රාහුල තෙරුණුවෝ විමසාරුදු කතා නොකළ හ. බොහෝ කලකට පසු දරුණු සිත් වේදනාවක් හා කලකිරීමක් උන්වහන්සේට ඇති වූ මොහොත මෙය විය.

පොඩි ළමයින් හදන්න පටන් ගත්තේ ලොකු ළමයින් හා වැඩිහිටියන් හදන්න නොහැකි නිසා ය. දන් ලොකු අය ගේ බලපෑම නිසා පොඩි ළමයින් හදාගැනීමට ඉඩක් නැත.



බොරු බණ ගැන කතාවක් ඇසීමීමට එදා මේ වැනි සිද්ධියක් සිදු වූ බව රාහුල තෙරුණුවන්ට මතක තිබිණි. සිද්ධාර්ථ කුමාරෝත්පත්තිය සිදුවන අවස්ථාවේ දී ඇති වූ ආශ්චර්ය ගැන පොතේ ඇති විදියට රාහුල තෙර පාඩම විස්තර කර දෙමින් සිටියේ ය. හොඳමට බුද්ධියක් ඇති දරුවකු පොතට සිටින් බණ ඉගැන්වීමට තෙරුණුවන්ට බුවමනාවක් නොතිබුණ ද, උපන් හැටියේ ම සිදුහත් කුමරා නෙළුම් මල් උඩින් ඇවිද්ද කියන්දීත්, "අග්ගොහමස්මි ලෝකස්ස - ජෙට්ඨොහමස්මි ලෝකස්ස - සෙට්ඨොහමස්මි ලෝකස්ස - අයමන්තිමා ජාති - නත්ථි - දානි පුනබ්භවෝ" යන ගාථාව විස්තර කරද්දීත් පන්තියේ දොළොස් හැවිරිදි තරමේ ළමයෙකුට සිනා ගියේ ය. සිනාවට කාරණය කුමක් ද යි ප්‍රශ්න කරද්දී ඒ ළමයා මේ සේ උත්තර දුන්නා තෙරුණුවන්ට මතක ය. "උපන් ගමන් කතාකරන්නෙ, ඇවිදින්නෙ කොහොමද හාමුදුරුවනේ? මිය කතාව පිළිගන්න බැ. අනිකා අර ගාථාව හරි කයිවාරුවක්නෙ"

රාහුල තෙරුණුවන් ළමයා ගේ කතාවට පැහැදුනේ ඔහු බුද්ධිමතෙකු යි සිතූ නිසා ය. ළමා වයසේ සිටියත් උසස් බුද්ධි මට්ටමකින් යුතු එක දරුවකු ගේ තම පාසලේ සිටීම ගැන උන්වහන්සේ සතුටට පත්වූ හ. තමන් එහි දී පන්තියේ සියලුම ළමයින් අමතා මේ සේ ප්‍රකාශකර සිටි බව තෙරුණුවන්ට මතක ය.

"ඔය ළමයි පොතේ කියන විදියට බුද්ධ චරිතය ඉගෙනගන්න. නැත්නම් විභාගවලට උත්තර ලියන්නත් පාස්වෙන්නත් බැරිවෙනවා. ඒත් මං ඔය ළමයින්ට එකක් කියන්න ඕනැ. සිද්ධාර්ථ චරිතය මුළු සිට අග දක්වා ම අදහාගන්න බැරි කොහෝ අද්භූත සිද්ධිවලින් ගහණ යි. ඔය

ළමයින්ගෙ බුද්ධි වර්ධනය මෝරණකොට ඒ ඒ හැන් පැහැදිලි වෙයි. දනට මෙන්න මේ කාරණය පමණක් සිහියේ තබාගන්න. සිද්ධාර්ථ කුමාරයාත් ලේ මස්වලින් හැදුණු. ඔය ළමයින්ට බොහෝ සමානකම් ඇති දරුවෙක්. මුල සිට ම ඒ කුමාරයාගේ විශේෂත්වයක් තිබුණේ, බුදුවීම සඳහා කල්ප කාලාන්තරයක් මුළුල්ලේ පෙරුම් පුරා පැමිණීම නිසා සෙසු ළමයින්ට වඩා උසස් බුද්ධියකුත්, යහපත් හැසිරීමකුත්, දයා කරුණා ගුණයකුත් තිබීම යි. සිද්ධාර්ථ කුමාරයා උපන් හැටියේ ම ඇවිද්දේ ය, කතා කළේ ය, අහසේ පලක් බැඳගෙන වැඩ සිටියේ ය කියන සිද්ධි නොපිළිගන්නත් සිද්ධාර්ථ චරිතයේ ශ්‍රේෂ්ඨත්වයේ අඩුවක් වෙන්නේ නෑ, ඒ කතා මෝඩ මිනිසුන් ගේ ශ්‍රද්ධා ශක්තිය වැඩිකරන්න ඉස්සර සිටපු අපේ හාමුදුරුවන් ගොතාපු කතා. බුදුරජාණන් වහන්සේ ශ්‍රේෂ්ඨයෙක් කොට අපි සලකන්නෙ, උන්වහන්සේ ගේ ධර්මය අපි පිළිගන්නෙ, ගරු කරන්නෙ මේ කියන විදියේ උපන් හැටියේ ඇවිද්ද නිසාවත්, කතා කළ නිසාවත්, අහසේ රැඳී සිටි නිසාවත් නොවෙයි. උන්වහන්සේ ගේ ශ්‍රේෂ්ඨ පැවැත්මත් ශ්‍රේෂ්ඨ ධර්මයත් නිසයි. අපිට පොතේ සත්‍යය මේය වුවත්, දහම් පාසල් විභාගයේ දී "සිද්ධාර්ථ කුමාරෝත්පත්තියේ දී සිදු වූ ආශ්චර්ය කවරේ ද?" යන මේ ප්‍රශ්නයට පිළිතුරු වශයෙන් "ආශ්චර්ය නම් කිසිත් සිදු නොවී ය. එහෙත් විශිෂ්ට ඥානයකින් ද ගුණ නුවණින් ද හෙබි සිත්ගන්නා සුළු නිරෝගී දරුවෙක් හිමිවිය" කියල ලිව්වොත් ඔය ළමයින්ට එක ලකුණක්වත් ලැබෙන්නෙ නෑ. ඒ නිසා පොතේ හැටියට මං දහම් කියාදෙන විදියට උත්තර ලියන්න"



දවල් දනය වළඳ, කෙසෙල් කොටියක් ලෙලි ඇර කමින් රාහුල කෙරඹුවන් ගේ මුහුණ බැලූ නායක ස්ථවිරයෝ මෙසේ ඇසූ හ. "රාහුල අද මොකද බර කල්පනාවකින්?"

රාහුල කෙරඹුවෝ උත්තරයක් නොදී සිනාසෙන්නට උත්සාහ කළු හ.

චන්ද්‍රාරාම රාහුල වෙනුවෙන් කතාකළේ ය. "දහම් පාසල ගැන රාහුල හාමුදුරුවන්ගෙ සිත බිඳිලා"

"ළමයින් බොහොම ටික දෙනයි නේද දන් එන්නෙ?"

"එහෙමයි. ඒ ළමයි ටිකත් නවතියි කියලයි මට සිය......"

"රාහුලට දන්වත් තේරෙනවා ද ගමේ රටේ හැටි. මාත් ඔබට කතා රාහුල. මං ඔය මිස්සෝම් අල්ලලදෙල ඉන්නෙ කරන්න කැමැත්තක් නැති නිසා නොවෙයි, ඕවා කරන්න බැරි නිසා. හොඳයෝම හොඳ චේතනාවෙන් අව-කව වැඩක් කරන්න ගියොත් අන්න ඒකට තමයි ආයුෂ අඩු. අන්තිමට හිත හරස්කරගන්න තමයි වෙන්නෙ. රාහුලට අපේ ගම්වල මිනිසුන් ගේ හැටි තාමත් අඳුරගන්න බැරි වෙච්ච හැටි"

"ළමයින් ගැන ප්‍රශ්නයක් නෑ නායක හාමුදුරුවනේ, ළමයින්ට නොමග යවන්නෙ ළමයින්ට අපෙධර්යට පත් කරවන මෝඩ දෙමාපියො. මං හිතාගත්තා නැවතත් ඒ ළමයින්ගෙ ගෙවල්වලට ගිහිං දෙමව්පියන් හමුවෙලා කතාකරන්න. එක ළමයෙක් ආවත් මම ඒ ළමයට උගන්වනවා" රාහුල කෙරඹුවෝ කී හ.

චන්ද්‍රාරාම ස්ථවිරයෝ රාහුල කෙරඹුවන් දෙස බොහොතක් බලාසිට අතේ තිබූ කෙසෙල් ලෙල්ල ජනේලයෙන් ඉවතට විසිකොට දෑත පිසගත් හ.

"අපේ බණ මඩුව අලුතින් ම හදුවොත් හරක ද රාහුල? මොනොව පරණයි දන්, මම මහණවෙන්නත් කලිනුයි හදල තියෙන්නෙ. පිංකම් කරල මේ කාලෙ සල්ලි හොයන්න අමාරුයි, ලමයින් හොයහොයා ගෙවල්වලට ගිහිං කාලෙ නාස්තිකරනවට වැඩිය හොඳ නැද්ද, ගමෙයි අහළපහළ ගම්වලයි සල්ලිකාරයො තියෙන ඇත්තනට හම්බුවෙන්න ගිහිං දෙන්නත් එක්ක මට රුපියල් හත්අට දහස්වත් හොයාදෙන්නෙ නෑ? මට පුලුවන් මහෙනුත් දල බණ මඩුවක් ලස්සනට හදන්න. කෙළවරේ උස වේදිකාවක්. වේදිකාවට පස්සෙන් කාමර දෙකක්. ඕනෑම දේකට එකකොට ප්‍රයෝජනය ගන්න පුලුවන්. ශාලාව වටේ දොර ජනෙල්. අවුරුදු හතරක් පහක් ගියාට කාපි නෑ, අපි හෙමිහිට විකින් වික කරල බලමු බලන්න"

නායක ස්ථවිර නිකම්මිය සඳු නන්දාරාම රාහුල ගේ මුහුණ බැලුවේ ය. නායක ස්ථවිරයන් යෝජනාවක් කළ විට එය ස්ථිරකරන්නට අද වැන්නෙක් අවශ්‍ය නොවන බව තරුණ පැවිද්දන් දෙදෙනා ම දනිති.

"ඔන්න අපිට වැඩක් උන්නා. ලොකු හාමුදුරුවො කියන්න එහෙ රට හැදිල්ල ළමයින් හැදිල්ල පැත්තකින් තියල සල්ලි හැදිල්ල පටන්ගනිමු ද? ළමා පරපුර පොඩිවම [illegible] බලල සන්තෝෂ වෙනවට වැඩිය. බණ මඩුව ගොඩාවීත් ගෙවල බැඳිල වැඩ ඉවරවෙනවා දකල සන්තෝෂවෙන්න අපිට පුලුවන්වෙයි"

"ආශ්චර්ය වෙන්න හරකයි. අපි ඔය දෙකම කරන්න බලමු. වැරදියට හැදෙන එක ළමයිනුයි හොඳ හරක කියදිල මේ මගට ගන්න එක, බණ මඩුවක් හදන එක තරම්ම වැදගත්"

නන්දාරාම තෙරුණුවෝ නිහඬවූ හ. උන්වහන්සේ ගේ





සම්බන්ධයෙන් හව ද්‍රව්‍ය සහා නොයෙකෙකේ ලෞකික පැත්තකට වඩා ලෝකෝත්තර පැත්තකට රාහුල තෙරුණුවන් වඩා නැඹුරු වී සිටිනැයි යන හැඟුම ද වැඩි වී උන්වහන්සේට ඇති වූ හෙයිනි.

* * *

සෝමාරාම ස්ථවිරයෝ දන් කමලාවතී ගැන උනන්දුවක් නොදක්වති. පන්සල දෙගොඩවන වැඩ නොකිරීමට පසළ වූ නැමුණු ප්‍රධාන හේතුව යි. රාහුල ගේ පැවැත්ම තමන් විසින් අද්දිසෙවී ගත යුතු යයි උන්වහන්සේ අධිෂ්ඨානය කොට සිටිති. තමන් දන්නා තමන් ගේ රහස් පිටස්තරයෙකුට දැනගන්නට ඇලුමෙකෙ දරු දෙදෙනාකුට සමාන තරුණ පැවිද්දන් දෙදෙනාට ද අනුණ්ඩයක බව උන්වහන්සේ ගේ හැඟීම විය.

නායක ස්ථවිරයන්ගේ මේ වෙනස කමලාවතී ද තේරුම්ගෙන සිටී. නායක හාමුදුරුවන් සමඟ පවත්නා මිතු සම්බන්ධතාව පළුදුවීම තමාගේත් තම දරු දෙදෙනාගේත් පැවැත්මට බාධකයක් බව ඕ කල්පනාකරයි. පන්සල් වත්තත්, තම වත්තත් අතර කෙරෙන ඉණි වැට අස්සෙන් ඕනෑම වෙලාවක පන්සල් වත්තට ඇතුල්වීමට තිබෙන ඉඩකඩ කඩුකම්බි ගසා වෙන්කළහොත් තමන්ගේ ඉරණම කෙසේ විය හැකි දැයි, ඇයට සිතාගත හැකි යි. අඩුගානේ මයකට වරක්වත් හමුවී, සම්බන්ධතාව අඛණ්ඩව පවත්වා ගෙන යාම ඇගේ අභිලාෂය යි.

WWW.SINHALAELIBRARY.COM 107

මියගිය කම සැමියාගේ අගයත් ගුණයත් වෙන කවරදාකටත් වඩා ඇයට දැන් මතක්වෙයි. නිතර රෝඩිවක් වශයෙන් හෝ සැමියා ගෙදර උන්නා නම් ඇයේ සිතට බරක් නැත. ඒ විතර ම බියකුත් නැත. ඇතැම් රාත්‍රියක කමලාවතීට යසපාල සිහිනෙන් පෙනී පිපාසය බව දන්වා බීමට වතුර ඉල්ලයි. නින්දෙන් ඇහැරෙන කමලාවතී පහන්කරන්නේ හැඬූ කඳුළිනි. නායක හාමුදුරුවන් හමුවීමට ඇයට විශේෂයෙන් වුවමනා වූයේ, මිනු වෙනුවෙන් තුන් මාසයේ දානය දිය යුතු යයි සිතෙන්ට වූ බැවිනි.

පන්සලට ගොස් නායක හාමුදුරුවන් හමුවිය හැකි වුවත්, කමලාවතී වඩාත් කැමතිවූයේ නිහඬ නිසසල විහාර භූමියේ දී ම උන්වහන්සේ හමුවීමට ය. දෙ දිනකට පසු, එ වැනි අවස්ථාවක් උදාකරගැනීමට කමලාවතී සමත් වූවා ය. ළමයින් දෙදෙනා ගෙදර නවතා කම වින්න දිගේ ම උඩතට ගිය කමලාවතී එ තැනින් කුරුන්දට මිංගා කන්ද නැග විහාර භූමියට ඇතුල්වූවා ය. නායක හාමුදුරුවන් කන්ද නැග විහාර භූමියට යනබව පැහැදිලි ව දුටු නමුත් උන්වහන්සේ සිටි තැනෙක නැති බව දුටු කමලාවතී අන්තිමට පහළ රබර් කට්ටිය දෙස බැලුවා ය.

නායක ස්ථවිරයෝ පොඩි ළමයෙකු මෙන් පරණ පාළු ළිඳට ගල් විසිකරමින් සිටිති. ළිඳ තුළට ගලක් දැමූ කල ළිඳ තුළින් ප්‍රදුම්භාකාර ශබ්දයක් ඇසීමයුතු වේලාවකට පසු ලබාගත හැකි ය. ඒ ශබ්දයට සවන්දීමට සාමණේර අවදියේ සිට ම පෝසිරාරාම ස්ථවිරයෝ කැමැත්ත දැක්වූහ. ළිං කටින් ඇසෙන දෝංකාර ශබ්දයට සවන්දුන්නත්, ළිඳට කරගොටා බැලීමට ස්ථවිරයන් කවදාවත් කැමැත්ත දැක්වූ නැත.



“ලොකුහාමුදුරුවො පොඩි එවුන්ට කරන වැඩනෙ කරන්නෙ?”

ස්ථවිරයෝ, තමන්ට උස තැනක සිටින කමලාවතී දෙස හිස ඔසවා බැලූ හ. හිර බැසයමින් සිටියේ නමුත් කමලාවතීට පිටුපසිනි. ඇය කම වින්න රෙද්දක් හැඳසිටින නිසා තරුණ ව සිටින අයුරක් පෙනේ.

නැවතත් තමන් වළට වැටෙන්ට යන බවක් පෝසිරාරාම ස්ථවිරයන්ට හැඟුණේ යටිකන්කර සිට හැඟීම් දැඩි ලෙස ඉස්මතුවන්නට වූ හෙයිනි. හැඟීමට වහල් විය යුතු ද, නැත්නම් අර්බුදය පිළිගෙන නිහඬව කල යුතු ද යි බිම බලාගෙන කල්පනාකරමින් සිටිය දී, රාහුල පෙරළුවත් ගේ රුව උන්වහන්සේගේ අදිටියේ මැවී පෙනිණි. රාහුල, ස්ත්‍රිය ගේ ඒ රුව හා ඒ නිමිත්ත සියැසින් දැක, ඒ ක්ෂුද්‍රාකාර මෙන් ඉවතට ඇදෙන දර්ශනය ස්ථවිරයින් ගේ සිතේ ඇඳිහියේ ය. 'එපා මිනැ නෑ' යයි ස්ථවිරයෝ දැඩි ලෙස තමන්ට කියාගත්තෝ ය. 'ඒ කාටපුත්ත ඉවරයක් කළ හැකිදමින් ඒ වෙලාවට මං හිතුවෙ ඒ තැනින් එහාට නෑ, එච්චරයි, මිනැ නෑ ආයින් කියලයි. තමුන් මට බැරිවුණා. රාහුල මං වගේද? තරුණයෙක් නොවැ. මිය ගුන්නෙ අපූර්වට. මීක තමයි මහන්සෝවම මුල. ආයින් ඒ වෙටන්නෙ නෑ මම. බැලුවාම ඇති දේකුත් නෑ. කරනවෙන්න මිනැත් නෑ. තමුන් යාථකාමිකුත් එපා. ඇඟට නොගෙන උන්නාම ඇති......”

ස්ථවිරයන් විහාර භූමියට ගොඩවූයේ වියළි රබර් කොළ පට පට්පයින් සිටින් දැයි යන කැන සිත ඇති ව මෙනි.

“ලොකු හාමුදුරුවො මාත් එක්ක තරහවෙලා වගෙ? මං නම් වැරැද්දක් කළේ නෑ. හාමුදුරුවො අවවාද කළ විදියට මගේ සාදුවට ජීවත් වෙනවා. එද කඩ ගන්න පන්සලට ආවු

WWW.SINHALAELIBRARY.COM 108

වෙලාවෙත් හාමුදුරුවො මගෙ මූණ බැලුවෙ නෑ?"

"ඔව්. මම කමලාවතී ගේ මූණ බැලුවෙ නෑ තමා"

"ඇයි හාමුදුරුවනේ මං වරදක් කළැයි?"

"කමලාවතී මට වරදක් කෙළේ නෑ. ඒ වුණාට මම කමලාවතීට වරදක් කළා. කමලාවතීට පමණක් නම් මොකද, ඒ ගැන තමයි මම මේ දවස් විශේෂම හිතුවෙ. මේ ප්‍රථානෙට...... මේ චීවරේට...... පොඩි උන්නාන්සේලා දෙනමට......" සෝමාරාම ස්ථවිරයන් කතා කරන්නේ, පුළුතට පැළෙන පොළ ඇති බෝ රුක දෙස බලාගෙනය. "මට පොඩි දෙනමක් ඉන්නවා. ඒ පොඩි දෙනමට ආදර්ශයක් දෙන්න ඕනෑ මම යි. මම මේ විදියට වැරදි විදියට හැසිරෙන එක හොඳ මදි. රාහුලගෙ හැසිරීම පේනවා නොවැ? මං ඒ ඇත්තන්ගෙ මූණේ දළියාගත එක හොඳ වැඩක් නොවෙයි. කමලාවතීට උදව්වක් ඕනෑ කරනවා නම් දෙන්න බැරියැ...... ඒ ඇරෙන්න වෙනද වගෙ මං දිහා අමුතු විදියට නොබැලුවාට කාරි නෑ. දැන් ඕනෑකමකට මාව හොයාගෙන ආව නම් කිව්වනම් බලන්න කාරණය....?"

සුළුමයට මෙන් කමලාවතීට අමුතු දුකක් මේ වෙලාවේ ඇතිවූයේ නැත. ජීවන මාර්ගයක් වශයෙන් ඒ දේ කළත්, ඇයේ සිතටත් ඒ කටයුත්ත ගැන කැමැත්තක් තිබුණේ නැත. එය හාමුදුරුවන්ට මීසිරි කැම වගෙ වුවත්, තමාට නම් තිත්තට දුම්බ වතුර බොන්නා වාගේ වැඩකැයි ඇයට සිතේ.

"හොඳයි හාමුදුරුවනේ......"කමලාවතී කියේ ප්‍රශ්නයට උත්තරයක් වශයෙන් නොව නායක ස්ථවිරයින්ගේ මුළු කතාව ම අනුමත කරන්නියක වශයෙනි.

"කිව්ව නම් ආපු කාරණය?"



"හාමුදුරුවනේ, මගෙ මැරිච්ච මනුස්සයා දැන් හත් අට දවසක් ම මට හීනෙන් පෙනුණා. හීනෙන් හිටගෙන වතුර ඉල්ලනවා. මං කල්පනාකෙළේ හාමුදුරුවනේ පොඩි ස්වාමීන් හරි තුන් මාසෙ දනෙ දෙන්න ඕනෑයි කියල...... තව කියන්නෙත දන දවස යි"

"ඔව් ඒක හොඳයි. හත් අට නාමකට අට පිරිකරකුත් එක්ක දනෙ දෙන්න පුළුවන් නම් ඒ කරපට හොඳයි. ඔය වැඩිපුර දර්‍ශමේසම් කැම බීම ඕනෑනෑ නෑ. ඔහට වැංජන දෙක තුනකුයි...... බත් ප්‍රඩත්ත ටිකකුයි තිබුණොත් ඇති මදයි. අට පිරිකරක් නම් පන්සලෙන් ගන්න බැරියැයි. දන සාළමතා ඇතැති විදියට ඇනට කර ගන්නොත්......"

නායක ස්ථවිරයෝ එක් හැනක එළි හොටිට කියාගෙන ගොස් පල්ලම් බසිනු පිණිය පඩි පෙළට බැස්සහ.

"එහෙනම් තමයි මිනෙ හැටි. වෙනද මා පස්සෙන් කැරකෙනවා. අද මට උන්නාන්සෙ පස්සෙන් එළවන්න වෙලා...... කමක් නෑ පොයිය වෙන්නෙත් හොඳටලු" කමලාවතීට සිතිණි. දනයට ත්‍යාගිකාරම් මුදලක් ලබා ගැනීම පිළිබඳව හාමුදුරුවන්ට කතාකරන්ට කමලාවතීට ඕනෑකළත් උන්වහන්සේ පිටුපසින් එළවරලුවා ඒ ගැන කතාකිරීමට නොහැකි හෙයින් පල්ලිත පන්සලට ම ගොස් ඒ ගැන කතාකිරීමට සිතා නැවතුණා ය.

කමලාවතී පල්ලම් බැස යන ස්ථවිරයන් දෙස ම බලාසිටී. "ඔය කිව්වට දැන් ඉතිං නම් ගෙන දිගාරල ඉල්ලන දේ දෙන එකක් නෑ. මිනිහත් මළා. පියදසත් නෑ. දැන් නම් නැති එකමයි හරිය. හාමුදුරුවොත් එකපාරට අයින්වුණා. මට කැමැත්තෙන් මෙහෙම ඉඳල බෑ. ගෑණි මැරිච්ච පොරෝලිස් නම් මට පිහිට කළා මිදි නැද්ද, මං තාම කෙල්ල වගෙ කියල. මං ඒ වෙලාවේ

WWW.SINHALAELIBRARY.COM 109

පොරෝලිස්ට දුන්නු උත්තරේ හොඳ මදියි කියලයි මට දැන් හිතෙන්නෙ. මං කෙල්ල වගෙ නම් කොල්ලො එපායි මං දිහා බලන්න. මොටද නාකි මං දිහා බලන්නෙ කියලයි මං කිව්වෙ, මං ඒක එහෙම පොරෝලිස්ට කිව්වෙ හාමුදුරුවො නිසා වෙන්න ඇති. ඇයි හාමුදුරුවොම නෙ මට කියල තියෙන්නෙ වෙන පිරිමි දිහා නොබැලුවාට කමක් නැ කියල. කොයි වෙලාවක හරි පොරොලිස් හම්බුවුණොත් කියනවා මං එදා කිව්ව කතාවට තරහවෙන්න එපා යි කියලා. පොරෝලිස්ට ඉන්නෙ එක ඉලංදාරියයි. ඒකත් අරායි යන්න හදනවා. එතකොට ඉකිං කරදරයක් ඇතැයි...... ලොකු හාමුදුරුවන්ට තරම්වත් වයසක් නැ පොරෝලිස්ට'

කමලාවතී රත්මලා පඳුර ළඟ නැවතුණා ය. රත්මලා කියන ජාතියේ මල් කරු ඉදුණු ගෙඩි හැමදෙමත් තිබේ. ඉදුණු ගෙඩි අටක් කඩාගත් කමලාවතී ඒ එකක්වත් නොකා, අතේ තබාගෙන පල්ලම් බැස්සා ය.



# 13

රාහුල කෝරළේවත් සම්බන්ධව පුවත්පත්වලින් ගමේ මිනිසුන් දැනී ව කතාබහ් කරන අවස්ථාවක, ඉරිද පුවත් පතක විශේෂ ලියුම්කරුවෙක් පූජාරාමයට පැමිණියේ ය. පන්සලට පැමිණීමට පුථම, ලියුම්කරුවා ගමේ මිනිසුන්ගෙන් රාහුල කෝරළේවත් ගැන තොරතුරු රාශියක් සොයාගෙන තිබිණි. අභියෝජක්තියෙන් පිරුණු ඒ කතා ඇසූ ලේඛකයා බලාපොරොත්තු වූයේ සම්වත් පුවයෙන් දවසේ වැඩි කාලයක් වැඩවසන යෝගියෙකු බඳු කෙනෙකි. එහෙත් ඔහු පියවි දෙනෙතින් දුටුවේ, කිස් හැඩිදි විය නොහැකි වූ, ඇස් හැර බලන, මදහස නගන, පා මෙයවා ඇවිදින කරුණ ශිෂ්‍යුවෙකි.

පත්‍ර කාර්යාලයේ නමත්, පත්‍රයේ නමත් තමාගේ නමත් හෙළිකළ ලේඛකයා තමා සමඟ පැමිණි ඡායා ශිල්පියාත් රාහුල කෝරළේවත්ට හඳුන්වාදුන්නේ ය.

"මහත්තයලා ආපු කාරණය දැනගන්න පුලුවන් ද මට?"

www.sinhalaelibrary.com

අමුත්තන් වාඩිගැන්වූ තෙරුණුවෝ කාරුණික ව කී හ.

"ඔබ වහන්සේ ගැන විශේෂ ලිපියක් පත්‍රයට ලියන්න මට ආරාධනයක් ලැබුණා. මං හිතන්නෙ සමාගමේ සභාපතිගෙන් අපේ පත්‍රයේ කර්තෘට ලැබුණු විශේෂ ඉල්ලීමක් අනුවයි මට මේ කාර්යය පැවරුණේ"

රාහුල තෙරුණුවෝ අහිංසක ව සිනා පහළ කළ හ.

"මා ගැන විශේෂ ලිපියක් තබා සාමාන්‍ය ලිපියක් ලියන්න තරම්වත් මගේ වැදගත්කමක් ඇතැ යි මම හිතන්නෙ නෑ. අනෙක් බොහෝ ස්වාමීන් වහන්සේලාට වඩා මා වෙනස් විදියකට සිතන බව ඇත්තක් වෙන්න පුළුවන්. ඒත් මගේ සිතුම් අනුව ක්‍රියාකරන්න මට අවස්ථාව ලැබෙන්නෙ බොහොම කලාතුරකින්. මම තවමත් අඳුරේ අතපත ගාන්නෙක්. මගේ සිත ඇතැම් අවස්ථාවල තවමත් සැලෙනවා. සසලවෙනවා. බලාපොරොත්තු පහළවෙනවා. ඒවා අසාර්ථක වූ විට වේදනාවක් හැඟෙනවා. සංවේගයක් කලකිරීමක් පහළ වෙනවා. ඒක එහෙම නම් මහත්තයා මගෙ ඇති විශේෂත්වය කුමක් ද? මගේ සිත නිහඬ වූ දා මා ගැන කැමති ආකාරයට ලියන්න ඉඩ මහත්තයාට ඉඩ දෙන්නම්. දැන් මා ගැන මොනම ලිපියකවත් මොනම වාර්තාවකවත් ලියනවාට මගේ කැමැත්තක් නෑ"

"සමාවෙන්න. ඔබ වහන්සේ වැනි බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක් ගැන දැනගන්න කියවන්න හැම මිනිසෙක් ම කැමති වේවි........"

"මගේ විශේෂත්වය කුමක් ද මහත්තයා?"

"ඔබ වහන්සේ වැනි නිවී සැනසුණු භික්ෂුවක් මගේ මේ ඇස් දෙකින් මෙයට පෙර දැකලා නෑ. මහජනයාට එය ම ප්‍රමාණවත්.



අද ඒ වැනි පැවිද්දෙකු දක්නටවත් නෑ. රටේ මුළුමහත් බෞද්ධ ජනතාවගේ ම අවධානය ඔබ වහන්සේ වෙත යොමුවේවි හාමුදුරුවනේ. මිනිසෙකුට ලබාගත හැකි ඊට වැඩි ජයග්‍රහණයක් නැතැ කියන එකයි ස්වාමීන් වහන්ස මගේ නම් අදහස"

"මම බෞද්ධ භික්ෂුවක් නොවෙමි මහත්තයා........ කීර්ති ප්‍රශංසාදිය ප්‍රසිද්ධිය මට අවශ්‍ය නෑ. බොහොම සැහැල්ලු නිහඬ ජීවිතයක් මම ගතකරන්නෙ. මහත්තයා අදහස් කරන කීර්තිය ප්‍රසිද්ධිය මට බොහෝ හානිදායක විය හැකියි. එය තැදෙන පැලෙටියකට ප්‍රවර්ධනාවට වඩා පොහොර යෙදීමක් විය හැකියි"

ලේඛකයා ගේ ආකල්පයෙහි දැඩි වෙනසක් ඇතිවූවා සේ පෙනිණි. ඔහු වඩාත් උනන්දුවී ය.

"සුවඳ හමන මලක් කැලේ පිපී තිබෙනවා. කිසි කෙනෙක් ඒ බව දන්නෙ නෑ. ගුණ සුවඳින් පිරී මලක් කැලේ සෝ පිපී තිබෙන බව ජනතාවට දැනගන්න ලැබෙනවා නම්, ඔවුන්ගේ අවධානය ඒ වෙත යොමුවෙනවා. මට අවශ්‍යවන්නේ අන්න ඒ පණිවිඩය ජනතාවට දීමට යි. මම අදහස් කෙළේ ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේ, රටට හඳුන්වා දීමෙන් ඔවුන්ගේ චින්තනය තුළ ප්‍රබෝධයක් මෙන් ම, සුවදායක ආස්වාදයක් ජනිත කරවීම යි"

"බොහොම හරි මහත්තයා. එහෙත් ඒ මලක් නොව මල් කැකුළක් පමණක් නම්? එ සේ නම් මිනිසුන් ගේ සිත් තුළ පහළවන්නේ කුතුහලයක් පමණයි. මිනිසුන් ගේ කුතුහලය ඇවිස්සීමට මා යොදාගන්නේ කුමට ද මහත්තයා?"

"ඔබ වහන්සේ ගේ පරමාර්ථයක් අරමුණක්, සම්භූත් නිවී

WWW.SINHALAELIBRARY.COM 111

සැනසී, අනුන් ද නිවා සැනසීම යයි මම සිතනවා?"

"බොහොම හරි මහත්තයා. ඒක තමයි මගේ අපේක්ෂාව. නිවන, නිවී සැනසී සිටීම. ඒකට පරමාත්මයා කියල කිසිවක් වරදක් නැ. එහෙත් මා සවිමත් පසුවන්නේ එහි මුවවිටේ නම්.......... නැත්නම්, මුව විටට ද ආසන්න ස්ථානයක නම්, මගෙන් සෙසු සත්ත්ව සාරිකාරයකින්වත් ප්‍රයෝජනයක් නැතු නොවේ ද?"

"එස් ස්වාමීන් වහන්ස, අපේ සිත් වශීකරනසුලු නිවාසනාසනසුලු විශේෂත්වයක් ඔබ වහන්සේ තුළ දකිමින් පවතිනවා. ඒ දකුම් පමණක් වුවත් ජනතාවට ප්‍රමාණවත්. අපිට දකින්න ලැබෙන්නෙම සිත් සසල කරවන කුසිත කරවන දර්ශනයයි"

"මහත්තයා ඒ දෙස ම බලන්නේ ඇයි? බලා එවා සිතේ රඳවාගන්නේ ඇයි? ඉවත්වෙන්නකො. සිතේ රඳවා නොගන්නකො. දුටු බව හෝ නුදුටු බව හෝ නොසිතන්නකො......"

"අපට ආදර්ශය පිණිස, අපේ සිත් සතන් පුබුදන් කරනු පිණිස නැප ව සිටින පිරිස දෙස බලා හෝ සැනසුමක් නැද්ද ස්වාමීන් වහන්ස, කුමක් දෙස බලා සැනසෙන්න ද?"

"බුදු කුටියකට ගොස් සමාධි පිළිම වහන්සේ ඉදිරියේ පසුවෙනවා නම් මහත්තයාට ඉතා ගෞරව සුවදායක සිහිවීම පහළකරගත හැකි නොවේද? මහත්තයා දකින්න කැමති පුද්ගලයා – සත්‍යාවබෝධ කරන – දෙපා නගා ඇවිදින ලෝකොත්තර පුද්ගලයෙක් විය හැකි යි. එවැනි උත්තමයකු සජීවත්වයෙන් දකින්න මිනිස් කැමති යි. ඒ සඳහා තමයි මහත්තයා මෙම ගමන යන්නේ"



ලේඛකයා සතා නැගිට කොරණුවන් දෙස බලාගෙනවත ම සිටියේ ය. අනතුරුව හුන් අසුනින් නැගිට දණ බිම ගසා කොරණුවන් නමැද නැගිසිටියේ ය.

"ඇයි මහත්තයා?"

"නැතැ ස්වාමීන් වහන්ස, ඔබ වහන්සේ අනාගාමී ය. මට හිතෙනවා ඔබ වහන්සේ සිසියම් මාර්ග ඵලයක් ලබා ඇත ය කියා?"

"මම ඒ බවක් දන්නෙ නෑ මහත්තයා. මට මහත්තයාට කියන්න තිබෙන්නෙ මේ පමණයි. මම බුදුරජාණන් වහන්සේ ගේ ශ්‍රාවකයෙක්. නිරතුරුව මම ඒ බව සිතනවා. ඒ අනුව ක්‍රියාකරන්න උත්සාහ කරනවා. අන් අය කෙසේ සිතනවාද, ක්‍රියාකරනවා ද යි මම දන්නෙ නෑ. ඒ ගැන සොයන්න මම වෙහෙසෙන්නේ කුමට ද මහත්තයා? ඒ හැර, මම පණ්ඩිතයෙක් ය. මම තරුණයෙක් ය, පන්සලේ අධිපතියා වූ කල කරන්නේ මේවාය යනුවෙන් භික්ෂුවකට අනුචිත අදහස් මම වැලැඳගන්නෙ නෑ. මට නැම මොහොතක ම වාගේ සිතෙන්නෙ බුදුරජාණන් වහන්සේගේ යහපත් ශ්‍රාවකයින් වන සාරිපුත්ත මොග්ගල්ලාන මහා කාශ්‍යප වැනි ශ්‍රාවකයින් වහන්සේලා මා හා සසඳන කල මා සවිමත් නොකරම් නිවට හිස් භික්ෂුවක් ද කියායි. බෝධිසත්ව චරිතවල, සිද්ධාර්ථ චරිතයේ, බුද්ධ චරිතයේ, අතිශයෝක්ති ආරෝප බුද්ධියෙන් හඳුනාගෙන, එවා බැහැරකරගත්තාම අපිට බුදුරජාණන් වහන්සේ දකගත හැකි යි. එට පසු උන්වහන්සේ ගේ ශ්‍රී සද්ධර්මය අවබෝධකර ගැනීමටත් ඒ අනුව පැවතීමටත් පහසු යි"

"මේ ගමේ එක් පුද්ගලයෙක් මට කිවා ඔබ වහන්සේ අනාගාමී ඵලයට එළැඹ සිටිනවා කියා?"

WWW.SINHALAELIBRARY.COM 112

රාහුල තෙරණුවෝ මදහස පෑහ. "ඒ ඇත්තට මම අනුකම්පා කරනවා. ඒ ඇත්තො එහෙම කියන්නෙ මම තවමත් උඩින් නොගිය නිසා. ඒ ඇත්තන්ට බුදුහාමුදුරුවන්ගේ හාස්කම්. ඒ ඇත්තො මගෙන් ඒ හාස්කම් බලාපොරොත්තුවෙනවා. මට උඩින් යාමක් අවශ්‍ය නෑ, වතුරෙහි ඇවිදීමට කැමැත්තකුත් නෑ."

"ඉස්සරටත් වඩා සමාජය දැන් සංකීර්ණයි. ගිහි පැවිදි දෙපාර්ශ්වයම තරඟකාරී රැල්ලකට යටවෙලා. ඒ රැල්ලට හසු නොවී සිටීමට අපහසු යි. ආශාවන්ගෙ කෙළවරක් නෑ. ඒ ආශාවන් සපුරාස ගන්නාව. තරඟය ඇරඹෙන්නෙ එ තැන සිට. ආශාවන් සපුරාස ක්‍රෝධය වෛරය ඊර්ෂ්‍යාව ආයුධකරගෙන මිනිස්සු දුවනවා. විමුක්තිය කරා නොවෙයි විනාශය කරා. ඒක නේද ස්වාමීන් වහන්ස වර්තමාන ලෝක ස්වභාවය?"

"ඔව්. මනුෂ්‍යයාට ලොකු හොඳ අවබෝධයක් තියෙනවා. අද පමණක් නොවෙයි මනුෂ්‍යයා එදත් එහෙමයි. කෙලෙස් නැතිකිරීමේ පාලනයක් නැත්නම් මිනුවුන් සිය ආකාරයමයි."

"ඉතිං ස්වාමීන් වහන්ස, එවැනි ලෝකයක ජීවත්වන ඔබ වහන්සේ මේ තරඟකාරී රැල්ලට හසු නොවී සුදුවන්නේ කෙසේ ද?"

"සිත පාලනය කිරීමෙන්, සිත තේරුම් ගැනීමෙන්" රාහුල තෙරණුවෝ කී හ. "ඒ රැල්ලෙන් පමිනුණු විශාලයක් මා මිදී ඇත්තු යි මම හිතන්නේ නෑ. සාමාන්‍ය මිනුෂ්‍යයෙකුට වඩා උස් තැනෙක මා දෙපා ගසා සිටින බව ඇත්ත. එහෙත් ඒ රැල්ලේ උණුසුම මට දැනෙනවා."

සිය යන්නා මත හිඳගෙන ලොකු පැහැදිලිවත්, ලොකු සාධ්‍යාකාවන් සාක්ෂාත්කරන තෙරණුවන් ගේ ඡායාරූපයක්



ගැනීමට කැමිරා ශිල්පියාට බුද්ධිමානකර සිටුණත්, උන්වහන්සේ එයට විරුද්ධවෙති යි සිතා මෙතෙක් නිහඬ ව සිටියත්, තෙරණුවන් ගේ ලොකු ප්‍රසන්න ඉරියව් කිහිපයක් පසු වී යනු දුට ඔහු නොඉවසිල්ලෙන් තැතිපිටියේ ය.

"ඔබ වහන්සේට තිබි මග පෙන්වීමට ගුරුවරයකු සිටින්න ඇති කියා මම හිතනවා?"

"ඔව්"

"ඒ ගුරු හාමුදුරුවන්ගෙ නම මට කිය හැකි ද?"

"ගෞතම බුදුරජාණන් වහන්සේ" රාහුල තෙරණුවෝ නොපැකිළ කී හ. "මගේ ගුරුවරයා මගේ මග පෙන්වන්නා උන්වහන්සේ යි. මට අනුශාසනා කළ මා මහණ කළ මගේ ගුරු හාමුදුරුවෝ. මම මහණවුණු දවස මගේ අතට උන්වහන්සේ එකම එක පොතක් දුන්නා. ඒ ධම්මපදය. 'රාහුලට හාමුදුරු නමක් වෙන්න හිතූ නම් මිය පොත හොඳට කියවල තේරුම් අරගෙන පිළිපැද්දම ඇති' කියල උන්වහන්සේ මට කීවා. මම හිතන්නේ ධම්මපදය තමයි මගෙ ගමන් මග එළිපෙහෙළි කෙළේ කියල. මම ථෙරවාදී පොත්පත් පමණක් නොවෙයි, මහායාන ආචාර්යවරුන් ගේ පොත්පතුත් ඒ ආචාර්යවරුන්ගෙ සත් චරිතත් බුද්ධිමතාවෙන් කියෙව්වා. "නිර්වාණයේ ස්වභාවය කෙබඳු ද?" "කර්මය හා පුනරුත්පත්තිය අතර සම්බන්ධතාව කෙසේ ද?" "දිව්‍ය ලෝක අපාය ලෝක කොහි පවතින්නේද?" "කපස්‍ය කල්පයක යනු කවරක්ද?" "බුද්ධ රජාණන් වහන්සේට ප්‍රථම දහම පිළිගැන්වූ උපාසක තැන ගේ නම කුමක් ද? ඔහු පැමිණියේ කවර දේශයේ සිට ද?" මිය වාගේ ප්‍රශ්න ගැන මම වෙහෙසුණේ නෑ. හිත සහ වචනය හික්මවන්නේ කෙසේ ද යන්නයි මට වැදගත්වුණේ. එහෙත් මට තවමත් හිත සහ වචනය

නිසියාකාරව පාලනය කරගන්න බැරිවුණා. මේ තුන් දොර නිසියාකාරව පාලනය කරගත නුහුණු භික්ෂුවක් ගැන කුමක් කියන්න ද මහත්තයා?"

* * *

සෝමාරාම ස්ථවිරයන්ට ඉරිදා පත්‍රය කියවන්ට දෙපැයක කරම් කාලයක් ගතවෙයි. තමන්ට කලින් කිසිවකු පත්‍රය කියවනු දකින්න උන්වහන්සේ කැමති නැත. විශේෂව උඩින් පත්‍රය අතට ගන්නා ස්ථවිරයෝ එය කිහිළි ගන්නාගෙන බුලත් විටක් කටේ දමාගෙන හාන්සි පුටුවේ ඇලවෙති. පත්‍රකාරයා පිටු සකස් කර ඇති ආකාරයට ම එහි මුල සිට අග දක්වා කියවති. නොකියවන්නේත් නොබලන්නේත් වෙළෙඳ දැන්වීම් කෙටි කතා හා චිත්‍ර කතා පමණි. දේශපාලන ලිපි ඇත්නම් ඒවාත් පැණ බැණ කියවති.

පළමුවැනි හා දෙ වැනි පිටු බලන්නට පැය කාලක් පමණ ගතවී ය. තෙ වැනි පිටුවේ වෙළෙඳ දැන්වීම් දෙකක් හැරෙන්නට මුළු පිටුව පුරාම "බුද්ධ පුත්‍ර රාහුල තෙරුණුවෝ" නමින් විශේෂ ලිපියක් එහි පළ ව තිබිණි. භික්ෂුවකගේ විශාල ඡායාරූප දෙකක් ම එහි පළ වී තිබුණත් උන්වහන්සේ කැමරාවට මුහුණ දී නැත. එකක් පැත්තකට හැරී කාවකට පවිත්‍ර කතාබහක යෙදීසිටින දර්ශනයකි. අනෙක, ජනෙල් කවුළුවෙන් ඉවත බලා සිටින්නකි. ලිපිය ලියැවී ඇත්තේ නම් ජේෂ්ඨ සියා රාහුල ගැන බවත්, ඡායාරූප දෙකින් ම දක්වෙන්නේ උන්වහන්සේ බවත් ලිපිය කියවන්නට පටන්ගත නොබෝ වේලාවකින් තේරුම්ගත්



සෝමාරාම ස්ථවිරයෝ උපැස් යුවළ ගලවා අතටගෙන වටපිට බැලූ හ. උන්වහන්සේට මහත් සතුටක් ද උද්දාමයක් ද ඇති ව තිබිණි. රාහුල පසුවන්නේ දහම් පාසලේ බව කල්පනා වූ ස්ථවිරයෝ උපැස් යුවළ යළි පැළඳගෙන ලිපිය මුල සිට අගට කියවන්නට වූ හ. ලිපියේ දෙ තැනක ලේඛකයා මෙ සේ කියා තිබුණේ ය.

"බෞද්ධ භික්ෂූන් අතර, මග පසුවින් ශාස්ත්‍ර විශාරදයින් ධර්ම කථිකයින් විශේෂ ලේඛකයින් මම දැක ඇත්තෙමි. එහෙත් උන්වහන්සේලා ගේ භාෂිතය හා පැවතුම් අතර මහත් වෙනසක් වූ හෙයින් උන්වහන්සේ කෙරෙහි ආදරයක් මිස භක්තියක් මා තුළ පහළ නොවී ය. ථෙරවාදි කථාකාරී බුදු රජාණන් වහන්සේ ගත් මග ගනිමින්, උන්වහන්සේ ගේ ශ්‍රී සද්ධර්මය තමන්ගේ විමුක්තියක් පැවැත්මක් සඳහා උපයෝගී කොටගනිමින් කොට තායා ගත් යන් වචනයේ ගුණ සුවඳ තුළින් කරුණා රාහුල තෙරුණුවෝ ත්‍රිවිධ රත්නයේ ම ගුණ සුවඳ පතුරති."

"තමන් බුදු දහමේත් බුදු හිමියන්ගේත් උණුසුම පමණක් ලද, මාර්ගඵලාවබෝධයක් නොලද කෙලෙසුන් ප්‍රහීන නොකළ ලාමක භික්ෂුවකු යි උන්වහන්සේ අපට කීහ. එහෙත් බුදුදහම පරතෙරට දත්තෙමු යි කියන විශාරදයින් තුළ මේ වැනි පැහැදයක සුවඳයක උණුසුමක් මට නොදැනිණි. රාහුල තෙරුණුවන් තුළ මහත් බලාපොරොත්තු නැත. සිත කය වචනය හික්මවා නිරාමිෂ ප්‍රීතියක් ඇත්සිටිදින අතර ම, සෙසුවුන්ගේ සිත සුව පිණිස ද පැවතිම තමන් ගේ අභිප්‍රාය වී ඇතැ යි එතුමෝ කියති. බෞද්ධ භික්ෂුවකගෙන් ගිහියන් වන අප ප්‍රාර්ථනාකොට ම බලාපොරොත්තුවන්නේ එය ම බව මම රාහුල තෙරුණුවන් ඉදිරියේ ප්‍රකාශකර සිටියෙමි."

WWW.SINHALAELIBRARY.COM 114

සෝමාරාම ස්ථවිරයෝ ලිපිය සම්පූර්ණයෙන්ම කියවා බලා උද්දාමයට පත් සිත ඇතිව නැගිට්ටිය හ. උන්වහන්සේට වුවමනාවූයේ පත්‍රය වහාම රාහුල හෙරණුවන් අතට පත්කිරීමට ය. සිතු-ඇප්ප අපලක නොවී ය.

උපැස් යුවළ වමින් ද, පත්‍රය දකුණින් ද තබාගෙන බණ මඩුව දෙසට වඩිනා නායක ස්ථවිරයන් වහන්සේ, මහ මාවතේ සිට පන්සල් වත්තට කාරයක් හරවනවා දක නතරවූ හ. සුදු කමිසයක් හා සුදු සරමක් හැඳගත් පුද්ගලයෙක් කාරයෙන් බැස දරු දෙදෙනෙකු දෑතින් අල්ලාගෙන මිදුලට පැමිණෙයි. ඒ හේමපාල මහතා බව ස්ථවිරයෝ හඳුනාගත් හ.

සෝමාරාම ස්ථවිරයන්ගේ පරම දේශපාලන විරුද්ධවාදියා හේමපාල මහතා ය. මේ විරෝධය නිසා හේමපාල මහතා ගේ ගෙදරින් පන්සලට දානය නොඑළැඹෙයි.

හේමපාල මහතා නායක ස්ථවිරයින්ට දණ නවා වඳිනු දුටු නන්දරාම හෙරණුවෝ මඩුවට පැමිණි හ.

"මහත්තයා හුඟ කාලෙකට පස්සෙයි දක්කෙ" සමිත් වැඳ නමස්කාරය කොට නැගිටි හේමපාල මහතාට නායක ස්ථවිරයෝ කීහ.

"එහෙමයි. මං ආවෙ හාමුදුරුවනේ මගෙ දරුවො දෙන්නා රාහුල හාමුදුරුවන්ගෙ දහම් පාසැලට ඇතුලත් කරන්න. දරුවන්ට දහම් පමණක් දීල මදි, හොඳ හරිය පුතු අලුත්ම තේරුම් ගන්න, ගුණයහපත්කම් වගාකර ගන්න ආගමික අධ්‍යාපනයකුත් අවශ්‍ය ය කියල මට තේරුම් ගියා. රාහුල හාමුදුරුවො මගේ ගෙදරට ඇවිදින් කියා මේ කාරණය ගැන"

"රාහුල ගැන මේ පත්‍රයේ ලිපියකුත් ලියවිලා තියෙනවා"



"මමත් ඔය ලිපිය සම්පූර්ණයෙන් කියෙව්වා"

"මටත් කියෙව්වෙ දැනුයි. ඒ උන්නාන්සෙ ගැන ලිපිය දක්කෙ නෑ. දන්නෙත් නෑ. මං මේ නැගිට්ටලා ආවෙ රාහුලට පත්තරේ දීල යන්න. මං දන්නෙ කියල මහත්තයාම නොකීං දෙන්නකො පත්තරේ ඒ උන්නාන්සේට"

"ඔය ලිපිය ලීවේ මගෙ හොඳ යාළුවෙක් හාමුදුරුවනේ. එයා මගෙන් ඇහුවා රාහුල හාමුදුරුවො ගැන විස්තර. ඔය පත්තරේ ලියල තියෙන ගුරු පැවිද්ද ගැන සිද්ධිය මගෙන් අහලයි ලියාගත්තෙ. රාහුල හාමුදුරුවො ඒ ගැන වචනයක්වත් කියල තිබුණෙ නෑ"

හේමපාල මහතා පුදුම මිනිසෙකු යි සෝමාරාම ස්ථවිරයෝ සිතූ හ. රටේ උගත් වැදගත් හා ප්‍රසිද්ධ පුද්ගලයින් හැමදෙනාම තමා දන්නා හඳුනන බව හා ඔවුන්ට බලපෑම් කිරීමේ ශක්තියක් තමා සතු ව ඇතැයි ඔප්පුකර පෙන්වීමට ඔහුට හැකියාව ඇත්තේ ය.

* * *

හේමපාල මහතා ගේ දරු දෙදෙනා හිඳගත්තේත් හරහට බිම එළනාලද පැදුරුමත ය. ලොකු පිරිමි ළමයා රාහුල හෙරණුවන් ගේ පන්තියෙහ්, කුඩා ළමයා නන්දරාම හෙරණුවන් ගේ පන්තියෙහ්, හිඳගත් හ. ධනපතියකු ගේ අනුග්‍රහය ඇති ව මෙයින් ඇතුළත ළමයින්ට හිඳගැනීම සඳහා බංකු හෝ පුටු හෝ සපයා දෙමි යි හේමපාල මහතා සිතාගත්තේ ය.

හේමපාල මහතා පතු සිටුව පෙරලා දෝතින් ම පත්‍රය

WWW.SINHALAELIBRARY.COM 115

තෙරණුවන්ට පිරිනමා උන්වහන්සේ ගේ මුහුණින් පළවන හැඟීම් කවරාකාර දැයි සුපරීක්ෂාකාරී ව බලාසිටියේ ය. රාහුල තෙරණුවන් ගේ මුහුණින් පළවූයේ විමතියක් පමණි. උද්දාම වූ බවක් පළ නොවී ය.

"මේ ලේඛක මහත්තයාට මං කිව්වෙ මා ගැන ලියන්න එපා ය කියල මහත්තයා. ඒත් ලියලා. හේමපාල මහත්තයා ලිපිය කියවන්න ඇති නොවැ? මෙච්චර පිටු ගණනක් වැයකරල මා ගැන ලියන්න දෙයක් තියෙනවද?"

"තියෙනවා හාමුදුරුවනේ. මෙයා ලියලා තියෙන්නෙ බොහොම ටිකයි, ඔබ වහන්සේ ගැන පොතක් ලියන්න කරුණු තියෙනවා කියලා මම ඒ ලේඛක මහත්තයට කිව්වා"

රාහුල තෙරණුවෝ හේමපාල මහතා දෙස විමතියෙන් බලා සරබාගත් හ.

"ලිපිය කියෝල ලොකු හාමුදුරුවෝ ඉන්නෙ බොහොම සන්තෝෂයෙන්, බොහොම ආඩම්බරයෙන්. අපටත් ඔබ වහන්සේ ආඩම්බරයක්"

"මේ ලිපියට වඩා මම අද සතුටුවන්නෙ හේමපාල මහත්තයා ළමයින් දෙන්නා දහම් පාසැලට එව්ව ගැන යි. ඒක ගමේ අනික් දෙමව්පියන්ටත් ආදර්ශයක් වේවි"

හේමපාල මහතා බණ මිඩුලෙන් ඉවත් ව ආවාස ගේ දෙසට ගමන්කොට රාහුල තෙරණුවන් ගේ සිවුරු පඳුර දැක ඒ ඉදිරියේ නැවතුනේ ය. මේ සිවුරු පඳුර ගැනත් ලිපියේ සඳහන් ව තිබිණි. දුඹුරු සිවුරු මල් සුවඳ නිසා හේමපාල මහතා තව දුරටත් ප්‍රහර්ෂයට පත්වී ය. ඔහු මල් සිඹින්නක් මෙන් ඉම් බැලුවේ ය. ගෙදර ගෙනගොස් සිටුවා ගැනීමට ඔහුට සිවුරු පැළ



දුටුමනාවී ය. තමා දෙසට එවනා නායක ස්ථවිරයන් දුටු ගේ සම්පූර්ණ සිනාසුණේ ය.

"මම මේ සිවුරු පඳුර දිහා බැලුවා හාමුදුරුවනේ........ බොහොම කාලෙකට පස්සෙ සිවුරු පඳුරක් දැක්කෙ අදයි. අපේ නොවෙහා අපේ ගෙදර මිදුලෙ වවල තියෙන්නෙ ජපානෙ ඇන්තූරියම් ඕකිඩ් වර්ග. සිවුරු පඳුරට කොච්චර වයස ද හාමුදුරුවනේ?"

"මට අද වගෙ මතකයි මහත්තයා. අපේ රාහුල මහණ කළ දවසෙ අපවත් වෙච්ච ධර්මාරාම ලොකු හාමුදුරුවන් වහන්සෙ තමා මෙතන පුංචි සිවුරු පැළය හිටෙව්වෙ. හිටෝලා අපේ රාහුලට භාරකලා සාත්තු සාප්පායම් කරන්න. බොහොම සායාවෙන් බොහොම ගරුත්වයෙන් ඒ ඇත්තෙ මය සිවුරු පඳුර රැකබලාගත්තා. ලොකු හාමුදුරුවන් වහන්සේගේ සිවුරු පඳුර උන්වහන්සේ අපවත්වෙලා වැඩි කාලයක් යන්න මත්තෙන් මැරිලගියා. මට මතකයි ඒ කාලෙ මේ පන්සලේ පමණක් නොවෙයි, ගමේ හැම වැදගත් ගෙදරකමත් සිවුරු පඳුරු තිබුණා. සිවුරු මල් මිනිසුන්ගෙන් ඇහැවුණෙත් නැති, මිනිස්සු මිරිකුනාත් නැති. නැද්ද මහත්තයා? විකෙන් විකා දුනුයි අපිටත් මිටා මතක්වෙනෙන එන්නෙ"

"එහෙමයි" හේමපාල මහතා නායක ස්ථවිරයන්ගේ කතාව අනුමත කෙළේ ය.

"මටත් ආසාවක් උපන්නා හාමුදුරුවනේ මේ සිවුරු පඳුරෙන් පැළයක් ගෙදර වවාගන්න"

"බොහොම හොඳයි. මහත්තයාගෙ ගෙදර බොහොම ගරු හාමුදුරුවරු සිවුරු වැලක් වවාගෙන තියෙනවා දන්නාම අනික්

WWW.SINHALAELIBRARY.COM 116

උදව්යටත් ඕනෑවෙයි ඒ ඇත්තන්ගෙ නෙවිල්ලිලත් හැදෙව්වාගන්න. මේ වගෙ ගුණ සුවඳ තියෙන පැළැටි ගමේ රටේ ලෝකෙ පැතිරිලා යන්න ඕනෑ මහත්තයා. මහත්තයාට ඊක්ෂණයෙන් සිවිව පැළයක් දෙන්න බැරිවෙයි. ඉස්සෙල්ලාම වැල් පොටක් සාත්තරල පස්වලින් යටකරල බරක් තියන්න ඕනෑ. පොත්ත පොඩිවක් ඇරියොත් හොඳයි. මාස දෙක තුනක් යනකොට මුල් අල්ලනවා. පැළය මුලින් කපල පස් ටිකක් එක්ක වෙන් කරගෙන පොච්චියක හරි බිම පුදුසු තැනක හරි හිටවන්න එපායි තියෙන්නෙ. වල් පැළැටි ඉබේ පැළ වෙනවා. සාත්තුවක් ඕනෑකරන්නෙ නෑ. හොඳ පැළැටියක් වවා ගන්න සාත්තුකරලත් බොහොම අමාරුයි මහත්තයා"

"එහෙමයි"

"තව මාස දෙක තුනකින් ආයිත් එන්නවෙච්චි මහත්තයාට පැළේ අරංයන්න"

හේමපාල මහතා සිවිව පඳුර ළඟ පහත්වී ය. නායක ස්ථවිරයන්ගේ උපදෙස් පරිදි බිඳු කොටු කැබැල්ලක ආධාරයෙන් පස් බුරුල්කොට, පහතින් වූ වැලක් වෙන්කොට එහි පොළොවට යටවන කොටස තියපොත්තෙන් මඳක් සූරා පසම යටකරමින් කතාකෙළේ ය.

"දරු දෙන්නත් අරගෙන හැම ඉරිදාවක ම පන්සලට එන්නයි නායක හාමුදුරුවන්ගේ මගෙ අදහස. ඔබ එහෙන්මෙල්ලාගේ සහයෝගයෙන් මටත් ගමේ අනිත් උදවියටත් පුලුවන් වෙවි ගම්වත් පන්සලටත් බොහොම දේවල් කරන්න"

පුසිවාදීන් දෙදෙනා ලංවී පුහද සාකච්ඡාවක පසුවනු දුටු සිංසුප්පු මවිත ව බලාසිට ඔහු මුහුණින් සමීපයට පැමිණියේ ය.



"සිංසුප්පු ගඩොල් කෑටියක් සොයාගෙන ආවොත් ........"

විනාඩියක් ගතවීමට පෙර ගඩොල් කෑටියක් ගෙනවුත් සිවිව පැළය උඩින් තැබූ සිංසුප්පු දෑත් පිසදමමින් හැඟිසිට හේමපාල මහතා ගේ මුහුණ බලාගෙන කතාකෙළේ ය.

"පැළේ පැළවෙන්න නම් පොළොවට යටකළාට ම මදි මහත්තයා........ වතුර දාන්න වෙවී. මං හැමදාම වතුර දාන්නම්?"

සෝමාරාම ස්ථවිරයන්ගෙන් සිංසුප්පුට උත්තරය ලැබිණි.
"රාහුල හාමුදුරුවොම වතුර දාන්නෙ නැතැ යි සිංසුප්පු"

("අල්ලියමිල් ආරාමය" හා සම්බන්ධයි.)

www.sinhalaelibrary.com

WWW.SINHALAELIBRARY.COM 117



# පිච්චමල

## ජයසේන ජ[illegible]කොඩි

"මම බුදුරජාණන් වහන්සේගෙ [illegible] නිරතුරුවම මම ඒ [illegible]
සිතනවා. ඒ අනුව ක්‍රියා [illegible] කරනවා. අන් අය [illegible]
සිතනවා ද, ක්‍රියා කරනවාද [illegible] දන්නෙ නෑ. ඒ ගැන [illegible]
වෙහෙසෙන්නෙ කුමකට ද [illegible] ඒ ගැන. මං පණ්ඩිතයෙක් [illegible]
[illegible]
[illegible]
[illegible] නෑ. මට [illegible]
[illegible]
[illegible]
[illegible]
[illegible]
[illegible]
[illegible] ඒ අනුව [illegible]"

- රාහුල [illegible]

දයාවංශ ජයකොඩි සහ සමාගම

www.sinhalaelibrary.com